77 වන කාණ්ඩය
10 වන කලාපය

සෙනසුරාද
1968 මාර්තු 9

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශ [තී. 1541]

ඔඩිටර් ජෙනරල්ගේ වාර්තාව [තී. 1542]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1543]

කාරකසභා නියෝජ්‍ය සභාපති ඡන්දයෙන් තෝරා පත්කිරීම [තී. 1573]

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත [තී. 1574] :
පළමුවන වර කියවන ලදී.

නින්දගම් ඉඩම් පනත් කෙටුම්පත [තී. 1575] :
දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදී.

කල් තැබීම [තී. 1669]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 77
இல. 10

சனிக்கிழமை
9 மார்ச் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

மகாதேசாதிபதியின் செய்திகள் [ப. 1541]

கணக்காளர் நாயகத்தினது அறிக்கை [ப. 1542]

வினுக்களுக்கு வாய் மூல விடைகள் [ப. 1543]

குழுக்களின் உப அக்கிராசனர் தெரிவு [ப. 1573]

நிதி (திருத்த) மசோதா : [ப. 1574]
முதல் மதிப்பு இடம் பெற்றது

நிந்தகமக் காணிகள் மசோதா : [ப. 1575]
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை [ப. 1669]

---

Volume 77
No. 10

Saturday
9th March 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

MESSAGES FROM THE GOVERNOR-GENERAL [Col. 1541]
AUDITOR-GENERAL'S REPORT [Col. 1542]
ORAL ANSWERS TO QUESTIONS [Col. 1543]
ELECTION OF DEPUTY CHAIRMAN OF COMMITTEES [Col. 1573]

FINANCE (AMENDMENT) BILL [Col. 1574] :
Read the First time

NINDAGAMA LANDS BILL [Col. 1575] :
Second Reading—Debate adjourned

ADJOURNMENT MOTION [Col. 1669]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශ

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

**1968 මාර්තු 9 වන සෙනසුරාදා**

*சனிக்கிழமை, 9 மார்ச் 1968*

*Saturday, 9th March 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை, பி.ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at* 2 P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශ

### மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்திகள்

### MESSAGES FROM THE GOVERNOR-GENERAL

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I have received the following Messages from His Excellency the Governor-General :

I

"1968 පෙබරවාරි 28

මහත්මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පත්වලට මහ රැජිණින් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි:

'An Act to amend the Police Ordinance.'

'An Act to amend the Stamp Ordinance.'

'An Act to amend the Public Officers' (Security) Ordinance.'

'An Act to amend the Monetary Law Act.'

'An Act to amend the Penal Code.'

'An Act to amend the Trusts Ordinance.'

'An Act to make provision for the retrospective exemption of certain businesses from the levy and payment of the surcharge imposed by the Business Registration (Surcharge) Act, No. 16 of 1961, and for the refund of any amounts paid by way of such surcharge by such businesses.'

'An Act to provide for the establishment of the National Science Council of Ceylon and for matters connected therewith.'

මේ වගට,

ඔබගේ කීකරු සේවක,

ඩබ්ලිව්. ගොපල්ලව,

අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ
ගරු කථානායකතුමා."

II

"1968 මාර්තු 2

මහත්මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පත්වලට මහ රැජිණින් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි.

'An Act to amend the Animals Act, No. 29 of 1958.'

'An Act to amend the Buddhist Temporalities Ordinance.'

මේ වගට,

ඔබගේ කීකරු සේවක,

ඩබ්ලිව්. ගොපල්ලව,

අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ
ගරු කථානායකතුමා."

## ඔඩිටර්-ජනරාල්ගේ වාර්තාව

### கணக்காளர் நாயகத்தினது அறிக்கை

### AUDITOR-GENERAL'S REPORT

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I present the second instalment of the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, on the Accounts of the Government of Ceylon for the financial year 1966-67 (Part I).

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I move,

"That the second instalment of the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Order in Council, 1946 and 1947, on the Accounts of the Government of Ceylon for the financial year 1966-67 (Part I) be printed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.

அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

*Ordered that the Report be printed.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

*வினாக்களுக்கு வாய்மூல விடைகள்*

## ORAL ANSWERS TO QUESTIONS

### ගාල්ලේ නුගදූවේ ලංකා ඉංජිනේරු සංස්ථාවේ පෝර්මන් ඒ. යූ. ආර්. කාම්බෝජ් මහතා

*திரு. யூ. ஏ. ஆர். காம்போஜ், முகாமி, இலங்கைப் பொறியியல் கூட்டுத்தாபனம், காலி*

**MR. A. U. R. CAMBODGE, FOREMAN, CEYLON ENGINEERING CORPORATION, NUGADUWA, GALLE**

9. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගාල්ලේ නුගදූවේ සීමා සහිත ලංකා ඉංජිනේරු සංස්ථාවේ පෝර්මන් කෙනෙකු ලෙස ක්‍රියා කරන ඒ. යූ. ආර්. කාම්බෝජ් මහතා තාවකාලික පුරවැසි බලපත්‍රයක් ලැබූ බව එතුමා දන්නවාද? (ආ) ඔහුට එම බලපත්‍රය නිකුත් කරනු ලැබුයේ කවදාද? කවර හේතුන් නිසාද? (ඉ) ඔහුගේ තාවකාලික බලපත්‍රය 1951 සිට මේ දක්වා අලුත් කිරීමට ඇති වූ අවශ්‍යතාවය කුමක් දැයි එතුමා පැහැදිලි කරනවාද? (ඊ) කාම්බෝජ් මහතා ආදායම් බදු ගෙවන්නේද? (උ) නොඑසේ නම්, එයට හේතු කවරේද?

*பிரதம அமைச்சரையும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரையும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரையும் தகவல், ஒலிபரப்பு அமைச்சரையும் கேட்ட வினா: (அ) காலி/நுகதூவை வரையறுக்கப்பட்ட இலங்கை பொறியியல் கூட்டுத்தாபனத்தில் முகாமியாகச் சேவை செய்யும் திரு. ஏ. யு. ஆர். காம்போஜ் அவர்கள் தற்காலிக குடியுரிமை சான்றுச்சீட்டு பெற்றிருப்பதை அவர் அறிவாரா? (ஆ) அவருக்கு அச்சான்றுச் சீட்டு எப்பொழுது வழங்கப்பட்டது? என்ன காரணத்துக்காக வழங்கப்பட்டது: (இ) அவரின் தற்காலிக சான்றுச் சீட்டை 1951 இலிருந்து இதுவரை என்ன தேவைக்காகப் புதுப்பிக்க வேண்டியதாயிற்று என்பதை அவர் விளக்குவாரா? (ஈ) திரு. காம்போஜ் வருமானவரி செலுத்துகின்றாரா? (உ) அன்றேல், அதற்குரிய காரணம் என்ன?*

asked the Prime Minister and Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting: (*a*) Is he aware that Mr. A. U. R. Cambodge who works as a foreman at Ceylon Engineering Corporation Ltd., Nugaduwa, Galle, is a T. R. P. holder? (*b*) When was the T. R. P. issued to him and for what reason? (*c*) Will he explain why it was found necessary to renew his T. R. P. from 1951 up to now? (*d*) Does Mr. Cambodge pay income tax? (*e*) If not, why?

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

(*a*) Yes. (*b*) From 1951 as a student and from 1964 as the only non-Ceylonese employee of the Nugaduwa

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Ceylon Engineering Corporation Ltd. (*c*) As a student dependent on his father and, subsequently, as the only non-Ceylonese employee of the Nugaduwa Ceylon Engineering Corporation Ltd. (*d*) Not aware, (*e*) Does not arise.

## අගලවත්තේ ඉඩම් සංවර්ධන වැඩ පොළවල් : අනියම් කම්කරුවන්ගේ වේතන

*காணி அபிவிருத்தித் தொழில் நிலையங்கள் அகலவத்த : சமயோசித தொழிலாளரின் கூலி*

**LAND DEVELOPMENT UNITS, AGALAWATTA : WAGE OF CASUAL WORKERS**

10. **ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)

*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*

(Dr. Colvin R. de Silva—Agalawatta)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අගලවත්ත කොට්ඨාශයේ පිහිටි ඉහළහේවෙස්ස ගමේ තිබෙන ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වැඩ කරන ප්‍රධාන වැඩ පොළවල් දෙකින් එකක අනියම් කම්කරුවන් සඳහා ගෙවන වැටුප එක ස්ථානයක රු. 2.70 ක් වන අතර අනිත් ස්ථානයේ රු. 3.50 ක් වන බව දැනුම් දෙමින් එම පරතරය නැති කරන ලෙස අගලවත්ත ගම්සභාවේ 1967.11.27 වෙනි දින රැස්වීමේදී සම්මත වූ අංක 319 (3) දරණ යෝජනාව ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතුමාට අගලවත්ත ගම් සභාවේ සභාපති විසින් ඔහුගේ අංකය ඊ 4 සහ 1967.12.3 දින දරණ ලිපියෙන් ඉදිරිපත් කර තිබෙන බව එතුමා දන්නේද? (ආ) මේ පරතරයට හේතුන් මොනවාද? (ඉ) කෙසේ වුවත්, දෙපොලේම අනියම් කම්කරුවන් සඳහා ගෙවන වැටුප රු. 3.50 කිරීමෙන් මෙම පරතරය නැති කරනවාද? (ඊ) එසේ නම්, කවදා නියෝග කරනවාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) அகலவத்தைத் தேர்தல் தொகுதியிலுள்ள இஹலஹேவஸ்ஸ கிராமத்திலுள்ள காணி அபிவிருத்தித் திணைக்களத்தின் மூலம் வேலை செய்யும் பிரதான இரண்டு தொழில் நிலையங்களில் ஒன்றில் சமயோசித தொழிலாளர்களுக்குக் கொடுக்கும் சம்பளம் ஓர் இடத்தில் ரூ. 2.70 சதமாகவும் மற்ற இடத்தில் ரூ. 3.50 சதமாகவும் உள்ளது. இவ்வேறுபாட்டை நீக்குமாறு அகலவத்தைக் கிராமச்சபையின் 27.11.1967 அன்றைய கூட்டத்தில் நிறைவேறிய 319 (3) ஆம் இலக்கப் பிரேரணையைக் காணி அபிவிருத்தி அதிபருக்கு அகலவத்தை கிராமச் சபையின் தலைவர் அவருடைய ஈ 4 ஆம் இலக்க 3.12.1967 தேதிய கடிதத்தில் சமர்ப்பித்திருப்பதை அவர் அறிவாரா: (ஆ) இவ்வேறுபாட்டிற்குக் காரணமென்ன? (இ) எப்படியென்றாலும் இவ்விரு இடங்களிலும் சமயோசிதத் தொழிலாளர்களுக்கு ரூ. 3.50 சதம் ஆக்குவதன் மூலம் இவ்வேறுபாட்டை நீக்குவாரா? (ஈ) அவ்வாறெனில், எப்போது கட்டளையிடுவீர்கள்?*

asked the Minister of Land, Irrigation and Power : (*a*) Is he aware that the Chairman of the Agalawatte Village Committee has by letter (his ref. ඊ 4) of 3.12.67 forwarded to the Director of Land Development, motion No. 319 (3) passed by the Agalawatte Village Committee at its meeting of 27.11.67, which motion while informing him that, of the two principal units of the Land Development Department situated in the village of Ihalahewessa in the Agalawatta electorate one work site pays a wage of Rs. 2.70 to its casual workers whereas the other pays Rs. 3.50 to its casual workers, has urged that this disparity be removed? (*b*) What are the reasons for this disparity? (c) In any case, will he eliminate this disparity by ensuring that the wage paid to casual workers in both work sites is Rs. 3.50? (*d*) If so, when will he make the order accordingly?

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

(අ) මේ ලිපිය ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙත ලැබී නැත. (ආ) හත්තක සිට ඉහළහේවෙස්ස හරහා හබරකඩට තනාගෙන යනු ලබන පාරත්, පැළවත්තේ සිට මොරවකට තනාගෙන යනු ලබන පාරත්, යන දෙකම අගලවත්ත කොට්ඨාශයේ පිහිටා ඇති නමුත් මෙම වැඩ කරන ස්ථාන දෙකෙහිම කම්කරුවන් ලබා ගැනීමට ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

හැකියාව එක හා සමාන නොවීය. පළාතෙන් අනියම් කම්කරුවන් සෑහෙන සංඛ්‍යාවක් ලබාගැනීමට නොහැකිවූ නිසාත්, වැඩ ඉක්මණින් නිම කළ යුතු වූ නිසාත්, රු. 3.50ක දෛනික වැටුපක් මත පැලවත්ත-මොරවක පාරේ වැඩෙහි, අනියම් කම්කරුවන් යෙදවීමට ඉඩම් සංවර්ධන අධ්‍යක්‍ෂ තැනට සිදුවිය. විශේෂ වැටුප මත අනියම් කම්කරුවන් පණස් දෙනෙකු (50) බඳවා ගන්නා ලද්දේ 1967.5.15 දින සිට 1967.12.15 දක්වා හය මාසයක කාලසීමාවක් සඳහා පමණි. 1967.12.15 දින සිට එම විශේෂ වැටුප ගෙවීම නතර කරන ලදී. (ඉ) ඉහත (ආ) අනුව පැන නොනගී. (ඊ) ඉහත (ආ) සහ (ඉ) අනුව පැන නොනගී.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

මේ ප්‍රශ්නයට දුන්න පිළිතුරේ එක කොටසක් මට තේරුණේ නැහැ. දැන් ඒ පරතරය නැති කරලද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඔව්.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ඒ නැති කර තිබෙන්නෙ පඩි වැඩිය දුන්න තැන පඩි අඩු කරලද, එසේ නැත් නම් අඩුව දුන්න තැන වැඩි කරලද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ ගණන සාමාන්‍ය ගණනට බස්සල.

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)
*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*
(Dr. N. M. Perera—Yatiyantota)

බස්සල? ඒ කියන්නෙ අඩු කරල තියෙනවා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

මගේ ප්‍රශ්නයේ (ඉ) කොටසෙන් මම අහල තියෙන්නෙ "කෙසේ වුවත්, දෙපොලේම අනියම් කම්කරුවන් සඳහා ගෙවන වැටුප රු. 3.50 කිරීමෙන් මෙම පරතරය නැති කරනවාද?" කියායි. ඒ නිසා "ඒ ප්‍රශ්නය පැන නගින්නෙ නැහැ" කියා දුන්න පිළිතුර සාධාරණ වෙන්ට බැහැ. පරතරය නැති කළේ පඩි වැඩිය ගෙව්ව තැන අඩු කිරීමෙන් නම්—[බාධාකිරීමක්].

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දැන් පඩිය 3.50 නොවෙයි. 67.12.15 වැනි දින සිට අඩු කර තිබෙනවා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

එහෙත් 67.11.27 වැනි ද නම් ගෙව්වේ රු. 3.50 යි. මේ ප්‍රශ්නය ඇසූ නිසාම කැපුණාදැයි මා දැන ගන්ට කැමතියි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ ප්‍රශ්නයට මට දැන් උත්තර දෙන්ට බැහැ. [බාධාකිරීමක්]. මට කල් ඕනෑ.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

කරුණාකරල මේ ගැන සොයා බලා රුපියල් 3.50 ගෙවීම ස්ථාන දෙකටම පුරුදු කරනවා මිස වැඩිපුර ගෙවන ස්ථානයේ අඩු කිරීමෙන් මේ පරතරය නැති නොකරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)

පඩි අඩු කිරීම නීති විරෝධී බව ගරු ඇමතිතුමා දන්නවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please !

## මාතර බරවා රෝග රසායනාගාරය : අනුදක්මිකවරුන් බඳවා ගැනීම
## யானைக்கால்நோய் இரசாயனகூடம், மாத்தறை நுண்ணுய்வாளர் நியமனம்
## FILARIA LABORATORY, MATARA : RECRUITMENT OF MICROSCOPISTS

11. තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) බරවා රෝග මර්දන ව්‍යාපාරයේ මාතර රසායනාගාරය විවෘත කරනු ලැබුයේ කවදද ? (ආ) එම රසායනාගාරයට බරවා රෝග මර්දන සහායක අනුදක්මිකවරුන් කී දෙනෙක් බඳවා ගනු ලැබුවෝද ? ඔවුන්ගේ නම් සහ ලිපිනයන් මොනවාද ? (ඉ) මෙම සේවකයන් බඳවා ගැනීමේදී අනුගමනය කළ ප්‍රතිපත්තිය කුමක්දැයි එතුමා පැහැදිලි කරනවාද ? (ඊ) මෙම සේවකයන් බඳවා ගැනීමේදී මාතර රැකීරක්ෂා කාර්යාලයෙන් නොවිමසීමට හේතුව කුමක්ද ? (උ) ලංකාවේ වෙනත් ප්‍රදේශවල රසායනාගාර සඳහා සේවකයන් බඳවා ගැනීමේදී අනුගමනය කළ ප්‍රතිපත්තිය මාතර රසායනාගාරයට සේවකයන් බඳවා ගැනීමේදී වෙනස් කරන ලද්දේ මන්ද ?

சுகாதார அமைச்சரைக் கேட்ட வினு : (அ) யானைக்கால் நோயை ஒழிக்கும் இயக்கத்தின் மாத்தறை இரசாயனகூடம் எப்போது திறக்கப்பட்டது ? (ஆ) மேற்படி இரசாயன கூடத்திற்கு யானைக்கால்நோய் ஒழிப்பு உதவி நுண்ணுய்வாளர் எத்தனைபேர் சேர்க்கப்பட்டனர் ? அவர்களின் பெயர்களும் முகவரிகளும் யாவை ? (இ) இவ்வூழியர்களைச் சேர்க்கும் போது பின்பற்றப்பட்ட கொள்கையென்னவென்பதை அவர் விளக்குவாரா ? (ஈ) இவ்வூழியர்களைச் சேர்க்கும்போது மாத்தறைத் தொழில்வசதி அலுவலகத்தில் விசாரிக்காததற்குக் காரணமென்ன ? (உ) இலங்கையில் வேறு பகுதிகளில் இரசாயனகூடத்திற்கு ஊழியர்களைச் சேர்க்கும் போது பின்பற்றப்பட்ட கொள்கையை மாத்தறை இரசாயன கூடத்திற்கு ஊழியர்களைச் சேர்க்கும்போது மாற்றியதேன் ?

asked the Minister of Health : (a) When was the filaria laboratory in Matara, under the anti-filaria campaign, opened ? (b) How many assistant anti-filaria miscroscopists were recruited to this laboratory and what are their names and addresses ? (c) Will he explain what policy was followed in recruiting these employees ? (d) What is the reason for not making enquiries from the employment exchange in Matara, in recruiting these employees ? (e) Why was the policy followed in recruiting employees to the laboratories in other parts of the Island changed in respect of the Matara laboratory ?

විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)
(අ) 1967.12.2. (ආ) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් මෙසේ වෙයි : 1. කොළඹ මහ රෝහලේ උපස්ථායිකා එස්. ඒ. ජයවර්ධන, 2. කොළඹ මහ රෝහලේ කම්කරු ලිය ආර්. ඒ. බී. කුසුමාවතී, 3. රත්නපුර රජයේ රෝහලේ කම්කරු ලිය එල්. එස්. විජේසේකර, 4. කොළඹ මහ රෝහලේ කම්කරු ලිය ඒ. ගුණරත්මැණිකේ, 5. කොළඹ මහ රෝහලේ කම්කරු ලිය ඩබ්ලිව්. වියලව් වණිගසේකර.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
If it is a long list the hon. Parliamentary Secretary can table it.

විමලා කන්නන්ගර මිය.
(திருமதி விமலா கன்னங்கர)
(Mrs. Wimala Kannangara)
I am tabling it. *

(ඉ) මේ සේවිකාවන් බඳවා ගන්නා ලද්දේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පිළිපාටියේ අන්දමටයි. (ඊ) නියමිත

---

* සභාමේසය මත තබන ලද ලැයිස්තුව 1554 තීරුවේ පළවේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය]

සුදුසුකම් දරූ දෙපාර්තමේන්තු සේවිකාවන් අතුරෙන් 7 දෙනෙකු බඳවා ගන්නා ලද අතර, ඉතිරි අය මධ්‍යම රැකීරක්ෂා කාර්‍යාලයෙන් එවන ලද අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණයකට භාජන කර තෝරා ගනු ලැබූ අයගේ පොරොත්තු නාමාවලියෙන් බඳවා ගන්නා ලදී. බරවා මර්ධන සහායකයින් බඳවා ගැනීම කොළඹ පිහිටි ව්‍යාපාරයීය ප්‍රධාන කාර්යාලයෙන් කරනු ලැබේ. පළාත්බද රැකීරක්ෂා කාර්යාල මඟින් බඳවා ගනු ලබන්නේ කම්කරුවන් පමණි. (උ) පැන නො නඟී.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බරවා රෝග මර්ධන ව්‍යාපාරයේ කළුතර රසායනාගාරයට මෙබඳු සේවකයන් බඳවා ගැනීමේදී ප්‍රදේශයේ උදවිය බඳවා ගත් අතර මාතර බරවා රෝග මර්දන මධ්‍යස්ථානයට සේවකයන් බඳවා ගැනීමේදී ඒ ප්‍රතිපත්තිය අනුගමනය නොකරන ලද්දේ මන්ද ?

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

මෙම සේවකයන්ට මෛක්‍රස්කෝප් බැලීමේ කාර්යයට විද්‍යා දැනුමක් අවශ්‍ය නිසා බරවා රෝග මර්ධන සහායකයින් බඳවා ගන්න විට නියමිත සුදුසුකම් තිබෙන දෙපාර්තමේන්තුවේ අනියම් සේවකයින්ට ප්‍රමුඛත්වය දෙන අතර ඉතිරි උදවිය කොළඹ මධ්‍යම රැකීරක්ෂා කාර්යාලයෙන් එවන උදවියගෙන් තෝරා ගන්නවා. කම්කරුවන් බඳවා ගන්න විට ඒ ඒ ප්‍රදේශවල රැකීරක්ෂා කාර්යාලවලින් එවන උදවියගෙන් සුදුස්සන් බඳවා ගන්නවා. දැනට අනුගමනය කරන්නෙ ඒ ප්‍රතිපත්තියයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මාතර බරවා රෝග මධ්‍යස්ථානයට තෝරා ගනු ලැබූ සේවක සේවිකාවන් එකම ඡන්ද කොට්ඨාශයකින් පමණක් තෝරා ගත් අය යයි කියන්නෙ ඇත්තද ?

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

මම විස්තර දන්නෙ නැති නිසා ඒ ප්‍රශ්නයට පසුව පිළිතුරක් දෙන්නම්. [බාධාකිරීමක්]

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

විද්‍යාව පිළිබඳ දැනීම ඇති මාතර තරුණ තරුණියන් ඕනෑ පමණ සිටියදී කොට්ටාව ඡන්දදායක කොට්ඨාශයෙන් පමණක් මේ අය බඳවා ගත්තේ මන්ද ?

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

දී තිබෙන පිළිතුරට අනුව නම් ලැයිස්තුවක් ඉදිරිපත් වී තිබෙන නිසා—[බාධාකිරීම්] කරුණා කර නිශ්ශබ්ද වෙන්න, කතා කරන තුරු.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! Give the hon. Parliamentary Secretary a chance to reply.

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

මාතර ගරු මන්ත්‍රීතුමා විසින් වැරදි සහගත ප්‍රකාශයක් කර තිබෙන හෙයින් මා දැන් එම ලැයිස්තුව කියවන්නම්. එන කොට කොට්ටාවෙන් නොවන බව පෙනී යනවා ඇත.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

කරුණා කර පුද්ගලික ලිපිනයනුත් කියවන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

ඒ නම් මේවායි :

S. A. Jayawardane, Female Attendant,, General Hospital, Colombo.

R. A. D. Kusumawathie, Female Labourer, General Hospital, Colombo.

L. S. Wijesekera, Female Labourer, General Hospital, Ratnapura.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඔවා ආරෝග්‍යශාලාවල නම් නේද ?

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

ඒක තමයි මා කීවේ, සේවය කළ අය ගෙන් හත් දෙනෙක් බඳවා ගත් බව.

W. Violet Wanigasekera, Female Labourer, General Hospital, Colombo.

A. A. Kusumawathie Perera, Female Labourer, General Hospital, Colombo.

A. K. V. Sumanaseeli, Female Labourer, Castle Street Maternity Hospital, Colombo.

උත්තර දෙන විට මා කීවා, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දැනට සේවයෙහි යෙදී සිටින අයගෙන් හත් දෙනෙක් ගත් බව. ඒ අය මුළු ලංකාව පුරාම විසිරී ගිය අය ගෙන් වෙන්නට පුළුවනි. අනික් හය දෙනා ඉන් පිටස්තරව කම්කරු කාර්යාල යෙන් බඳවාගෙන තිබෙනවා.

K. Caroline Nona, Kennathuduwa, Haltota.

A. H. Asilin, Girikola, Agalawatte.

අගලවත්තෙනුත් ඉන්නවා. කරුණා කර අහගන්න.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

අතුරු මැතිවරණය කාලයේදීද ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Hon. Member for Agalawatta, please do not interrupt.

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

කෙසේ වෙතත්, එය අගලවත්තෙන්.

Y. D. Babun Nona, Miriswatte Road, Millewa, Horana.

D. S. I. Ratugama, Walpita, Meegoda.

W. H. Banduwatie, Madupitiya, Panadura.

[බාධා කිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member for Agalawatta should be a bit more gallant.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

She is very nice to me.

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

M. D. Caroline Nona, Maha Heenatiyangala, Kalutara.

කරුණු එසේ හෙයින්, මාතර ගරු මන්ත්‍රීතුමා කියා තිබෙන්නේ අසත්‍යයක්.

**සභාමේසය මත තබන ලද ලැයිස්තුව මෙසේයි :**

*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் வருமாறு :*

*The list tabled is as follows :*

(1) කොළඹ මහ රෝහලේ උපස්ථායිකා එස්. ඒ. ජයවර්ධන. (2) කොළඹ මහ රෝහලේ කම්කරු ලිය ආර්. ඒ. ඩී. කුසුමාවතී, (3) රත්නපුර රජයේ රෝහලේ කම්කරු ලිය එල්. එස්. විජේසේකර, (4) කොළඹ මහ රෝහලේ කම්කරු ලිය ඒ. ගුණරත් මැණිකේ, (5) කොළඹ මහ රෝහලේ කම්කරු ලිය ඩබ්ලිව්. වයලට් වණිගසේකර, (6) කොළඹ මහ රෝහලේ කම්කරු ලිය ඒ ඒ. කුසුමාවතී පෙරේරා, (7) කොළඹ කාසල් වීදියේ ගැහැණු රෝහලේ කම්කරු ලිය ඒ. කේ. වී. සුමණසීලි (8) හල්තොට, කෙන්නතුඩුවේ කේ. කැරොලයින් නෝනා, (9) අගලවත්ත, ගිරිකොල ඒ. එච්. ඇසිලින්. (10) හොරණ මිල්ලැවේ, මිරිස්වත්ත පාරේ වයි. ඩී. බබුන්නෝනා, (11) මීගොඩ, වල්පිට ඩී. එස්. අයි. රතුගම, (12) පානදුරේ, මාදුපිටියේ ඩබ්ලිව්. එච්. බන්දුවතී, (13) කළුතර මහ හීනටියන්ගල එම්. ඩී. කැරොලයින් නෝනා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

12 වන ප්‍රශ්නය ?

පී. සී. ඉඹුලාන මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. பீ. சீ. இம்புலான—விவசாய, உணவு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. P. C. Imbulana—Parliamentary Secretary to the Minister of Agriculture and Food)

එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා මාසයක් කල් වුවමනා කරනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## දෙද්දුව ජලාපවහන යෝජනා ක්‍රමයේ පොම්පය

தெத்துவ வடிகாலமைப்புத் திட்டம் : குழாய்

DEDDUWA DRAINAGE SCHEME PUMP

13. ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දෙද්දුව ජලාපවහන යෝජනා ක්‍රමයේ පොම්පය සවි කිරීමට හා එය ක්‍රියාකරවීම සඳහා අවශ්‍ය ඉදිකිරිල්ල තැනීමට ද මෙතෙක් වැය වී ඇති මුදල කොපමණද? (ආ) අගමැතිතුමා විසින් මෙම යෝජනා ක්‍රමය විවෘත කරනු ලැබූ දිනයේදී පවා පොම්පය ක්‍රියාකරවීමට නොහැකි වූ බව එතුමා දන්නවාද? (ඉ) 1968 ජනවාරි 15 වැනිදා මුළු ඉදිකිරිල්ලම කඩා දමා අංක ඩී.අයි.එම්.සී. 4 දරණ දොඹකරය යොදා පොම්පය ඉවත් කළ බව එතුමා දන්නවාද? (ඊ) මෙය ගැන එතුමා සොයා බලනවාද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) தெத்துவ வடிகாலமைப்புத் திட்டத்திலே நீர்வாங்கு குழாயை நிறுவுவதற்கும், நீர்வாங்கு குழாயை இயக்குவதற்குத் தேவையான அமைப்பிற்குமாக இதுகால வரை செலவாகியுள்ள பணத்தொகை எவ்வளவு? (ஆ) இத்திட்டத்தைப் பிரதம அமைச்சர் தொடக்கிவைத்த நாளிற்கூட நீர்வாங்கு குழாய் இயங்கத் தவறிவிட்டதை அவர் அறிவாரா? (இ) 1968 ஆம் ஆண்டு ஜனவரி 15 ஆம் நாளன்று முழு அமைப்பும் தகர்க்கப்பட்டு, டி. ஐ. எம். சி. 4 என்ற இலக்கமுடைய பாரந்தூக்கியால் அகற்றப்பட்டதை அவர் அறிவாரா? (ஈ) இதுபற்றி அவர் விசாரணை நடாத்துவாரா?

asked the Minister of Land, Irrigation and Power: (*a*) What is the amount of money incurred thus far on the installation of the pump and the necessary structure for the operation of the pump at the Dedduwa Drainage Scheme? (*b*) Is he aware that the pump failed to function even on the day the Prime Minister inaugurated the Scheme? (*c*) Is he aware that on the 15th January 1968, the whole structure was demolished and the pump removed by Crane No. D. I. M. C. 4? (*d*) Will he inquire into this?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

(අ) පොම්පය සවිකිරීමට සහ පොම්ප මධ්‍යස්ථානය ඉදිකිරීමට පොම්පයේ වටිනාකමත් ඇතුළුව රු. 55,260 ක මුදලක් වියදම් වී ඇත. (ආ) මෙම ව්‍යාපාරය ගරු අගමැතිතුමන් විසින් විවෘත කළ දිනයේ දී පොම්පය ක්‍රියා කළ මුත්, යම් කිසි ද්‍රව්‍යයක් පිටතින් පොම්පයට ඇතුල් වීමේ හේතුවෙන්, එය ක්‍රියා කරවීම ටික වේලාවකට පසු නැවැත් වීමට සිදුවී ඇත. මෙම දෝෂය හරිගස්වා පොම්පය නැවත සවිකරන ලදුව දැනට සතුටුදායක අන්දමින් එය ක්‍රියා කරයි. (ඉ) නැත. දොඹකරයක් මගින් පොම්පය පිටතට ගැනීමට සිදුවූ හෙයින්, පොම්ප මධ්‍යස්ථානයේ වහලයේ සුළු කොටසක්, එහි අනික් කොටස්වලට හානියක් නොවන සේ, ගැලවීමට සිදුවිය. පොම්පය නැවත සවි කිරීමෙන් පසුව, වහලයේ එම කොටස යථා තත්ත්වයට පමුණුවා ඇත. (ඊ) පැන නගින්නේ නැත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

වහලය කඩා අනික් කටයුතු කිරීම සඳහා කොයි තරම් මුදලක් වියදම් කර තිබේද කියා මා දැනගන්න කැමතියි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

වහලය කඩන්න කොයි තරම් වියදම් වුණාද කියා මා දන්නේ නැහැ. මෙය පොඩි කාමරයක්. අඩි 12 × 12 ක පමණ ප්‍රමාණයක පොඩි කාමරයක්. පොම්පය බොහොම විශාලයි. තත්පරයකට ඝන අඩි 25 ක් පමණ වතුර අදින විදුලි පොම්පයක්.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

මම ඇසූ ප්‍රශ්නයට පිළිතුරු ලැබුනේ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

මම දන්නේ නැහැ, වහලය ගළවන්න කොයි තරම් වියදමක් ගොස් තිබෙනවාද කියා.

## අඳ ගොළු තැනැත්තන්ට ගෙවීම්
## குருடர், ஊமையர்களுக்குக் கொடுப்பனவு
## PAYMENTS TO BLIND AND DUMB PERSONS

14. ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

සමාජ සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කටුනායක, කටුබැද්ද, එඬේරමුල්ල හා වෙනත් ස්ථානවල පදිංචි අඳ හා ගොළු තැනැත්තන් කිහිපදෙනෙකුම ඔවුන් නිෂ්පාදනය කරන භාණ්ඩ සඳහා වැඩි මිලක් ද ඔවුන්ගේ යැපීම පිණිස වැඩි මාසික දීමනාවක්ද ඉල්ලමින් කරුණු ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නවාද? (ආ) ඉදිරිපත් කළ එකී කරුණු ගැන ගත් පියවර මොනවාද? (ඉ) මෙකී අඳ හා ගොළු මිනිසුන්ගේ මෙම සාධාරණ දුක් ගැනවිලිවලට පිළියම් යෙදීමට එතුමා ඉක්මණින් ක්‍රියා කරනවාද?

சமூக சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) கட்டுநாயக்கவிலும், கட்டுபெத்தவிலும், எந்தரமுல்லையிலும், மற்றுமிடங்களிலும் வசிக்கும் குருடர்களும், ஊமையர்களுமான பலர் தாம் உற்பத்தி செய்யும் பொருட்களுக்கு உயர்ந்த விலை கொடுத்தெடுக்கும்படியும், மாதந் தோறும் வழங்கும் படியை அதிகரிக்கும்படி கேட்டும் விண்ணப்பித்தனரா? (ஆ) இவ் விண்ணப்பங்களையிட்டு எந் நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது? (இ) குருடர்கள் ஊமையர் களாகிய இவர்களுடைய இவ்வுண்மையான குறைபாடுகளை அகற்றுவதற்கு அவர் ஆவன செய்வாரா?

asked the Minister of Social Services: (a) Have representations been made by a number of blind and dumb people of Katunayake, Katubedde, Enderamulla and other places asking for increased payment for the goods they produce and for increased monthly allowances for their up-keep? (b) What action has been taken on these representations? (c) Will he take early steps to remedy these legitimate grievances of these blind and dumb people?

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)
(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

(අ) ඔව්. (ආ) සහ (ඇ). මේ කරුණු මගේ සැළකිල්ලට භාජන වී පවතී. ඒ සම්බන්ධව සුදුසු පියවර ගන්නවා ඇත.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

කොයි තරම් කල් ගත වේද කියන එකයි ප්‍රශ්නය.

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

කොයි තරම් කල් යාවිද කියා දැනගන්න පුළුවන් වේවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## උඩුගම්පොල කණිෂ්ඨ පාසලේ මුල් ගුරු මහත්මිය

தலைமையாசிரியை, உடுகம்பளை கனிஷ்ட பாடசாலை

HEADMISTRESS, UDUGAMPOLA JUNIOR SCHOOL

13. **ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1968. 1.4 වැනි දින සිට උඩුගම්පොල රජයේ පාසල් පහත සඳහන් අන්දමට ශ්‍රේණිගත කළ බව එතුමා දන්නවාද? (i) උඩුගම්පොල කණිෂ්ඨ බාලිකා පාසල—බාලිකාවන් සඳහා 1 වැනි ශ්‍රේණියේ සිට 7 වැනි ශ්‍රේණියේ දක්වා පංති—(පෙර තිබුණු ළදරු පාසල); (ii) උඩුගම්පොල කණිෂ්ඨ පිරිමි පාසල—1 වැනි ශ්‍රේණියේ සිට 7 වැනි ශ්‍රේණිය දක්වා පිරිමි ළමුන්ට පංති (පෙර තිබුණු ප්‍රාථමික ඉහළ පාසල); (iii) උඩුගම්පොල ජ්‍යෙෂ්ඨ පාසල—පිරිමි හා ගැහැණු ළමයින් සඳහා 8 වැනි ශ්‍රේණියේ සිට උසස් පාඨශාලා සහතික පංතිය දක්වා පංති. (ආ) 1 වැනි ශ්‍රේණියේ පාසලක්වන, අලුතින් ශ්‍රේණිය උසස් කළ කණිෂ්ඨ පාසලේ මුල් ගුරු මහත්මිය වශයෙන් 2 වැනි ශ්‍රේණියේ මුල් ගුරු මහත්මියක් වන තිලකරත්න මහත්මිය තවමත් කටයුතු කරගෙන යන බව එතුමා දන්නවාද? (ඉ) ශ්‍රේණිගත කළ පසුව මෙම කණිෂ්ඨ පාසලට 1 වැනි ශ්‍රේණියේ මුල් ගුරු මහත්මියක පත් කොට තිලකරත්න මහත්මිය සුදුසු වෙනත් පාසලකට මාරු කර යැවීමට 1967 අප්‍රේල් මස 5 වැනිදා මන්ත්‍රී මණ්ඩලයේදී එතුමා පොරොන්දු වූ බව එතුමා දන්නවාද? (ඊ) එසේ කිරීමට ඇති ප්‍රමාදයට හේතු කවරේද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) உடுகம்பளையில் உள்ள பின்வரும் அரசாங்கப் பள்ளிக்கூடங்கள் 4.1.1968 தொடக்கம்—(i) உடுகம்பளை கனிட்ட பெண்கள் பாடசாலை, தரம் 1 இல் இருந்து தரம் 7 வரை பெண்களுக்கான வகுப்புக்கள் (முன்னைய சிறுவர் பாடசாலை); (ii) உடுகம்பளை கனிட்ட ஆண்கள் பாடசாலை, தரம் 1 இல் இருந்து தரம் 7 வரை ஆண்களுக்கான வகுப்புக்கள் (முன்னைய தொடக்கப்பள்ளி-மேற்றரம்); (iii) உடுகம்பளை சிரேட்ட பாடசாலை, தரம் 8 இல் இருந்து உயர் பாடசாலைத் தகைமைச்சான்றிதழ் வகுப்புவரை ஆண், பெண் இருபாலாருக்குமான வகுப்புகள். எதை தரம் பிரிக்கப்பட்டன என்பதை அவர் அறிவாரா? (ஆ) முதலாந் தரப் பாடசாலையாகப் புதிதாகத் தரமுயர்த்தப்பட்டுள்ள கனிட்ட பாடசாலையின் தலைமை ஆசிரியையாக இரண்டாந்தரத் தலைமை ஆசிரியையான திருமதி திலகரத்தின தொடர்ந்து கடமையாற்றுவதை அவர் அறிவாரா? (இ) இந்தக்கனிட்ட பாடசாலை தரமுயர்த்தப்படும் பொழுது இதற்கு முதலாந்தரத் தலைமை ஆசிரியை ஒருவரை நியமிப்பதாகவும், திருமதி திலகரத்தினவை பிறிதொரு தகுதியான பாடசாலைக்கு மாற்றுவதாகவும் 1967 ஏப்ரில் 5 ஆந் தேதியன்று இச்சபையில் அவர் வாக்குறுதி அளித்ததை அறிவாரா? (ஈ) அங்ஙனம் செய்வதில் ஏற்படும் தாமதத்துக்குக் காரணம் என்ன?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that with effect from 4.1.1968 the following government schools at Udugampola were graded as: (i) Udugampola Junior Girls School—classes from Grade 1 to Grade 7 for girls. (formerly infants school); (ii) Udugampola Junior Boys School—chases from Grade 1 to Grade 7 for boys. (formerly Primary School Upper); (iii) Udugampola Senior School—classes from Grade 8 to H. S. C. for both sexes? (*b*) Is he aware that Mrs. Tillekeratne, a Grade 2 Headmistress continues to be the headmistress of the newly upgraded junior school which is a Grade I school? (c) Is he aware that he gave an undertaking on the Floor of the House on the 5th April 1967 to provide a Grade 1 headmistress to this junior school when the regrading took place and to transfer Mrs. Tillekeratne to another suitable school? (*d*) What is the reason for the delay to do so?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගාමණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(අ) ඔව්. (ආ) නැත. තිලකරත්න මහත්මිය එම පාසැලේ ජ්‍යෙෂ්ඨ උපගුරු වරියයි. (ඉ) ඔව්, දැනට 1 වන ශ්‍රේණියේ මුල්ගුරු මහත්මියක් පත් කර ඇත. (ඊ) පැන නොනගී.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

තිලකරත්න මහත්මිය දැනට එම පාසැලේ උගන්වන්නේ නැහැ නේද?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

උගන්වනවා; උගන්වන්නේ මුල්ගුරු වරිය හැටියට නොවෙයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

කවද සිටද එම වෙනස් වීම කර තිබෙන්නෙ? මේ ප්‍රශ්නය ඇසුවාට පසුව වෙන්න ඇති.

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

ඔව්, ඒ ගැන සොයා බලා කටයුතු කිරීමට අපි පොරොන්දු වුණා නේ. පෞද්ගලිකව ඒ ගැන සොයා බැලීමට මම පොරොන්දු වුණා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

හරි, හරි.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

පළමුවෙනි ප්‍රශ්නය.

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රචාරත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

ඒ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට කල් වුවමනා කරනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## මඩකලපුව-කොළඹ ගුවන් යානය නියමිත වේලාවට කලින් පිටත්වීම

மட்டக்களப்பு-கொழும்பு விமானம் குறிக்கப்பட்ட நேரத்துக்கு முன்னர் புறப்படல்

**DEPARTURE OF BATTICALOA-COLOMBO PLANE BEFORE SCHEDULE TIME**

2. **ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව—එස්. ඩී. බණ්ඩාරනායක මයා.—ගම්පහ—වෙනුවට)

*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபராதுவ—திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹா—சார்பாக)*

(Mr. Prins Gunasekera—Habaraduwa—on behalf of Mr. S. D. Bandaranayake—Gampaha)

ප්‍රවාහන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මඩකලපුවේ සිට කොළඹට පැමිණෙන ගුවන් යානය පිටත්වීමට නියමිත වේලාව පෙ. ව. 8.5 බව එතුමා දන්නවාද? (ආ) 1968.1.6 දින මෙම යානය පෙ. ව. 7.57ට පිටත් වූ බව එතුමා දන්නවාද? එසේ නම් ඒ මන්ද? (ඉ) මෙසේ කලින් පිටත්වීම නිසා, අංක 425562 දරන ප්‍රවේශ පත්‍රය හිමි මගියාට කොළඹට පැමිණීමට නොහැකිවූ බවත්, ඔහු අතරමංවූ බවත් එතුමා දන්නවාද? (ඊ) ගුවන් යානය මඩකලපුවේ සිට කොළඹ බලා පිටත්වන වේලාව පෙ. ව. 8.5 බව මෙම මගියාට දන්වා තිබුණු නමුත්, ඔහු ගුවන් තොටුපොළට පැමිණ සිටිය යුතු වේලාව ඔහුට දන්වා නොතිබුණු බවත්, මෙම කරුණු ප්‍රවේශ පත්‍රයෙන් තහවුරු වන බවත් එතුමා දන්නවාද? (උ) මේ ගැන එතුමා විමසා බලනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினு: (அ) மட்டக்களப்பிலிருந்து கொழும்புக்குப் போகும் விமானம் புறப்படுவதற்கெனக் குறிக்கப்பட்ட நேரம் மு. ப. 8.05 என்பதை அவர் அறிவாரா? (ஆ) 6.1.1968 அன்று மு. ப. 7.58 க்கு விமானம் புறப்பட்டதை அவர் அறிவாரா? அப்படிப் புறப்பட்டதாயின், ஏன்? (இ) இவ்வாறு நேரத்துக்கு முன் புறப்பட்ட காரணத்தால், 425562 இலக்கப் பிரயாணச் சீட்டை வைத்திருந்த பிரயாணி கொழும்புக்குச் செல்ல முடியவில்லை யென்றும் அதனுல் அந்தரித்தார் என்றும் அவர் அறிவாரா? (ஈ) மட்டக்களப்பிலிருந்து கொழும்புக்கு விமானம் புறப்படும் நேரம் மு. ப. 8.05 என்பது மாத்திரமே பிரயாணிக்கு அறிவிக்கப்பட்டிருந்ததென்பதையும், விமான நிலையத்திற்கு அவர் வரவேண்டிய நேரத்தைப் பற்றி எதுவும் அறிவிக்கப்படவில்லையென்பதையும், இவ்வுண்மைகள் பிரயாணச் சீட்டிலிருந்து நிரூபிக்கப்படலாம் என்பதையும் அவர் அறிவாரா? (உ) இதைப் பற்றி அவர் விசாரணை நடாத்துவாரா?

asked the Minister of Communications: (*a*) Is he aware that the scheduled time of departure of the plane from Batticaloa to Colombo is 8.5 A.M.? (*b*) Is he aware that on 6.1.68 the plane took off at 7.57 A.M. and if so, why? (c) Is he aware that as a result of this early departure the passenger who was in possession of ticket No. 425562 could not travel to Colombo, and was stranded? (*d*) Is he aware that the passenger was advised that the time of flight from Batticaloa to Colombo was 8.5 A.M. but was not advised about the time he was required to be present at the airport, and that these facts were borne out by the ticket? (*e*) Will he inquire into this?

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**

(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(*a*) Yes. (*b*) No. The officially recorded time of departure of the plane on this day was 8.03 A.M. (*c*) The passenger in possession of the ticket under reference could not travel to Colombo in consequence of his reporting too late at the airport. (*d*) I am aware that the ticket issued to the passenger indicated the time of departure as 8.05 A..M, but did not bear an endorsement with regard to reporting time. (*e*) Inquiries have already been made into this matter. It is revealed that the passenger arrived too late to be uplifted on the flight. The time of departure of 8.05 A.M. is the time of scheduled take-off. In order to make this possible, passengers should be boarded on the aircraft at least 10 minutes earlier to allow time for engine start-up and taxiing. The aircraft documents have to be completed even earlier. The holder of the ticket under reference was Mr. M. A. M. M. Mohideen of the staff of the House of Representatives, who has travelled earlier on Air Ceylon's services and should have been aware of the necessity to arrive well in advance of the scheduled time, although there was no written endorsement on his ticket of the reporting time at Batticaloa airport.

**මඩකලපුව-කොළඹ ගුවන් යානය නියමිත වේලාවට කලින් පිටත් වීම: අතරමං වූ මගියා**

மட்டக்களப்பு-கொழும்பு விமானம் குறிப்பிட்ட நேரத்துக்கு முன்னர் புறப்படல்: திக்கற்ற பிரயாணி

**DEPARTURE OF BATTICALOA-COLOMBO PLANE BEFORE SCHEDULED TIME: STRANDED PASSENGER**

3. ප්‍රින්ස් ගුණසේකර මයා. (එස්. ඩී. බණ්ඩාරනායක මයා. වෙනුවට)

(திரு. பிறின்ஸ் குணசேக்கர—திரு. எஸ். டீ. பண்டாரநாயக்க சார்பாக)

(Mr. Prins Gunasekera—on behalf of Mr. S. D. Bandaranaike)

ප්‍රවාහන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අංක 425562 දරන ප්‍රවේශ පත්‍රය ඇතිව සිටි මගියා, 1968. 1. 6 දින පෙ. ව. 7.54 ට, එනම්, ගුවන් යානය පිටත්වීමට නියමිත වේලාවට විනාඩි එකොළහකට කලින්, මඩකලපුවේ ගුවන් තොටුපොළේ සිටි බව එතුමා දන්නවාද? (ආ) මගියා සම්ප්‍රාප්ත වූ වේලාවත් යානය ඇත්ත වශයෙන්ම පිටත්වූ වේලාවත් අතර වූ විනාඩි තුන තුළ දී, (i) පිටත් වීමට පෙර කිසියම් නියමිත වේලාවකට තමා ගුවන් තොටුපොළට පැමිණිය යුතු බව තමාට දන්වා නොතිබුණ වග හා සැතපුම් හතක් එපිට සිට තමා කුලී මෝටර් රථයකින් පැමිණි බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

එම මගියා ගුවන් තොටුපොළ භාර නිලධාරියාට පැහැදිලි කළ බවත්, (ii) මගියා පැමිණ සිටින බව එකී නිලධාරියා යානය බිම තිබිය දීම නියමුවාට දන්වූ බවත්, එතුමා දන්නවාද? (ඉ) මගියා කිට්ටුව සිටියදී ගුවන් යානය පිටත්වූයේ මන්ද? (ඊ) මෙම නිලධාරීන්ට විරුද්ධව එතුමා ගන්ට යන ක්‍රියා මාර්ගය හා මෙම මගියාට එතුමා වන්දි ගෙවන්ට යන ආකාරය කවරේද?

*போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினு: (அ) 425562 இலக்கப் பிரயாணச்சீட்டை வைத்திருந்த பிரயாணி, 6.1.1968 அன்று விமானம் புறப்பட விருந்த நேரத்திற்குப் பதினெரு நிமிடங்களுக்கு முன்னுல், மு. ப. 7.54 க்கே மட்டக்களப்பு விமான நிலையத்திலிருந்தார் என்பதை அவர் அறிவாரா? (ஆ) பிரயாணி நிலையத்தையடைந்த நேரத்திற்கும் விமானம் புறப்பட்ட நேரத்திற்குமிடையேயிருந்த மூன்று நிமிடநேரத்தில் (i) விமானம் புறப்படுவதற்கு முன்னுல் குறிப்பிட்ட ஒரு நேரத்தில் விமான நிலையத்திற்கு வரும்படி தமக்கு அறிவிக்கப்படவில்லையென்றும் எழு மைல்களுக்கப்பாலுள்ள இடத்திலிருந்து வாடகைக் காரில் வந்திருப்பதாயும் பொறுப்புத்தியோகத்தரிடம் அவர் விளக்கியதையும் (ii) விமானம் தரையிலிருக்கும் பொழுது பிரயாணி வந்திருப்பதைப் பற்றி விமானியிடம் அவ்வுத்தியோகத்தர் அறிவித்ததையும் அவர் அறிவாரா? (இ) பிரயாணி அருகிலிருக்க விமானம் புறப்பட்டதேன்? (ஈ) இவ்வுத்தியோகத்தர் மீது என்ன நடவடிக்கை எடுக்க உத்தேசித்துள்ளார்? பிரயாணிக்கு எவ்விதத்தில் ஈடுசெய்ய உத்தேசித்துள்ளார்?*

asked the Minister of Communications: (*a*) Is he aware that the passenger with ticket No. 425562 was at the Batticaloa airport at 7.54 A.M., eleven minutes before the scheduled time of departure of the plane on 6.1.1968? (*b*) Is he aware that during the three minutes between the arrival of the passenger and the actual time the plane left (i) the passenger explained to the officer in charge that he was not advised to come to the airport at a particular time prior to departure, and that he had come to the airport from seven miles away by hiring car, and (ii) the officer communicated to the pilot about the presence of the passenger while the plane was aground? (*c*) Why did the plane take off while the passenger was close by? (*d*) What action does he propose to take against these officers, and in what way does he propose to compensate the passenger?

වාචික පිළිතුරු

ගරු හුරුල්ලේ
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)

(*a*) No. I am not aware of the time of arrival of the passenger at Batticaloa airport other than that he had arrived too late to be accepted for the flight as the aircraft was already taxiing out. In view of my answer to (*b*) of Question No. 2, which indicates a time discrepancy of 6 minutes, it would appear that the passenger actually arrived at the airport at 8 A.M., 5 minutes before scheduled time of departure. (*b*) (i) Althought the passenger explained to the officer that he was not advised to come to the airport at a particular time prior to departure, and that he had come to the airport from seven miles away by hiring car, it was too late to communicate to the aircraft which had already begun to taxi off. The holder of the ticket under reference was Mr. M. A. M. M. Mohideen of the staff of the House of Representatives, who has travelled earlier on Air Ceylon's services and should have been aware of the necessity to arrive well in advance of the scheduled time, although there was no written endorsement on his ticket of the reporting time at Batticaloa airport. (ii) The officer at the airport communicated with the Captain over the radio telephone with regard to the arrival of the passenger, but was informed that the aircraft was already air borne and could not return. (*c*) The Captain was not aware of the arrival of the passenger before take-off. (*d*) I have directed the management of Air Ceylon to take appropriate action if any officer has been found to be negligent. Although the passenger is not entitled to any compensation, I shall direct Air Ceylon to investigate the possibility of revalidating the ticket.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බී. ඒ. ඩී. සිසිලියා මිය.: අර්ථසාධක මුදල්**

திருமதி பி. ஏ. டீ. சிசிலியா, பொ. சே. சே. கொடுப்பனவு

**MRS. B. A. D. CECILIA : P. S. P. F. PAYMENTS**

4. ආචාර්ය එන්. එම්. පෙරේරා (එල්. සී. ද සිල්වා මයා.—බලපිටිය—වෙනුවට)

(*கலாநிதி என். எம். பெரேரா—திரு. எல். சீ. டி சில்வா—பலப்பிட்டிய—சார்பாக*)

(Dr. N. M. Perera—on behalf of Mr. L. C. de Silva—Balapitiya)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) දැනට විශ්‍රාම වැටුපක් ලබන රජයේ සේවිකාවක් වූ බී. ඒ. ඩී. සිසිලියා මහත්මිය 49.2.15 සිට 60.11.30 දක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායිකාවක්වූ බවත්; (ii) ඇගේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල අංක 60574 බවත්; (iii) 66.6.26, 66.7.6 සහ 66.9.17 යන දිනවල අවධානය යොමු කරමින් ඇ විසින් ලිපි යවා ඇති නමුදු, මෙතෙක් ඇගේ දායකමුදල් ඇට ආපසු ගෙවා නැති බවත් එතුමා දන්නවාද? (ආ) මෙම මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වීමට ඇති හේතු කවරේද? (ඉ) මෙම ගෙවීම කඩිනම් කිරීමට එතුමා ක්‍රියා කරනවාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) தற்பொழுது இளைப்பாறியிருக்கும் அரசாங்க ஊழியரான திருமதி பீ. ஏ. டி. சிசிலியா என்பவர் பொ. சே. சே. நிதிக்கு 15.2.49 இல் இருந்து 30.11.60 வரை கட்டணம் செலுத்தியவர் என்பதையும்; (ii) அவருடைய அரசாங்க சேவை சகாய நிதி இலக்கம் 60574 என்பதையும்; (iii) 26.6.66; 6.7.66; 17.9.66 ஆகிய திகளில் நினைவூட்டுதல்கள் அனுப்பியும் செலுத்திய கட்டணங்கள் அவருக்குக் கொடுக்கப்படவில்லை என்பதையும் அவர் அறிவாரா? (ஆ) திருப்பிச் செலுத்தத் தாமதிப்பதற்குக் காரணம் என்ன? (இ) கொடுப்பனவை விரைவுபடுத்த ஆவன செய்வாரா?*

asked the Minister of Finance: (*a*) Is he aware that (i) Mrs. B. A. D. Cecilia, now a pensionable government servant, was a contributor to the P. S. P. Fund from 15.2.49 to 30.11.60; (ii) her P. S. P. F. number is 6$574; and (iii) her contributions have still not been refunded to her in spite of reminders sent by her on 26.6.66, 6.7.66 and 17.9.66? (*b*) What is the reason for the delay in making this refund? (*c*) Will he see that the payment is expedited?

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(*திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி*)

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(*a*) (i) I am aware that Mrs. B. A. D. Cecilia contributed to the Public Service Provident Fund from 1.2.1950 to 30.11.1960, but I am not aware that this contributor has acquired pensionable status under Government. (ii) Yes. She has also contributed under number 14860. (iii) Yes, but the reminders referred to have not been received by the Secretary, Public Service Provident Fund. (*b*) Refund of contributions can be awarded only on receipt by the Fund of a refund application on Form P. S. P. F. 3 by the claimant and forwarded through the department in which she serves. No such application has been received in the P. S. P. F. Office and as such no refund is possible. The question of delay therefore does not arise. (*c*) Does not arise in view of reply to (*b*).

**ඒ. විජේපාල මහතාට ලිපිකරු සේවයේ පත්වීමක්**

திரு. ஏ. விஜேபால: எழுதுவினைஞராக நியமனம்

**MR. A. WIJEPALA : CLERICAL SERVICE APPOINTMENT**

5. එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ—ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට)

(*திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய—சார்பாக*)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1965 ජූලි මධ්‍ය ලිපිකාර විභාගයෙන්—එම් 8032 (භාණ්ඩාගාර අංක 1/3/8 (ජී) සමත් වූ ඒ. විජේපාල මහතාට තවමත් පත්වීමක් දී නැත්තේ මන්දැයි එතුමා සඳහන් කරනවාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: 1965 ஆம் ஆண்டு யூலையில் நடாத்தப்பட்ட மத்திய எழுதுவினைஞர் தேர்வில் எம் 8032 என்ற சுட்டிலக்கமும், 1/3/8 என்ற திறைசேரிக்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[ද සොයිසා සිරිවර්ධන මයා.]

தொடர்பெண்ணும் கொண்ட திரு. ஏ. விஜய பாலா தேர்ச்சியடைந்தபோதும் இதுகால வரை ஏன் நியமிக்கப்படவில்லையென அவர் தெரிவிப்பாரா ?

asked the Minister of Finance : Will he state why Mr. A. Wijepala who passed the Central Clerical Exam.—July 1965—M 8032 (Treasury No. 1/3/8 (ජී) ) has not yet been given a post ?

**විමලසේන මයා.**
(திரு. விமலசேன)
(Mr. Wimalasena)

1965 ජූලි මධ්‍ය ලිපිකාර විභාගයේ ප්‍රතිඵල අනුව, විභාග අංක එම්. 8032 දරන ඒ. විජේපාල මහතාට 1968.2.1 වැනි දින සිට ලිපිකරු පත්වීමක් පිරිනමා ඇත.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

6 වන ප්‍රශ්නය ?

**ඉඹුලාන මයා.**
(திரு. இம்புலான)
(Mr. Imbulana)

එයට පිළිතුරු දීම පිණිස මාසයක් කල් අවශ්‍යයි.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## අනුරාධපුර රෝහලේ රෝගීව සිටි ඒ. පී. ජයතිලක මිය.

திருமதி ஏ. பீ. ஜயதிலக : நோயாளி, அநுராதபுர ஆசுப்பத்திரி

MRS. A. P. JAYATILAKA, PATIENT, ANURADHAPURA HOSPITAL

7. **ද සොයිසා සිරිවර්ධන මයා.** (රාජා වෙලේගම මයා.—මොනරාගල—වෙනුවට)
(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ராஜா வெலேகம—மொனருகலை—சார்பாக)
(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Raja Welegama—Moneragala)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ඒ. පී. ජයතිලක මහත්මිය (ඇඳ සිට්ටු පත 29805) අනුරාධපුර ආරෝග්‍යශාලාවේ වාට්ටුවකට ඇතුළුකරන ලද බව එතුමා දන්නවාද ? (ආ) මෙම රෝගියා ආරෝග්‍යශාලාවට ඇතුළු කරන ලද්දේ කවදාද ? කවරකු විසින්ද ? ඇ කී දිනක් ආරෝග්‍යශාලාවේ නැවතී සිටියාද ? (ඉ) ඇට වැළඳී තුබූ රෝගය කුමක්ද ? ප්‍රතිකාර කළ වෛද්‍යවරයා කවුද ? (ඊ) ඇ ශල්‍යකර්මයකට හෝ ශල්‍යකර්ම කීපයකට භාජන කරන ලද්දේද ? ඒවායේ ප්‍රතිඵල මොනවාද ? (උ) මෙම රෝගියා ආරෝග්‍යශාලාවේ සිටියදී අනුරාධපුරයේ, පෞද්ගලික බෙහෙත් වෙළඳ හලකින් විශාල මුදලකට බෙහෙත් ද්‍රව්‍ය මිළදී ගත් බව එතුමා දන් වටිනාකම කොපමණද ? ඒවා මිළදී ගත්තේ කොතැනින්ද ? (එ) බෙහෙත් මිළ නවාද ? (ඌ) මිළදී ගත් බෙහෙත්වල මුළු දී ගත් බෙහෙත් හලෙහි අයිතිකරු කව්ද ?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா : (அ) கட்டில் தலைச் சீட்டு இல. 29805 ஐ உடைய திருமதி ஏ. பி. ஜயதிலக்க அனுராதபுர ஆசுப்பத்திரிச் சிகிச்சைக்களத்திலிருந்ததை அவர் அறிவாரா ? (ஆ) இந்நோயாளி எவரால் எப்பொழுது இவ்வாசுப்பத்திரியிலே சேர்க்கப்பட்டார் என்பதையும் இவர் அங்கு சிகிச்சை பெற்ற காலத்தையும் அவர் கூறுவாரா ? (இ) இவருக்கு இருந்த நோய் யாது என்பதையுஞ் சிகிச்சை செய்த வைத்தியர் யார் என்பதையும் அவர் கூறுவாரா ? (ஈ) சத்திர சிகிச்சை ஒன்றோ பலவோ செய்யப்பட்டதையும் அதனால் கண்ட பலாபலன்களையும் அவர் கூறுவாரா ? (உ) ஆசுப்பத்திரியில் இந்நோயாளி இருந்த காலத்திலே அனுராதபுரத்திலே தனியார் மருந்துக்கடை ஒன்றிலே பெருந்தொகைப் பணத்திற்கு மருந்து கொள்வனவு செய்யப்பட்டதை அவர் அறிவாரா ? (ஊ) இவ்வகையிலே கொள்வனவு செய்யப்பட்ட மருந்திற்கான மொத்த விலை என்ன என்பதையும் எங்கே கொள்வனவு செய்யப்பட்டது என்பதையும் அவர் கூறுவாரா ? (எ) மருந்து கொள்வனவு செய்யப்பட்ட மருந்துக்கடையின் உரிமையாளர் எவர் என அவர் கூறுவாரா ?

asked the Minister of Health : (*a*) Is he aware that Mrs. A. P. Jayatilaka, B.H.T. 29,805, was warded at the Anuradhapura General Hospital ? (*b*) When and who admitted this patient and for how long was she in hospital ? (*c*) What was the ailment

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

she had and who was the doctor who attended on her? (d) Was an operation or operations done on her and what were the results? (e) Is he aware that while this patient was in hospital, drugs were bought for a large sum of money from a private pharmacy at Anuradhapura? (f) What was the total cost of the drugs bought and from where were they bought? (g) Who is the owner of the pharmacy from which drugs were bought?

**විමලා කන්නන්ගර මිය.**

*(திருமதி விமலா கன்னங்கரா)*

**(Mrs. Wimala Kannangara)**

(අ) එසේය. (ආ) ලෙඩා බාරගන්නා ලද්දේ 1966.12.9 වැනිදාය. ඇඳ ඉහ පත සොයාගත නොහැකි හෙයින් සෙසු තොරතුරු සැපයිය නොහැකිය. (ඉ) මේ ලෙඩා, දැනට බදුල්ල රජයේ රෝහලේ නියුක්ත ආගන්තුක ප්‍රසව වෛද්‍ය සහ නාරි රෝග චිකිත්සක වෛද්‍ය ඒ. ජී. එස්. දසනායක මහතාගේ භාරයේ සිටියාය. ඇඳ ඉහ පත නොමැති හෙයින් රෝග-විනිශ්චය දැනගත නොහැකිය. (ඊ) මේ ලෙඩාගේ උදර බිත්තියේ කොටාර ඉවත් කිරීමෙන් වෛද්‍ය දසනායක මහතා විසින් 1967.2.19 වැනිදා ඇයට සැත්කමක් කළ බව මේ ආයතනයේ සැත්කම් ලේඛනයෙන් කියවෙයි. (උ) නැත. මේ ලෙඩා වෙනුවෙන් බෙහෙත් වර්ග ප්‍රදේශය තුළින් මිළයට ගත් බවට සටහනක් ප්‍රදේශයෙන් මිළයට ගන්නා බෙහෙත් ලේඛනයෙහි දක්නට නොලැබේ. (ඌ) පැන නොනඟී. (එ) පැන නොනඟී.

**නෙලිබැව විද්‍යාලයේ මුල්ගුරු එස්. කේ. නන්දසේන මහතා**

*திரு. எஸ். கே. நந்தசேன, தலைமையாசிரியர் நெலிபேவ பாடசாலை*

**MR. S. K. NANDASENA, HEADMASTER, NELIBEWA SCHOCL**

8. ද සොයිසා සිරිවර්ධන මයා. (ලක්ෂ්මන් ජයකොඩි මයා. වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. லக்ஷ்மன் ஜயக்கொடி சார்பாக)*

**(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Lakshman Jayakody)**

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1947 අගෝස්තු මස සිට ගොවිකම් ගුරුවරයකු වශයෙන් දෙපාර්තමේන්තුවට බැඳුනු කු/නෙලිබැව විද්‍යාලයේ මුල්ගුරු එස්. කේ. නන්දසේන මහතා 1949 අවසාන ගුරු විභාගයෙන් සමත්ව සථිර සේවයට බැඳුනු බව එතුමා දන්නවාද? (ආ) 1948 දී ගොවිකම් උප ගුරු සේවා කාලය ගුරු සේවා කාලයට එකතු කර ගන්නා බවට තීරණය කළ බැවින් එසේ කර තිබෙන වග දන්නවාද? (ඉ) නො එසේ නම්, ඒ මන්ද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினு: (அ) 1947 ஆகஸ்ட் மாதத்திலிருந்து கமத்தொழில் ஆசிரியராகத் திணைக்களத்தில் சேர்ந்த கு/நெலிபேவ வித்தியாலயத் தலைமை ஆசிரியர் திரு. எஸ். கே. நந்தசேன 1949 இல் கடைசி ஆசிரிய தேர்வில் தேர்ச்சியுற்று நிரந்தர சேவையில் சேர்ந்ததை அவர் அறிவாரா? (ஆ) 1964 இல் கமத்தொழில் உதவி ஆசிரியராகச் சேவை செய்த காலத்தையும் ஆசிரியசேவை காலத்துடன் சேர்ப்பதாக முடிவு செய்யப்பட்டிருப்பதனுல் அவ்வாறு செய்யப்பட்டதா என்று அவர் கூறுவாரா? (இ) அன்றேல், ஏன்?*

asked the Minister of Education and Cultural Affairs: (a) Is he aware that Mr. S. K. Nandasena, Head Master of කු/Nelibewa School, who joined the department as a Food Production Teacher in August 1947, passed the Teacher's Final Examination in 1949 and was thereafter given a permanent appointment in the department? (b) Since a decision was taken in 1964 to add the period of service as food production teacher to the period of service as a teacher, is he aware that these periods of service have been added together? (c) If not, why?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

**(Mr. Jayasuriya)**

(a) Yes. (b) Periods of service as Food Production Teacher will be counted for pension purposes if he was engaged as a full-time teacher doing 20 hours of work per week. (c) Action is being taken to obtain the necessary data as early as possible to finalise this matter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කාරක සභා නියෝජ්‍ය සභාපති ඡන්දයෙන් තෝරා පත් කිරීම

குழுக்களின் உப அக்கிராசனர் தெரிவு

## ELECTION OF DEPUTY CHAIRMAN OF COMMITTEES

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

We shall now proceed to the election of a Deputy Chairman of Committees.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I propose to the House for its Deputy Chairman of Committees the hon. Member for Ja-ela and move that Mr. G. J. Paris Perera be elected Deputy Chairman of Committees.

ගරු හුරුල්ලෙ
(கௌரவ ஹுருல்லெ)
(The Hon. Hurulle)

I have pleasure in seconding that Motion.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

මුතූර්හි දෙවන ගරු මන්ත්‍රී ඒ. එල්. අබ්දුල් මජීඩ් මහතා කාරක සභා නියෝජ්‍ය සභාපති වශයෙන් තෝරා පත් කර ගත යුතු යයි මම යෝජනා කරනවා.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I have pleasure in seconding that Motion.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Any other names ?—[*Pause*]. No other names being proposed we shall now proceed to hold a ballot.

කාරක සභා නියෝජ්‍ය සභාපති තේරීම

ඊට අනුකූලව ඡන්ද විමසීමක් පවත්වන්නට යෙදුණෙන් මතු පළවන ප්‍රතිඵල ඇති විය:

ජී. ජේ. පාරිස් පෙරේරා මහතා ඡන්ද 50

ඒ. එල්. අබ්දුල් මජීඩ් මහතා ඡන්ද 28

இதன்படி வாக்கெடுப்பு நடைபெற்றது. முடிவு பின்வருமாறு :—

திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா 50 வாக்குகள்

திரு. ஏ. எல். அப்துல் மஜீது 28 வாக்குகள்

*A ballot was accordingly taken which resulted as follows*:

Mr. G. J. Paris Perera 50 votes.

Mr. A. L. Abdul Majeed 28 votes.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I declare the hon. Member for Ja-ela (Mr. G. J. Paris Perera) elected Deputy Chairman of Committees. On behalf of hon. Members, I congratulate the hon. Member for Ja-ela.

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

## BILLS PRESENTED

### මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත

### FINANCE (AMENDMENT) BILL

"to amend the Finance Act, No. 65 of 1961."

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති වෙනුවට ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති ගරු සී. පී. ද සිල්වා විසිනි. 1968 මාර්තු 11 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர் கௌரவ சீ. பீ. டி சில்வா அவர்களால் நிதி அமைச்சர் சார்பாகச் சமர்ப்பிக்கப்பட்டது. 1968, மாச் 11, திங்கட் கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப் பட்டது.

*Presented by the Hon. C. P. de Silva, Minister of Land, Irrigation and Power, on behalf of the Minister of Finance; to be read a second time upon Monday, 11th March 1968, and to be printed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

சபை அமர்வு

## SITTINGS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මීළඟ රැස්වීම 1968 මාර්තු මස 11 වැනි සඳුදා පූ. භා. 10 ට පැවැත්විය යුතුය; එදින විසිර යැමේදී මන්ත්‍රී මණ්ඩලය 1968 මාර්තු මස 23 වැනි සෙනසුරාදා අ. භා. 2 වන තෙක් කල් තැබිය යුතුය."

නින්දගම් පනත පිළිබඳ විවාදය අද රාත්‍රි 8 ට නිම වේය කියා බලාපොරොත්තු වෙනවා. [*Interruption.*] We hope to conclude the Second Reading Debate on the Nindegama Lands Bill at 8 P.M. today.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## නින්දගම් ඉඩම් පනත් කෙටුම්පත

நிந்தகமக் காணிகள் மசோதா

## NINDAGAMA LANDS BILL

**කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝග කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [පෙබරවාරි 25.]**

**"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා]**

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

பெப்ருவரி 25 ஆம் தேதிய வினாவீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிக்கப்படுமாக "—[கௌரவ சீ. பீ. டி சில்வா]

வினா, மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question—[25th February].*

"That the Bill be now read a Second time".—[*The Hon. C. P. de Silva*].

*Question again proposed.*

අ. භා. 2.38

**ආර්. ජේ. ජී. ද මැල් මයා. (දෙවිනුවර)**
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)

ගරු කථානායකතුමනි, ඊයේ විවාදයේදී ඉදිරිපත් කර තිබෙන මේ නින්දගම් පනතේ ඇති අවුල් වියවුල් තත්ත්වය හා ආකුල ව්‍යාකුල තත්ත්වය ගරු සභාවට පෙන්වා දෙන්නට මා උත්සාහ දැරුවා. හදිසියේම වගේ ගරු ඉඩම් ඇමතිතුමා ඊයේ අලුත් සංශෝධනයක් මඟින් අර්ථ නිරූපනයක් ඉදිරිපත් කර තිබෙනවා.

**කථානායක තුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Amendments will be proposed at the Committee stage. For the information of hon. Members, at the commencement of the Debate yesterday, the Hon. Minister, after consulting the Legal Draftsman, mentioned the amendments.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

Thank you, Sir. Then we will have to assume, I suppose, that these amendments will be brought in at the Committee stage.

**කථානායක තුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You can go on the basis that those amendments will be brought in at the Committee stage.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

ඊයේ අපේ දැනගැනීම සඳහා ගරු ඉඩම් ඇමතිතුමා ඉදිරිපත් කළ සංශෝධනවලින් අංශ 3 ක අර්ථ නිරූපනය සාමාන්‍ය වශයෙන් පැහැදිළි කර තිබෙනවා. ඒ කියන්නේ මෙහි සඳහන් වන "දරන්නා" යන වචනයත්, "නින්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගම් ඉඩම්" කියන වචනයත්, "බදු කරු" යන වචනයත් මේ පනත යටතේ යෙදෙන්නේ මොන තේරුමටද කියා ඊයේ ඉදිරිපත් කළ සංශෝධන වලින් අපට පෙන්වා දෙන්නට ගරු ඉඩම් ඇමතිතුමා උත්සාහ දරා තිබෙනවා. එහෙත් ඊයේ ඉදිරිපත් කළ සංශෝධන වල තවත් විශාල අඩුපාඩුකම් තිබෙනවා. මේ "බණ්ඩාර" ඉඩම් කියන ඒවා මේ පනතට ඇතුළත් වන්නේ කොහොමද කියා අපට තවමත් තේරෙන්නේ නැහැ. විශේෂයෙන්ම ඒ කරුණ ගැන අපි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. මේ "බණ්ඩාර" ඉඩම් කියන ඒවායේ මුවාවෙන් නැත්නම් ඒ වෙස් මුහුණින් මේ පනතේ නියම අර්ථය කඩාකප්පල් කර අනාගතයේදී නැත්නම් මැතදී විශාල ජාවාරමක් ඇති වේය කියා අපේ ලොකු බයක්, සැකයක් තිබෙනවා. මේ "බණ්ඩාර" ඉඩම් විශාල ප්‍රමාණයක් සබර ගමුවේ තිබෙනවා. අපේ ආරංචියේ හැටි යට ඒ "බණ්ඩාර" ඉඩම්වලින් නිල කාරයින්, අඳේ ගොවීන්, පන්නා දමා නැත්නම් නෙරපා දමා අයුතු අන්දමට ඒ ඉඩම් විකුණාගෙන යනවා. මෙම පනත සර්ව සම්පූර්ණ කිරීම සඳහා බණ්ඩාර ඉඩම්වල පදිංචිකරුවන්ගේ හා ඒවා වගා කරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිද්දෙන් සුදුසු සංශෝධනයක් ඉදිරිපත් කරන ලෙස ගරු ඇමතිතුමා ගෙන් ඉතා ආදරයෙන් හා කරුණාවෙන් මා ඉල්ලා සිටිනවා. අන්න ඒ විධියේ සංශෝධනයක් ඉදිරිපත් කළහොත් මේ පනතෙන් නියම ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වේ යයි මා කල්පනා කරනවා.

ගරු කථානායකතුමනි, අර්ථ නිරූප ණවල මාරු වන පංගුකාරයා හා පරවේණි පංගුකාරයා ගැන සඳහන් වන නිසා මා ඒ සම්බන්ධයෙන් මීට වඩා කථා කරන් නට අදහස් කරන්නේ නැහැ. හැබැයි, මේ කාරණය හොඳින් හිතේ තබා ගන් නට ඕනෑ. මේ පනතට යටත් වෙනවා යයි හිතන ඉඩම් කැබෙලි විකුණාගෙන යෑමේ වැඩ පිළිවෙළක් දැනට ක්‍රියාත් මක වෙනවා. ඒ විධියේ ජාවාරමක් දැනට පවතින බවට ආරංචියක් අපට ලැබී තිබෙනවා. මේ පනතින් නියම ප්‍රති ඵල ගන්නට බලාපොරොත්තු වෙනවා නම්, මෙම පනත ක්‍රියාත්මක වන දවසේ සිට එවැනි විකුණුම් අහෝසි වන බව කියැවෙන වගන්තියක් මීට ඇතුළත් කරන්න.

ඒ වාගේම දැනට ඒ ඉඩම්වල වාසය කරන, ඒවා වගා කරන පුද්ගලයන් නෙරපා දමාගෙන යන බවටත් අපට ආරංචියක් තිබෙනවා. කුඹුරු පනත ඉදිරි පත් කළ අවස්ථාවේදී අඳ ගොවීන් දස දහස් ගණන් අස් කරන්නට යෙදුණා. ඉඩම් හිමියන් ඒ අඳ ගොවියන් ඉවත් කර දැම්මා. 1958 සිට කුඹුරුවලින් පන් නා දමන ලද අඳ ගොවියන්ට තමන්ගේ අඳ අයිතිය ලබා ගැනීම සඳහා තවමත් උසාවි ගාණේ රස්තියාදු වන්නට සිදු වී තිබෙනවා. හම්බන්තොට හා මාතර දිස් ත්‍රික්කවල මෙවැනි අඳ ගොවියන් විශාල ප්‍රමාණයක් සිටිනවා. එසේ හෙයින් නින්ද ගම් ඉඩම්වල, බණ්ඩාරගම් ඉඩම්වල පදිං චිව සිටින අවුරුදු දහයක්, විස්සක්, නැත්නම් ඊට වැඩි කාලයක් තිස්සේ පදිංචිව සිටින පුද්ගලයන් ඒවායින් නෙරපා දැමීම තහනම් කෙරෙන වගන් තියක් මෙම පනතට ඇතුළත් කිරීමත් අවශ්‍යයි. එසේ නැත්නම් ඒවායේ පදිං චි වී සිටින පුද්ගලයන්ට උසාවි ගාණේ රස්තියාදු වෙමින් නීතිඥයන්ට ගිනි ගාස්තු ගෙවන්නට සිදු වේවි.

කොටින්ම, බණ්ඩාර ඉඩම්ද මෙම පන තට ඇතුළත් කරන්න. පදිංචිකරුවන් නෙරපීම--eviction—සහ ඉඩම් විකිණීම සම්පූර්ණයෙන් තහනම් කරන්න. එවැනි කාරණා සඳහා වගන්ති ඇතුළත් නො කළහොත් මෙම පනතින් වැඩක් වන් නේ නැහැ. එසේ වුවහොත් මා කලින් දිනයේ කීවා වාගේ මේක නිකම් පුස් වෙඩිල්ලක් වෙනවා. ස්ටර්ලිං කොම්පැනි වලට, රූපී කොම්පැනිවලට තේ, රබර්, කොකෝවා වැවීම සඳහා බණ්ඩාර ඉඩම් දී තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් පැහැ දිලි වගන්තියක් ඇතුළත් නොකළහොත් මොකක්ද සිදු වන්නේ ? ස්ටර්ලිං කොම් පැනිවලට, රූපී කොම්පැනිවලට නිකම්ම මේ ඉඩම් ලැබේදැයි අපට විශාල භයක් තිබෙනවා. ඒ නිසා මෙම ප්‍රශ්නවලට අදාළ වන පරිදි, සෑහෙන ප්‍රතිඵල ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

ගත හැකි වන පරිදි, මෙම පනතට නිසි නියම සංශෝධන ඉදිරිපත් කරන මෙන් මා ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඊළඟට තවත් ප්‍රශ්නයක් තිබෙනවා. එනම් මායිම් පිළිබඳ ප්‍රශ්නයයි. මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය ඉඩම්වල මායිම් පිළිබඳ ප්‍රශ්නයයි. නින්දගම් පනත යටතේ මායිම් පිළිබඳ ප්‍රශ්නය ගැටළු ප්‍රශ්නයක් වී තිබෙනවා. එම නිසා නින්දගම් කොමිෂන් සභා වාර්තාවෙන් ඒ පිළිබඳව විශේෂ යෝජනා වගයක් ඉදිරිපත් කර තිබෙනවා. ඉඩම් මැනීමේ ප්‍රශ්නය ගැන, ඉඩම් සලකුණු කිරීමේ—ඩිමාකේෂන්—ප්‍රශ්නය ගැන වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති යෝජනා ගැන කල්පනා කර බලා මායිම් පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කිරීමට ගරු ඇමතිතුමා උනන්දුවීම වැදගත් බව මේ අවස්ථාවේ දී පෙන්නා දෙන්න කැමතියි.

මායිම් පිළිබඳ ප්‍රශ්නය කොටස් හතරකට වෙන් කරන්න පුළුවනි. මෙම පනතට ඇතුළත් වන නින්දගම්වල මායිම් මොනවාද, බණ්ඩාර ඉඩම්වල මායිම් මොනවාද, පෞද්ගලික ඉඩම්වල මායිම් මොනවාද, රජයේ කැලෑ ඉඩම්වල මායිම් මොනවාද කියා වෙන් කිරීම, ලකුණු කිරීම, ඉතාමත්ම වැදගත්. ගරු කථානායකතුමනි, මඩුවන්වල නින්දගම්වලට රජයේ කැලෑ ඉඩම් කොපමණ ප්‍රමාණයක් ඇතුළත්ව තිබෙනවාද, පෞද්ගලික ඉඩම් කොපමණ ප්‍රමාණයක් ඇතුළත්ව තිබෙනවාද බණ්ඩාර ඉඩම් කොපමණ ප්‍රමාණයක් ඇතුලත්ව තිබෙනවාද කියා කිසිවෙක් දන්නෙ නැහැ. මේ නිසා එය විශාල ප්‍රශ්නයක් බවට පත් වී තිබෙනවා. හෙට අනිද්දා මෙම ගරු සභාවෙදි පනත සම්මත කර ගත්තත්, මෙය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී, රජයේ කැලෑ ඉඩම් මොනවාද, බණ්ඩාර ඉඩම් කොපමණ ප්‍රමාණයක් මේවාට ඇතුළත්ද, පෞද්ගලික ඉඩම් කොපමණ ප්‍රමාණයක් ඇතුළත්ද කියා නොදන්න නිසා ගැටළු ප්‍රශ්න රාශියකටම මුහුණ දෙන්න සිදු වෙනවා. මේවා ඇන්මම නිරාකරණය කර ගත්තේ නැතිනම්—

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ලෑන්ඩ් සෙට්ල්මන්ට් ඕඩිනන්ස්—

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

මා පෙන්නා දෙන්න යන්නෙ හදිසියේම මෙබඳු පනත් ඉදිරිපත් කළ විට මුහුණ පාන්න වන තත්ත්වයයි. බලංගොඩ අතුරු මැතිවරණය එන විට—හොඳ මැගටන් සියයක විතර පරමාණු බෝම්බයක් හෙලන්නා වාගේ—හදිසියේම මෙබඳු පනත් ඉදිරිපත් කරන්න ඕනෑ වුණ නිසා අර මා කලින් පෙන්නා දුන් කාරණා ගැන අමතක වුණා. නමුත් ඒකත් පුස් වෙඩිල්ලක් බවට පත් වුණා. මේ ප්‍රශ්න සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීමට, අදහස් උදහස් දැනගැනීමට දක්ෂ නිලධාරි මහතුන් සිටිනවා. තමුන්නාන්සෙ දන්නවා ඇති ලැම්බට් සිල්වා මහතා ගැන. ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රශ්නය ගැන ඒ මහතා දරන විශිෂ්ඨ දැනුම වෙනත් කෙනෙකුට නැති තරම්. එබඳු අයගේ උපදෙස් ලබාගෙන කාලවේලා ගෙන නියම පිළිවෙළට ව්‍යවස්ථා සම්පාදනය කර ඉදිරිපත් කළා නම්, නීති සම්පාදනය කිරීමේ විද්‍යාවට අනුව සකස් කරන ලද නීති ඇතුළත් පනතක් ඉදිරිපත් කළා නම්, එතුමන්ලාගේ උපදෙස් අනුව කටයුතු කළා නම්, ඇමතිතුමා අද වැටී ඇති ප්‍රපාතයට නොවැටෙන බව පෙන්නා දෙන්න කැමතියි.

ගරු කථානායකතුමනි, අපේ ඉඩම් ඇමතිතුමා ගැන කල්පනා කරන විට මට මතක් වෙනවා ඊයෙ පෙරේදා මා දුටු ඉංග්‍රීසි චිත්‍රපටියක් ගැන. අපේ ඇමතිතුමා නිතරම චිත්‍රපටි බලන්න යනවාය කියා මා අසා තිබෙනවා. මා දුටු ඒ ඉංග්‍රීසි චිත්‍රපටිය නම් මයිකල් ඇන්ජලෝගෙ ජීවිත කථාව අඩංගු චිත්‍රපටියයි. එම චිත්‍රපටියෙ දෙවන ජුලියස් පාප් තුමාගෙ චරිතයත් රඟ දක්වනවා. එම චරිතය දකින විට මට මතක් වුණේ අපේ ඉඩම් ඇමතිතුමායි. මයිකල් ඇන්ජලෝ, සිස්ටයින් චැපල් වහලේ සිතුවම් අඳින විට එහි පැමිණෙන පාප්තුමා චිත්‍ර ඇඳ අවසන් වන්නෙ කවදා ඇයි නිතරම ප්‍රශ්න කරනවා. එතුමා කල් පතා කළේ නැහැ වහලේ අඳින එම චිත්‍ර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිම කිරීමට අවුරුදු ගණනාවක්, සමහර විට අවුරුදු දහයක් පහළොවක් ගත වන බව. එම නිසයි අර දෙවන ජූලියස් පාප් තුමා ගැන කල්පනා කරන විට අපේ ඇමතිතුමා සිහියට නැගෙන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
තුන්වන ජූලියස්.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
නීතියත් හොඳ චිත්‍රයක් වාගෙයි ; අවුරුදු සිය ගණනක් පවතින්න ඕනැ. නමුත් තමුන්නාන්සෙ ඉදිරිපත් කළ පනත ගැන විවාදය විනාඩි හතලිස් පහක්වත් ගෙන යන්නට පෙර අගලවත්ත මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) ඉදිරිපත් කළ තර්ක අනුව අර්ථ නිරූපන යෙහි සංශෝධනයක් කරන්න සිද්ධ වුණා. එම නිසයි මා කියන්නෙ හොඳ නීතියක් හොඳ චිත්‍රයක් වාගේ අවුරුදු සිය ගණනක් පවතින සේ සකස් විය යුතු බව. සේවා මුක්ති ආඥා පනත 1870 දී ඉදිරිපත් කළ එකක්. අවුරුදු 98 කට පස්සෙයි, දැන් ඒක අවලංගු වන්නේ. තමුන්නාන්සේ විසින් ඉදිරිපත් කර තිබෙන මේ පනත වගේ පනත් අවුරුද්දක් යන්නට පෙර 4 වතාවක් සංශෝධනය කරන්නට වෙයි. කුඹුරු පනත 4 වතාවක් සංශෝධනය වෙලා තියෙනවා. තමුන්නාන්සේගේ මේ පනත කුඹුරු පනතටත් වඩා ඉතාම ආකූල ව්‍යාකූල තත්ත්වයක් ඇති එකක්. එම නිසා මේ ප්‍රශ්න ගැන කල්පනා කර අප ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටින මේ සංශෝධන පනතට ඇතුළත් කරනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

මේ අවස්ථාවේදී තව එක ප්‍රශ්නයක් ගැන පමණක් කථා කරන්නට මා කැමතියි. මේ පනතේ තුන් වැනි වගන්තිය තිබෙනනේ මේ විධියටයි.

"යම් නින්දගම් ඉඩමක් දරන්නකු හෝ එහි සෑම බදුකරුවකුම එහි අයිතිකරු වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ."

මේ වගන්තිය ක්‍රියාත්මක කිරීමට—ඒ සේවාවන් අහෝසි කර අළුත් අයිතිය ලියාපදිංචි කිරීමට—නින්දගම් මණ්ඩලයක් පත් කිරීමට තමුන්නාන්සේ අදහස් කර තිබෙනවා. තමුන්නාන්සේ, තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ නොයෙක් සංස්ථාවලට මණ්ඩල පත් කර තිබෙනවා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ අනිකුත් සංස්ථාවලට පත් කර ඇති සමහර අධ්‍යක්ෂවරුන් වගේ අධ්‍යක්ෂවරුන් මේ මණ්ඩලයටත් පත් කළොත් මේ පනත කිසිසේත් නියම පිළිවෙළක් අනුව ක්‍රියාත්මක කරන්නට පුළුවන් වේය කියා මා සිතන්නෙ නැහැ. සීනි සංයුක්ත මණ්ඩලයට තමුන්නාන්සේ පත් කර තිබෙන අධ්‍යක්ෂවරුන් කව්ද කියා අප දන්නවා. මා ඒ අයගේ නම් සඳහන් කරන්නට කැමති නැහැ. සමහර තැන්වලට තමුන්නාන්සේ දක්ෂ මිනිසුන් පත් කර තිබෙනවා. වැවිලි සංස්ථාවේ සභාපති හැටියට තමුන්නාන්සේ ඉතාම දක්ෂ කෙනකු—ලෙස්ලි ගුණසේකර මහත්මයා—පත් කර තිබෙනවා. එහෙත් එතුමාට වැඩ කරන්නට බැහැ. එතුමාත් සමග ලෝක පාලුවන් රාශියක් පත් කර තිබෙනවා. එතුමා කොහොමද වැඩ කරන්නෙ ? තේ, රබර්, පොල් ගැන කිසි දෙයක් දන්නෙ නැති අය පත් කර තිබෙනවා. ඒ අය එතුමාට වැඩ කරන්නට දෙන්නෙත් නැහැ. හෙට අනිද්දා තමුන්නාන්සේ නින්දගම් ඉඩම් මණ්ඩලයට—

**ජෝර්ජ් රාජපක්ෂ මයා. (මුල්කිරිගල)**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முல்கிரிகல)*
(Mr. George Rajapaksa—Mulkirigala)
සීතා සෙනෙවිරත්න පත් කරයි.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවට වුණු දේ ගැන කල්පනා කරන විට ඒ විධියටත් හිතන්නට ඉඩ තිබෙනවා. කෙසේ වෙතත් තමුන්නාන්සේගේ මේ මණ්ඩලයට ඉතාමත් දක්ෂ ඉඩම් නිරවුල් නිලධාරි ලැම්බට් සිල්වා මහත්මයා පත් කරයි. සමහරවිට තමුන්නාන්සේ තව ලෝක පාලුවන් 13 දෙනකු පත් කරයි. නින්දගම් අයිතිකාරයාගේ ඥාති මිත්‍රයන් පත් කළාම, නින්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

ගම්වලට සම්බන්ධකම් තිබෙන අය පත් කළාම, [බාධා කිරීමක්] නින්ද නෝනලා පත් කළාම, එතුමා වගේ දක්ෂ නිලධාරි යකුට වුණත් වැඩ කරන්නට බැරි වෙනවා. ඒ මණ්ඩල ඇති කරන විට ඒ ප්‍රශ්න ගැන සාමාන්‍ය දැනීමක් ඇති, නියම අවබෝධයකින් යුතුව අවංක ලෙස වැඩ කරන පුද්ගලයන් ඒ මණ්ඩලවලට පත් කරන්නෙ නැත්නම් ඒ මණ්ඩලවලින් අපට කිසිම ප්‍රයෝජනයක් බලාපොරොත්තු වන්නට බැරි වෙනවා. මේ පනතේ තිබෙන අවුල් වියවුල් තත්ත්වය ගැන, අර්ථ නිරූපනයේ තිබෙන අඩුපාඩුකම් ගැන, වගන්තිවල තිබෙන අඩුපාඩුකම් ගැන තමුන්නාන්සේගේ කාරුණික අවධානය යොමු කර අවංක ලෙස ක්‍රියා කිරීමට නියම පනතක් ඉදිරිපත් කරනවා නම් සම්පූර්ණ සහයෝගය දෙන්නට අප ලෑස්තියි. සමාජවාදී අදහස් අනුව ඉඩම් අයිතිය පිළිබඳව ප්‍රතිසංස්කරණයක් වෙනවා නම් ඒ සඳහා සම්පූර්ණ සහයෝගය දෙන්නට අප ලෑස්තියි. දැන් තිබෙන අඩුපාඩු ගැන කල්පනා කරන විට මේ පනතෙන් නියම අවංක ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදේය කියා අපට බලාපොරොත්තු වෙන්නට බැහැ. ඒ නිසා අපේ අදහස් ගැනත් සලකා බලා නින්දගම් අහෝසි කර, නිල කාරයන්ට නියම තත්වයක් ලබා දෙන්නට අවංකව අදහස් කරනවා නම්, අප ඉදිරිපත් කළ අදහස් අනුව මේ පනත සංශෝධනය කරන ලෙස හෝ එසේ නැත්නම් මේ පනත් කෙටුම්පත සම්පූර්ණයෙන් ඉල්ලා අස් කරගෙන නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලෙස හෝ ඉතා කරුණා වෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 2.57

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
**(Mr. T. B. Tennekoon—Dambulla)**

කථානායකතුමනි, "කණා බල්ලන් ගහන්නා වාගේ" කියා ගම්බද කථාවක් තිබෙනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) විස්තර කළ පරිදි, ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම් පතක් එවැනි කණා බල්ලන් ගැසීමක් බව ඔප්පු කිරීම සඳහා වචන ස්වල්ප යක් කථා කිරීමටයි, මා නැගී සිටියේ. ඇස් පෙනෙන්නේ නැති මිනිහෙක් පොල්ලක් අරගෙන දිගට හරහට ගැහුවත්, එය වදින්නේ කාටද, කොහේද කියා ඒ මිනිහා දන්නේ නැහැ. අර ඇස් නො පෙනෙන මිනිහා කිසිවක් නොදැන එහාට මෙහාට පොල්ල වනන්නා වාගේ මේ රජයත් "නින්දගම්" කියන නාම මාත්‍රය පමණක් අසා, ඒ නින්දගම් පිළිබඳ ක්‍රියා පිළිවෙත සම්බන්ධයෙන් කිසිම අවබෝධයක් නැතිව, කිසිම අර්ථයක්, අදහසක් නැති පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙන බව කණගාටුවෙන් වුනත් මේ ගරු සභාවේ ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. මට පෙර කථා කළ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු මේ පනත් කෙටුම්පත මෙන්ම මේ රටේ ඉඩම් පිළිබඳවත් සවිස්තරව කරුණු දැක්වූවා. එම නිසා ඒ ඉඩම් පිළිබඳව තවදුරටත් සවිස්තරව කරුණු දැක්වීම අනවශ්‍ය බැවින්, එසේ කරන්නට මා කල්පනා කරන්නේ නැහැ.

එහෙත් මේ පනත් කෙටුම්පත කිසිම තේරුමක් නැති, වැදගැම්මකට නැති, මළ කුණක් ඇවිස්සීමක් වැනි දෙයක් බව ප්‍රකාශ කරන්න කැමතියි. "නින්දගම්" කියන්නේ මොනවාටද? අපි ඒ ගැන ටිකක් කල්පනා කර බලමු. වෙන කොයි රටවලත් මෙන්ම අපේ රටෙත් ඉඩම් තිබුණා; දැනටත් තිබෙනවා. පුරාණ කාලයේ නම් ඒ ඉඩම්වල අයිතිය පැවැතී තිබුණේ රජතුමාටයි. තෑගි වශයෙන්, රාජකාරි කටයුතු වෙනුවෙන්, පූජා කිරීම් හැටියට ආදී වශයෙන් රජවරු එම ඉඩම් නොයෙක් වර, නොයෙක් අන්දමින්, නොයෙක් අයට, නොයෙක් ස්ථානවලට පවරා තිබෙනවා. ලංකාවේ සම්පූර්ණ භූමිය දහස් වරකටත් වඩා බුද්ධ ශාසනයට පූජා කොට තිබෙන බව අපේ බෞද්ධ ඉතිහාසයෙන් පෙනෙනවා. ඒ ඒ රජවරුන්ගේ ශ්‍රද්ධාව අනුව ඒක එක තත්ත්වයෙන් එසේ පූජා කොට තිබෙනවා.

වර්තමානයේ මෙන් ඒ කාලයේ මිනින්දෝරුවන් සිටියේ නැහැ. එම නිසා ඒ කාලයේ පූජා කළ, තෑගි කළ ඉඩම් මැන තිබෙන්නේ මිනින්දෝරුවන් නොවෙයි. සමහර විට දවුල අරගෙන කන්දක් මුදුනේ සිට එය හඬවනවා. "ඒ හඬ ඇසෙන තෙක් මානයේ සියලුම ඉඩම් අසුවල් විහාරයට, අසුවල් දේවාලයට අයිතිය"

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

යනුවෙනුයි, සමහර අවස්ථාවල ඉඩම් බෙදා දී තිබෙන්නේ. එහෙමත් නැත්නම්, "අර කන්දෙන් මෙහා, මේ කන්දෙන් මෙගොඩ, අර ගඟෙන් මොගොඩ යන මේ සියල්ල අසුවල් විහාරයට, දේවාලයට, අසුවල් අධිපතියාට අයිතිය" යන පිළිවෙළට ඉඩම් බෙදා දුන් අන්දම අපේ ඉතිහාසයේ සඳහන් වී තිබෙනවා. නින්දගම්, විහාරගම්, දේවාලගම්, ගබඩාගම්, බණ්ඩාරගම් යනුවෙන් මේවායේ කොටස් කීපයක් තිබෙනවා. ගබඩාගම් හා බණ්ඩාරගම් යන දෙකම එකයි. ගබඩාගම් තිබුණේ විශේෂයෙන්ම රජ්ජුරුවන්ගේ ප්‍රයෝජනය සඳහායි. ඒවායේ ආදායම් සියල්ලම අයිති වුණේ රජතුමාටයි. බණ්ඩාරගම්වල අයිතිය පිළිබඳ තත්ත්වයත් ඒකමයි. මේ විධියේ පනත් හැදීමට තරම් නිශ්චය වශයෙන් වෙන් වුණු නින්දගම්වත් විහාරගම්වත් දේවාලගම්වත් ගබඩාගම් හෙවත් බණ්ඩාරගම්වත් අද නැති තමයි. සබරගමුව වැනි කැලෑ ප්‍රදේශයක, යම් යම් අයට අයිති නින්දගම් තිබෙනවාය යනුවෙන් ආරංචි තිබුණත් අද ඉඩම් පවතින්නේ පුරාණයේ නින්දගම් පැවැති තත්ත්වයට වඩා වෙනස් ක්‍රමයකිනුයි. පුරාණයේදී ඒවා පැවැති තත්ත්වය, අද ගරු ඉඩම් ඇමතිතුමා සතුව තබ්බෝවෙහි තිබෙන ඉඩම් දෙස බලා විස්තර කරන්නට පුළුවනි. අද තබ්බෝවේ ඒ ඉඩම්වල මිනිසුන් වැඩ කරනවා. ඒ වැඩ කෙරෙන්නේ, ඒවා වගා කෙරෙන්නේ, පුරාණයේ තිබුණු ධනපති රදළ ක්‍රමයේ හැටියටයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**
අදකාරයින් නැහැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
**(Mr. T. B. Tennakoon)**
අදකාරයින් නැතත් කුලීකාරයින් සිටිනවා. ගොවීන් කුලීකාරයින් වශයෙන් යෙදවීම තමයි ඉතාම නරක දේ. අදකාරයින් යෙදුවොත් ඔහු නිපදවන අස්වැන්නෙන් කොටසක් ඔහුටත් ලැබෙනවා. කොටසක් ඉඩම් හිමියාට ලැබෙනවා. එහෙත්, කුලීකරුවන් යෙදවීමේදී එහෙම කෙරෙන්නේ නැහැ. දැන් වෙනත් විධියකට හැඩ ගැසී තිබෙන්නේ ඉස්සර තිබුණු රදළ ක්‍රමයමයි; පරවේණි දාස ක්‍රමයමයි. මේ ක්‍රම දෙකේ වෙනසක් නැහැ.

එදා නින්දගම් වශයෙන් පැවති ඉඩම් හුඟ හරියක් අද අසුවී තිබෙන්නේ වතුකරයටයි. නින්දගම් හෝ වේවා, වෙනත් ගම් හෝ වේවා සාමාන්‍ය මිනිහාට අයිතිව තිබුණු, සාමාන්‍ය මිනිහා පදිංචි වී සිටි ඉඩම් තවත් කෙනකුගේ බලයකට යටත් වෙනවාට අප කොහෙත්ම කැමැති වන්නේ නැහැ. මා නම් නින්දගම් තබා නිකම් ගම්වත් නැති කෙනෙක්. ඒ නිසා මේ පනත් ගැන මට කැක්කුමක් අමාරුවක් නැහැ. නින්දගම් පනතින් හෝ වෙන මොන යම් පනතකින් හෝ, සාමාන්‍ය මිනිසුන් පදිංචිව සිටින සථාන ඒ උදවියටම අයිති කර දීමේ වැඩ පිළිවෙළක් ඇති වෙතොත් ඒ ගැන අප සන්තෝෂ වෙනවා. එහෙත්, ලංකාවේ අද තිබෙන තරම් විහාරගම් ගැන හෝ දේවාලගම් ගැන හෝ බණ්ඩාරගම් ගැන හෝ ගබඩාගම් ගැන හෝ නින්දගම් ගැන හෝ එවැනි පිළිවෙළක් හරියාකාරව ක්‍රියාත්මක වන හැටියක් මෙම පනතෙහි තිබෙන බවක් අපට නම් කොහෙත්ම පේන්නේ නැහැ. මෙය නිකම්ම "නින්දගම් පනත" යන නාම මාත්‍රයක් පමණයි.

මෙය ඉදිරිපත් කර තිබෙන්නේ වැඩි වශයෙන්ම යම් යම් අයට රක්ෂා සපයා දීම සඳහායයි මට ආරංචි වී තිබෙනවා. සභාපති, ලේකම් ඇතුළු මණ්ඩලයම දැන් තෝරා අවසානලු. ඒ අනුව මේ පනත තමන්ට උදව් පිණිස සිටින පන්තියේ උදවියට රක්ෂාවල් සැපයීමට ඉදිරිපත් කරන පනතක් විනා මේ නින්දගම් ඉඩම්වල සිටින මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිස පනවන පනතක් නොවන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. මේ පනත් කෙටුම්පත දෙස බලන විට ඒ කාරණය හුඟක් දුරට සත්‍ය බව අපට පෙනෙනවා.

විදේශීන් මේ රටට පැමිණෙන්නට කලින් ඉඩම් මාර්ගයෙන් මේ රට ආණ්ඩු කරගෙන ගියා. අඩයම් යුගයේදී නම් මිනිසුන් ඉඩම් ගැන එතරම් සැලකිල්ලක් දක්වූයේ නැහැ. ඒ යුගයේදී මිනිසුන් ඉඩම් වෙන් කරගෙන සිටියේ නැහැ. ලංකාවේ පමණක් නොවෙයි, ලෝකයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. බී. තෙන්නකෝන් මයා.]

කුමන රටකවත් දඩයම් යුගයේදී මිනිසුන් ඉඩම් ගැන එතරම් සැලකිල්ලක්, ඕනෑකමක් දක්වූවාය කියා අපට සිතන්නට බැහැ. මිනිසුන් ඉඩම් වෙන් කරගෙන, ගෙවල් දොරවල් සාදා ගෙන වැවීමෙන් හෝ වෙනත් ක්‍රමවලින් හෝ ඉඩම්වලින් ප්‍රයෝජන ගන්නට පටන් ගත්තේ ගොවී යුගයේදීයි. අපේ රට දියුණුව තිබුණේ ඒ දීප්තිමත් ගොවි යුගයේදීයි. නමුත් මේ නින්දගම් ක්‍රමය, ප්‍රවේණි දාස ක්‍රමය ආදිය ඇති වුණේ මෑත කාලයේදීයි. අපේ ඉතිහාසය අනුව විශේෂයෙන්ම මහනුවර යුගයේදී මේ නින්දගම්, ගබඩාගම්, බංඩාරගම්, විහාර දේවාලගම් ආදිය ඇති වී ඒ අනුව රට පාලනය වන පිළිවෙළක් ඇති වූ බව පෙනෙනවා.

නින්දගම් වුණත්, බංඩාරගම් වුණත් නවා. දඹුල්ල විහාරයටයි ඒවා අයිති. මේ ඉඩම්වල පදිංචි වී මේවා භුක්ති විඳින, මේවායේ රාජකාරිය කරන උදවියට මේ ඉඩම් පවරා දෙන්නට අවසථාවක් ලැබෙනවා නම් අප ඉතාමත් සතුටු වෙනවා. විහාර දේවාලගම්, නින්දගම්, බංඩාරගම් වශයෙන් ඉතාමත් සාරවත් වටිනා ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙන බව මා මතක් කරනවා. මේ සමහර ඉඩම්වලින් අද කිසිම විධියකින්වත් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. සමහර විට මේ ඉඩම්වල පදිංචිකාරයින්ට හෝ මේ ඉඩම් අයිති උදවියට හෝ කිසිම ප්‍රයෝජනයක් නොලැබෙන අතර මැද සිටින වෙනත් තැරැව්කරුවන් කොටසක් මේ ඉඩම්වල ප්‍රයෝජනය භුක්ති විඳිනවා. අපේ අවසාන රාජධානිය වන මහනුවර නගරයේ සියලුම ඉඩම් දළදා මාළිගාවටත්, නාථ, පත්තිනි, මහා විෂ්ණු හා කතරගම යන සතර දේවාලයටත් අයිති බව අප දන්නවා. ඔය විශාල ගොඩනැගිලි තිබෙන ස්ථාන ඇතුළු මහනුවර නගරයේ ඉඩම් සියල්ලම වාගේ දළදා මාළිගාවට හෝ සතර දේවාලයට අයිතියි. දළදා මාළිගාවට හෝ සතර දේවාලයට අයිති නොවන ඉඩමක් මහනුවර නගරයේ තිබෙනවාය කියා මා සිතන්නේ නැහැ. නමුත් අද ඒ ඉඩම්වල වටිනාකම රුපියල් ලක්ෂ ගණනක් වුවත් ඒවා අයිති දළදා මාළිගාවට හෝ සතර දේවාලයට හෝ ඒ වටිනාකම අනුව ප්‍රයෝජනයක් අත්වන්නේ නැහැ. අද ඔය කාර්ගිල්ස් සාප්පුව ඇතුලු වෙනත් ගොඩනැගිලි හා කඩ සාප්පු තිබෙන ඉඩම්වල වටිනාකම අනුව ප්‍රයෝජනයක් අත්වන්නේ නැහැ. මේ ගොඩනැගිලි සාදන්නට මත්තෙන්, මුඩු ඉඩම් වශයෙන් මේවා වෙනුවෙන් පුරාණයේදී දළදා මාළිගාවට හෝ සතර දේවාලයට හෝ දුන්නේ තෙල් බෝතලයක් නම් කඩ සාප්පු හා ගොඩනැගිලි තිබුණත් අදත් මේ ඉඩම් වෙනුවෙන් දළදා මාළිගාවට හෝ සතර දේවාලයට ලැබෙන්නේ තෙල් බෝතලයක් පමණයි. කොයි තරම් විශාල ඉඩමක් සඳහා වුවත් කළ යුතුව තිබෙන්නේ පන්දමක් පත්තු කිරීම හෝ තැම්මැට්ටමක් ගැසීම නම් ඒ වෙනුවට සිලිම් තුනක් දීලා බේරෙන්නට පුළුවනි. පදිංචිකරුවකු හෝ බදුකාරයකු හෝ පරවේණිම අයිතිකාරයකු හෝ සිටියත් ඉඩමේ නියම ප්‍රයෝජනය ගන්නේ මැද ඉන්න කෙනෙක්. නියම ප්‍රයෝජනය දේවාලයට හෝ දළදා මාළිගාවට හෝ ලැබෙන්නේ නැහැ. ඒ බව අප හොඳාකාරව දන්නවා. මහනුවර නගරයේ පවතින තත්ත්වය එයයි.

දඹුල්ලේත් බොහොමයක් ඉඩම් තිබෙනවා. දඹුල්ල විහාරයටයි ඒවා අයිති. එහි මිනිසුන් පදිංචි වී සිටිනවා. ඒ අයටත් මෙයින් ප්‍රයෝජනයක් නැහැ. දඹුල්ලේ මහා විහාරයේ නායක හාමුදුරුවන් වහන්සේගෙන් මේ ගැන ඇහුවාම, උන් වහන්සේ කිව්වේත් උන්වහන්සේට මෙයින් ප්‍රයෝජනයක් නැති බවයි. යම් ප්‍රයෝජනයක් එනවා නම් එන්නේ භාරකාර හාමුදුරුවන්ට තමයි. ඉඩම් විකිණීම නැත්නම් බදු දීම කෙරෙනවා. සිලිම් පහක් බැගින් ලැබුණායයි සටහන් කළත්, අක්කරයකට සමහර විට රුපියල් පණහක් බැගින් ගන්නවා. විහාර, දේවාල සතු ඉඩම් සම්බන්ධයෙන් නොයෙක් දූෂණ ඇති වන බව අප දන්නවා. ඒ වාගේම, ඒවායේ වැඩ කරන අයටත්, ඒවායේ පදිංචි වී සිටින අයටත් නොයෙක් විධියේ හිරිහැර කරදර ආදිය කරන බවත් අප දන්නවා. ඒ නිසා එවැනි තත්ත්වයකින් මිනිසුන් මුදාලීමට සමත්, සාධාරණ ක්‍රියා පිළිවෙළක් සහිත පනතක් ඉදිරිපත් කරතොත්—එවැනි බලයක් තිබෙන පනතක් ඉදිරිපත් කරතොත්—එයින් ප්‍රයෝජනයක් ලබා ගන්නට පුළුවනි. කවදා හෝ එවැනි පනතක් ඉදිරිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළ යුතුයි. නින්දගම් පනත නමින් ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන මේ පනතින්, දනට කෙරෙන අසාධාරණ ක්‍රියාවක් නැති වන්නේ නැහැ. සාමාන්‍ය මිනිසාට සහ පූජනීය සිද්ධස්ථානවලටත් නියම ප්‍රයෝජනයක් ලැබෙන වැඩ පිළිවෙළක් මෙහි නැහැ. පූජනීය ස්ථානවලත්, ඒවායේ පදිංචි වී සිටින අයගේත් යන මේ දෙපක්ෂයේම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස විධිමත් වැඩ පිළිවෙළක් කවදාවත් මෙවැනි පනතකින් ඇති වන්නේ නැහැ. නින්දගම් සියල්ලම අරගෙන ඒවා බෙදීම පමණක් නොවෙයි කළ යුත්තේ. මේ රටේ සිය දහස් ගණන් මිනිසුන් නින්දගම්වලට සම්බන්ධ වී ඉන්නවා. තව හුඟක් දෙනෙක් බණ්ඩාරගම්, විහාර දේවාලගම්වල ගොවියන් වශයෙන් ඉන්නවා. ඒ අය අතර තමන්ගේය කියා සතුටු වන්නට බිම් අඟලක්වත් නැති අය විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ නිසා නින්දගම් ගැන පමණක් බලන්නේ ඇයි?

නින්දගම් විශාල ප්‍රමාණයක් දනටමත් තේවතු, රබර්වතු, පොල්වතු බවට පරිවර්තනය වී තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ එවැනි තැන් රාශියක් තිබෙනවා. මහනුවර නාථ දේවාලයට අයිති ඉඩම්, බණ්ඩාර ඉඩම්, නින්දගම් ඔක්කොම පොල්වතු වෙලා තිබෙනවා. ඒවා ගැන සොයන්නට ඕනෑ. සොයා බලා, ඒවායේ අයිතිකාරයන්ට නොව, ඒවායේ දනට පදිංචි වී සිටින්නන්ට ප්‍රයෝජනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් ඇති කිරීම ඉතාමත් ම වැදගත් බව මා ඉතා ඕනෑකමින් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඊයේ වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) සහ කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) විහාර දේවාලගම් සහ නින්දගම් පිළිබඳව අදහස් ප්‍රකාශ කළා. 1953 දී ඉදිරිපත් කරන ලදුව, 1956 දී පිට කරන ලද සැසි වාර්තාවකින් කොටස්ද කියවන්නට යෙදුණා. ඒ වාර්තාවෙන් කොටස් උපුටා ගෙන මාත් කියවන්නට වුවමනා කරන්නේ නැහැ. මේ පනත ගැන අපේ ගරු මන්ත්‍රීන් බොහෝ දෙනෙක් ඉතා වැදගත් කරුණු රාශියක් ඉදිරිපත් කළා. ලංකාවේ නොයෙක් ප්‍රදේශවල නින්දගම් විශාල ප්‍රමාණයක් තිබෙන බව අපට හොඳාකාර පැහැදිලියි. ඒවා සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කරන වාර්තාවක් ලැබී ඇතත් එයිනුත් සැහෙන ප්‍රයෝජනයක් ලබාගෙන ඇති බවක් අපට නම් පෙනෙන්නේ නැහැ. සැසි වාර්තාවේ 38 වැනි පිටුවේ 49 වැනි වගන්තියේ මේ ආකාරයට සඳහන් කර තිබෙනවා :

(අ) වක්‍රය.—නින්දගම් පැතිරී තිබෙන අන්දම

| අංකය | දිස්ත්‍රික්කය | නින්දගම් | පරවේණි පංගුවල වපසරිය | | |
|---|---|---|---|---|---|
| | | | අමුණු | පැල් | කුරුණි |
| 1. | මහනුවර | 9 | 36 | 0 | 8 |
| 2. | මාතලේ | 69 | 443 | 0 | 5 |
| 3. | නුවරඑළිය | 1 | 18 | 1 | 8 |
| 4. | බදුල්ල | 90 | 1,303 | 1 | 5 |
| 5. | රත්නපුරය | 127 | 7,457 | 0 | 2 |
| 6. | කෑගල්ල | 93 | 2,376 | 3 | 5 |
| 7. | කුරුණෑගල | 4 | 292 | 2 | 7 |
| 8. | අනුරාධපුරය | 118 | 409 | 2 | 0 |
| | එකතුව | 511 | 12,337 | 1 | 0 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

නින්දගම් වශයෙන් සංඛ්‍යා ලේඛන වලට ඇතුළත් වෙලා තිබෙන ප්‍රමාණය එපමණක් බව කොමිෂන් සභා වාර්තාවෙන් අපට කියනව. ඒ කාලයේ නින්දගම් වෙන් කර දුන්නෙ පුදුම විධියටයි. "මෙන්න මේව අපේ නින්දගම්" කියා කවුරු හෝ යමක් ලියල තිබුණ නම් හරි, ප්‍රකාශයක් කරල තිබුණ නම් හරි, ඒ ප්‍රකාශය කළ තැනැත්තාගේ බලවත්කම උඩ ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ඒ පුද්ගලයා සඳහන් කළ ඉඩම් නින්දගම් වශයෙන් ඔහුට වෙන් කර දුන්න. මේ රටේ මිනිසුන්ගෙ ඇත්ත යුක්තිය මොකක්ද කියල ඉංග්‍රීසි කාරයො දන්නෙ නැහැ. අනික් කාරණය, මේ රටේ එකල පැවති යුද්ධ නිසා රටට ආදරය තිබුණු මිනිසුන්, ජාතියට ආදරය ඇති මිනිසුන්, භාෂාවට ආදරය ඇති මිනිසුන්, කොටින් කියනව නම් ඒ කාලයේ ඉස්සරහ සිටිය මිනිසුන් වැඩි දෙනා විනාශ වෙලා සිටි යුගයකයි, නින්දගම් ක්‍රමය ඇති කරන්නට ඉංග්‍රීසිකාරයන්ට පුළුවන් වුණේ. ඒ නිසා මේ නින්දගම් ලබාගත් වැඩි දෙනා ඒවායේ නියම අයිතිකාරයො නොවෙයි. ඔප්පු ලියකියවිලි ආදිය සකස් කරගෙන මේ නින්දගම් ලබා ගත් වැඩි දෙනා බොරුකාර ව්‍යාජ කපටි තක්කඩි පිරිසක් බව අපි මේ සභාවේදී නිර්භයව කියන්ට ඕනෑ. ඒ කාලයේ තමන්ගේ රට වෙනුවෙන් තමන්ගේ ජාතිය වෙනුවෙන් සිංහල රාජ්‍යය බේරා ගැනීම සඳහා සටන් කළ උදවියට අයිතිව තිබුණු නින්දගම් හා බණ්ඩාරගම් ආදිය සියල්ලම රාජසන්තක කරල ඉංග්‍රීසින්ට ගතු කිව්ව, ඉංග්‍රීසින්ට ඔත්තු සැපයුව, ඉංග්‍රීසින්ට පන්දම් අල්ලපු උදවියට ඒවා බෙදා දුන්න බව අපේ ඉතිහාසයෙන් හොඳාකාර පැහැදිලි වෙනව. ඒ නින්දගම් බුත්ති විඳගෙන ආව උදවිය පරවේණි දාස ක්‍රමය පවත්වාගෙන ආවා පමණක් නොවෙයි, මේ රටේ සාමාන්‍යයෙන් ජාතිකත්වය රැකීමට ක්‍රියා කළ උදවියටත් පහර ගසමින් ඔවුන්ගේ අයිතිවාසිකම් පවා ඉතාම නරක අන්දමට පාවා දුන්නා.

මහනුවර පිළිබඳව මා කලිනුත් කියා තිබෙනවා. ඒ ගැන යළිත් වරක් කියන් නම්. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේත් ඒ ගැන අහන්න කැමති වෙනවා ඇති. මහනුවර තිබෙනවා, දෙයියන්නේවෙල නමින් ඉතා විශාල ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයට අයිති ගම් රජුන් විසින් දෙනු ලැබූ පිළිවෙල කෙසේද? එය පැහැදිලි කිරීම සඳහා එක් කතාවක් පමණක් කියන්නම්. දෙයියන්නේවෙල ඒ කාලයේ බොහොම සරුවට පැසුණු වෙලක්. ඒ කාලය දෙවන රාජසිංහ රජතුමාගේ කාලයයි. එතුමා ඒ කාලයේ අප්‍රසිද්ධ වේශයෙන් කොයි කොයි ස්ථානවලටත් යන සිරිතක් තිබුණා. එතුමා හොඳට ඇන්ද පැළැන්ද කෙනෙක්. එතුමාගේ කමිසයේ අත් දෙක එක පාටක්. එතුමාගේ කමිසයේ නැතිනම් කෝට් එකේ බඳ කොටස වෙනත් පාටක්. එතුමා බොහොම ලස්සනට දීප්තිමත් විදියට වැඩ කළ කෙනෙක් බව ඉතිහාසයෙන් පෙනෙනවා. එතුමා බොහොම පහළ මිනිසුන් සමග ලඟින් ඇසුරු කළ රජ කෙනෙක්. දිනක් එතුමා මාලිගාවෙන් පිටත් වෙලා දෙයියන්නේවෙල නමැති ප්‍රදේශයට ගොස් තිබෙනවා. දෙයියන්නේ මහනුවර නගර සභා ප්‍රදේශයට අයත් කොටසක්. මා එම කොටසේ නගර සභා නියෝජිතයා වශයෙන් අවුරුදු 20ක් පමණ කටයුතු කර තිබෙන නිසා ඒ ප්‍රදේශයේ ඉතිහාසය දන්නවා. එතුමා එසේ යන වේලාවේදී එක්තරා ස්ත්‍රියක් පැල් රකිමින් ඉඳල තිබෙනවා. ඇය දුටු රජු කවියක් කියා තිබෙනවා :

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

(திரு. எம். தென்னகோன்—நிக்கவெரட்டிய)

(Mr. M. Tennekoon—Nikaweratiya)

ඒ කවිය කියන්න.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

(திரு. ரீ. பி. தென்னகோன்)

(Mr. T. B. Tennekoon)

ඒ කවිය මෙසේයි :

වෙලක මහිම බල මාවී පැසීලා
පැලක මහිම බල අතු හෙවිලි ලාලා
මලක මහිම බල අතු අග පිපීලා
ලියක මහිම බල ගෝමර ඉසීලා

එහෙත් ස්ත්‍රිය දන්නේ නැහැ, මේ කවිය කිව්වේ කවුරුන් විසින්ද යන වග. ඒ යුගයේ අපේ රටේ කාන්තා පක්ෂයත් පිරිමි පක්ෂයත් කවි ගැන හොඳින් දන්නවා. රජවරුත් එහෙමයි. දන් නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, මෙම ගරු සභාවේ කවියක්, කවියක් හැටියට කියන්නටත් බැහැ. අනික් අතට කවියක් කිව්ව මිනිහාය කියන එකත් නින්දාවක් හැටියටයි හුඟක් දෙනා සලකන්නේ. දැන් මට වෙලා තිබෙන ලොකුම නින්දාව තමයි, කවි කියා තිබෙන එක. ඉස්සර එහෙම නැහැ. එදා අපේ රටේ රජවරුත් කවි කිව්වා. දැන් රට පෙරළිලා නොවැ.

ගරු කථානායකතුමනි, අර ස්ත්‍රිය දැන සිටියේ නැහැ, එම කවිය කිව්වේ කවුද යන්න. එසේ හෙයින් ස්ත්‍රියක් කවියෙන්ම උත්තරයක් දුන්නා. ඒ උත්තරය මෙසේයි :

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
ඇදලා කියන්නට බැහැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
තමුන්නාන්සේ ඒකට ඉඩ දෙන්නේ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
ඒක මගේ වරදක් නොවෙයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
මෙන්න, එම කවිය :

වෙල හොඳ මොකද යල මහ පාලු වේ නම්
පැල හොඳ මොකද පොද වැස්සට තෙමේ නම්
මල හොඳ මොකද අතු අග පරව යා නම්
ළිය හොඳ මොකද ඉසි ගෝමර මැකේ නම්

රජතුමාට මේක ඇහුණා. කවිය කියන ගමන්ම අර කාන්තාවත් රජ්ජු දුටුවා, දැකලා බිය වුණා. බයවෙලා දුවන්නට පටන් ගත්තා. මම මේ කවියෙන් පිළිතුරු දුන්නේ රජ්ජුරුවන්ට නොවේදැයි සිතා බියවෙලා දුවන්නට පටන් ගත්තා. එසේ දුවනවා දුටු රජ්ජු කිව්වා තවත් කවියක්. මෙන්න, ඒ කවිය :

විකලා මරණ සිහ රජෙකුත් නොවේ නම්
ඇනලා මරණ කුළු මීමෙක් නොවේ නම්
විදලා මරණ වැදි රජෙකුත් නොවේ නම්
දුවලා වෙහෙස නොගනින් ලඳ බයේ නම්

එයා ඒපාර නැවතුණා.

ගරු කථානායකතුමනි, මේ කවිය රජතුමා කී විට නැවතත් ඒ කාන්තාව උඩුහුම්පොල කන්ද උඩ ඉඳගෙන මෙන්න මේ කවිය කිව්වා.

රන පිට රන තුඩ රන දීයත්
ඇදලා ඇටෙව් දුන්නෙත් අගට ඊයත්
බළලුන් දුටුවාම බිය නැද්ද මීයත්
දුටුවම බිය නැද්ද රාසිංහ දෙවියත්

ඒ කාන්තාව කිව්වා රාජසිංහ රජතුමා දුටුවිට බියක් නැතිව සිටින්න පුළුවන්ද, කියා. ඊටපසු මේ රාජසිංහ රජතුමා විසින් දෙයියන්නේවෙල කියන ගම පරවේණි ගමක් හැටියට එම කාන්තාවට පවරා දුන්නා. මෙන්න මේ පිළිවෙළටයි නින්දගම් සහ පරවේණි ගම් අයිති වුණේ. බණ්ඩාරගම් අයිති වුණෙත් ඒ විධියටයි. රාජකාරි කරන අයට පවරා දුන් ඉඩම් තමයි ඒ. ඇහැලේපොල සබරගමුවට අධිකාරම් වශයෙන් පත් කර යවන විට ඔහුට ඉඩම් පවරා දුන්නා. ගරු කථානායකතුමනි, ලංකාවේ මේ ඉඩම් කොටස් පුරාණ කාලයේදී අයත් වූයේ ඔන්න ඔය පිළිවෙළටයි. ඊටපසුව තමයි, ඉඩම් භුක්ති විඳීමේ ක්‍රමය ඇති වීමෙන් පසුව මේ පිළිවෙළ ඇති වී තිබෙන්නෙ. ගරු කථානායකතුමනි, එදා අර කාන්තාවට පවරා දුන් ඉඩම් අද ඒ කාන්තාවටත් ඇයගේ පරම්පරාවටවත් අයිති වන්නේ නැහැ. ඒ ප්‍රදේශයේ බොහෝ දෙනා පදිංචිව සිටිනවා. ඒ උදවියටවත් අයිති වන්නේ නැහැ. හැම ඉඩමක්ම ඔය විධියටයි. දේවාල ඉඩම් තිබෙනවා, විහාරගම් තිබෙනවා, බණ්ඩාරගම් තිබෙනවා, ඒ වගේම නින්දගම් තිබෙනවා. සමහර විට නින්දගම් අයිති පවුල්, ඉන්න තැනක් නැති තත්ත්වයට පත්ව සිටිනවා. මේ කියන ඉඩම් අයත් කරගෙන සිටින්නේ වෙනත් අයයි. මේ ඉඩම් අයිති කර ගෙන තිබෙන්නේ පදිංචිකාරයින්වත්, පරවේණිකාරයින්වත්, විහාරගම්, දේවාලගම්කාරයින්වත් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

වෙනින්ම පිරිසක් විසිනුයි මේවා අයිති කර ගෙන සිටින්නෙ. ඒ නිසා විශේෂයෙන්ම විහාරගම්, දේවාලගම් බදු දීමේදී මීට වඩා ක්‍රමානුකූලව එය කරන්න ඕනෑ. අපි දන්නවා පොතේ තිබෙන්නේ රුපියල් 10 යි. ඒ අනුව විහාරගමකින් දේවාලගමකින් අවුරුද්දකට ලැබෙන්නේ රුපියල් 10 යි. නමුත් මාසයකට එයින් ලැබෙන ආදායම රුපියල් 200 යි. එහෙම නැත් සිය දහස් ගණනක් මා පෙන්වා දෙන්නම්. ඔය විහාර ගම්, දේවාල ඉඩම්, ඒ වගේම විහාර වලට හා දේවාලවලට අයිති ගෙවල් ආදිය පිළිබඳවත් කටයුතු කෙරෙන්නේ මේ පිළිවෙළටයි. ඒ නිසා මේ නින්දගම් අද කර ගෙන ආව—භුක්ති විඳගෙන ආව—උදවිය ටම ඒ නින්දගම් ලබා දීමේ පිළිවෙළක් ඇති කරනවා නම්—නීති මාර්ගයෙන් එසේ කිරීමට කටයුතු කරනවා නම්—ඉතාම වැදගත් බව කියන්න කැමතියි. ඒ උදවියම හිරිහැරයක් නැතිව ඒ ඉඩම් භුක්ති විඳගෙන සිටීමේ වරදක් නැති බව ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ පනත ගැන තව මන්ත්‍රීවරු කීප පොලක්ම කථා කිරීමට බලාපොරොත්තුවෙන් සිටින නිසා මගේ කථාව දීර්ඝ කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. වෙනත් කිවයුතු විස්තරයක් ඇත්තෙත් නැහැ. නමුත් මා එකක් කියන්න කැමතියි. මේ නින්දගම් පනත මේ පිළිවෙළට ඉදිරිපත් කිරීමේ කිසිම තේරුමක් නැහැ. ඒ නිසා රටේ අද තිබෙන තත්ත්වයට පිළිමැසෙන, සාධාරණ පනතක් මේ සභාවට ඉදිරිපත් කරනවා නම්—මේ පීඩා විඳින ජනතාවට සාධාරණයක් යුක්තියක් ඇති වන අන්දමේ පනතක් ඉදිරිපත් කරනවා නම්—අපේ සම්පූර්ණ සහයෝගය එයට ලැබෙන බව කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 3.32

**ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා. (පැල්මඩුල්ල)**

*(திரு. டபிள்யு. ஏ. தர்மதாச—பெல்மடுல்லை)*

(Mr. W. A. Dharmadasa—Pelmadulla)

ගරු කථානායකතුමනි, නින්දගම් ඉඩම් පනත පිළිබඳව ඉතා කෙටි කථාවක් කරන්න මේ අවස්ථාවේදී මා බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති මෙම නින්දගම් පනත කියවාගෙන යන විට, ඊයේ වලපනේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, කන්දක් විළි ලා මී පැටියෙක් වැදුවාය කියන උපමාව අපේ සිතට නැගෙනවා. අවුරුදු දෙකක් පමණ කල් පතා කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මෙම පනතෙනුත්, ඊට අදාළව ඉදිරිපත් කර ඇති සංශෝධනයෙනුත් පෙනී යන්නේ පරවේණි නිලකාර පංගු වල **රාජකාරිය කිරීම** පමණක් නැති කෙරෙන බවයි; එහෙම නැත්නම් රාජකාරි වෙනුවට ගෙවනු ලබන අර සුළු මුදල නැති කිරීම පමණයි.

පරවේණි නිලකාර පංගුවල කිසිම අයිතියක් නින්දගම් හිමියාට නැහැ. පරවේණි නිලකාර පංගුවල අයිතිය සතුව ඇත්තේ ඒ ඒ දිස්ත්‍රික්කවල ඉඩම් ලියාපදිංචි කිරීමේ අංශවල ලියාපදිංචි වී ඇති, ඒ ඉඩම්වල උරුමක්කාරයන්ටයි. ඒ නිලකාරයන් විසින් නින්දගම් හිමියන්ට යම් කිසි රාජකාර්යක් කළ යුතුව තිබුණ නමුත්, බ්‍රිතාන්‍ය ආණ්ඩු කාලයේදීම වැඩවසම් ක්‍රමය නැති කළාට පසුව අද ඒ රාජකාරිය කෙරෙන්නේ නැහැ. ඒ වෙනුවට සමහර තැන්වල සුළු මුදලක් ගෙවන්නට තිබෙනවා. එහෙත් අයිතිය සම්පූර්ණයෙන්ම තිබෙන්නේ ඒ පරවේණි නිලකාර පංගුවල උරුමක්කාරයන්ටයි. සමහර නින්දගම්වල ඇති ගස්කොළන් ආදියෙන් දහයෙන් පංගුවක් නින්දම් හිමියන්ට අයිතියි. එම දහයෙන් පංගුවේ අයිතියවත් වෙනස් කර දෙනවාය කියා මේ පනතින් කියැවෙන්නේ නැහැ. පනතින් කියන්නේ යම්කිසි සේවයක් කරනවා නම්, කරන්නට තිබෙනවා නම්, ඒ සේවය අහෝසි කරන බව සහ ඒ සේවය වෙනුවට බදු මුදලක් ගෙවන්නට තිබෙනවා නම් ඒ බදු මුදලත් ඉවත් කරන බවයි.

සබරගමු ප්‍රදේශය මැණික් තිබෙන ප්‍රදේශයක් බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ නින්දගම් ඉඩම්වල දුප්පතා ගරන මැණික්වලින් ඉතාම අසාධාරණ ගැනීමක් නින්දගම් හිමියන් විසින් ගන්නවා. යම් කිසි ඉඩමකින් මැණික් ලැබුණ විට ඒ මැණික් පිළිබඳ වැඩ කරන අය ඒවායේ වැඩ නිම කර, ඉඩම් කොටස වෙනුවෙන් පහෙන් පංගුවක් දීමේ සාමාන්‍ය සිරිතක් අපේ රටේ තිබෙනවා. නින්දගම් හිමියාට ලැබිය

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

යුතු 10න් එක වෙන් කළ යුත්තේ මේ කියන පහෙන් පංගුවෙනුයි. එහෙත් නින්දගම් හිමියන් ඉතාමත් අසාධාරණව මේ පහෙන් පංගුවෙන් දෙකෙන් පංගුවක්ම ගන්නවා. එවැනි ප්‍රශ්නයක්වත් විසඳන ආකාරයක් මේ පනතින් ඉදිරිපත් කර නැහැ. මේ පනතින් කරනවායයි කියන්නේ අර රාජකාරිය එහෙම නැත්නම් රාජකාරිය වෙනුවෙන් ගෙවනවාය කියන සුළු මුදල අහෝසි කරන්නට මණ්ඩලයකට බලය පවරනවාය කියන එකයි. මහ ලොකුවට මේ පනත ප්‍රචාරයට දැම්මත් ප්‍රවේණි නිලකාර පංගුවල අයිතිය පැවරීමක් මේ පනතින් කියන්නේ නැහැ. ඒවා ඒ ඉඩම්වල සිටින අයටම අයිතියි. මේ පනතින් ඒ අයට අමුතුවෙන් පැවරීමක් කෙරෙන්නේ නැහැ.

ඉංග්‍රීසි පාලන කාලයේදී අර වැඩවසම් ක්‍රමය නැති කළාට පසුව සබරගමුව පළාතේ සමහර නින්දගම්වල කිසිම රාජකාරියක් නොකරන අය පදිංචි වී සිටියා. ඒ අයට රාජකාරියකුත් නැහැ; බදු ගෙවීමකුත් නැහැ. ධනපති කිහිප දෙනෙක් නින්දගම් හිමියන්ගෙන් ඒ ඉඩම් ඔප්පු පිට අරගෙන පසුගිය දිනවල ඒ නින්දගම් ඉඩම්වල පදිංචි වී සිටි පවුල් සිය ගණන් එළියට දැම්මා. තඩු දමා උසාවිය මාර්ගයෙන් එසේ පදිංචි වී සිටි අය සිය ගණන් පවුල් පිටින් එළියට දැම්මා. මේ පනතින් එවැනි අයටවත් කිසියම් සහනයක් ලැබෙන අන්දමක් පෙන්වා දී නැහැ. ඒ අතරම යුරෝපීය කොම්පැනිවලට අක්කර දහස් ගණන් විකුණා ඇති වතුවලට මේ පනතින් සේවයක් සැලසෙනවා. මේ පනත අනුව එවැනි වතු හිමියන්ට කිසිම ප්‍රශ්නයක් නැතිව තමන්ගේ අයිතිය තහවුරු වෙනවා. මේ පනත අනුව රාජකාරිය වශයෙන් ගෙවන අර සුළු මුදල ගෙවීමකුත් නැතිව ඒ ඉඩම්වල අයිතිය ඒ අයට නම් නියම විධියට තහවුරු වෙනවා. එමෙන්ම අක්කර දස දහස් ගණන් විශාල කැලෑ ඉඩම් අයිති කරගෙන ඒවාට අධිපතිකම් කරන සීතා මොලමුරේ සෙනෙවිරත්න මැතිනිය වැනි අයගේ අක්කර දස දහස් ගණන් විශාල නින්දගම්වලට මේ පනතින් ඇතිවන හානිය කුමක්ද? මේ පනතින් ඒ ඉඩම් අත්පත් කර ගැනීමක් හෝ බෙදා දීමක් කෙරෙන්නේ නැහැ. මෙය නිකම් පුහු වෙඩිල්ලක් වගෙයි. මේ පනත මෙයට ඉදිරිපත් කර ඇති සංශෝධනත් සමග කියවා බලනවිට පෙනීයන්නේ මෙය සම්පූර්ණයෙන්ම පුස් වෙඩිල්ලක් බවයි. හරියාකාරව ක්‍රියාත්මක කළ හැකි පනතක් ඉදිරිපත් කළා නම් අපිත් කැමතියි.

මෙවැනි පනතක් හරියට ක්‍රියාත්මක වෙනවාය කියන්නේ සියලුම නින්දගම් රජය සතු කළොත් පමණයි. ඒ අතරම යුරෝපීය වතු සමාගම්වලට අයිති ඉඩම්වලින් ඒවායේ වර්තමාන වටිනාකම අනුව තක්සේරු කර බද්දක් අය කරන්නට ඕනෑ. එමෙන්ම ඉඩම් නැති අයට ඒවා බෙදා දෙන්නට ඕනෑ. අක්කර දහස් ගණන් විශාල කැලෑ ඉඩම් සංවර්ධනය කර වගා කරන්නට ගොවීන්ට බෙදා දෙන්නට ඕනෑ. මේ පනත අනුව එවැනි කිසිවක් කෙරෙන බවක් පෙනෙන්නේ නැහැ. අතුරු මැතිවරණ කාලයේදී මහ ලොකුවට ප්‍රචාරය කර මේ පනත ඉදිරිපත් කළා. එහෙත් දැන් එය පුස් වෙඩිල්ලක් බවට පත් වී තිබෙනවා. දැනට සබරගමුව පළාතේ තිබෙන නින්දගම්වලිනුත්, විහාරගම් දේවාලගම් හැරුණු විට අනික් ඒවායෙනුත් රාජකාරි කිරීමක් නැහැ. සුළු මුදලක් ගෙවා ගෙන ඒවායේ රාජකාරි කරමින් සිටි ඇත්තන් සිටියා නම් ඒ අය එම ඉඩම්වලින් ඉවත් කර ඒ වෙනුවට ප්‍රවේණි නිලකාර පංගුවලට වෙනත් අය ඇතුළත් කර නින්දගම් හිමියන් විසින් ඒ කොටස් සම්පූර්ණයෙන්ම අයිතිකරගෙන තිබෙනවා. විහාර දේවාලගම් නොවන ඉඩම්වල ඇති වී තිබෙන තත්ත්වය ඒකයි. ඒ අන්දමින් එළවා දැමූ අහිංසක ජනතාවට සහනයක් සැලසෙන තැනක් මේ පනතෙහි පෙනෙන්නට නැහැ.

ඒ අතරම, කිසිම අසාධාරණයක් කරන්නෙ නැතුව ඒ ඉඩම් ඒ අයටම කන්න දී, කිසිදු බදු අය කිරීමක් කරන්නෙ නැතුව, රාජකාරියක් නැතුව ඉඩම්වල පදිංචි වීමට ඉඩ සලසා දී ඇති අය සිටිනවා. රත්වත්තේ වලව්වේ නින්දගම් තුළ පදිංචිව සිටින අයගෙන් කිසිම බදු අය කිරීමක් කරන්නෙ නැහැ. මේ පනත ගෙනෙන්නටත් බොහෝ කාලයකට පෙර සිට කිසිම බදු අය කිරීමක් නොමැතිව, කිසිම රාජකාරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධම්මදස මයා.]

කටයුත්තක් කරන්නෙ නැතුව, ඒ ඉඩම් වල වගාවන් කරගෙන, පලදාව භුක්ති විඳගන්න ඉඩ දී තිබෙනවා.

ඒ කෙසේ වුණත් මේ පනතින් දැක්වෙන කාරණා ටික ඉටු කරන්න නම් මණ්ඩලයක් පත් කිරීම අවශ්‍ය නැති බව සඳහන් කළ යුතුව තිබෙනවා. මණ්ඩලයක් පත් කර ක්‍රියාත්මක කරන්න තරම් දෙයක් මේ පනතෙහි අඩංගු වෙන්නෙ නැහැ. මෙම පනතින් කරන්න බලාපොරොත්තුවන්නේ ප්‍රවේණි නිලකාර පංගුවලින් අය කරන බද්ද හෝ ප්‍රවේණි නිලකාර පංගු වෙනුවෙන් කරන්න ඇති රාජකාරිය නැති කිරීම පමණයි. ඉතින් එය ක්‍රියාත්මක කරන්න මණ්ඩලයක් අවශ්‍ය වෙන්නෙ නැහැ. නීතියක් සකස් කර ගරු සභාවට ඉදිරිපත් කර සම්මත කර ගත්තාම එය කළ හැකියි. "නින්දගම් ඉඩම්වල පදිංචි ප්‍රවේණි නිලකාර පංගු භුක්ති විඳින්නන් ඒ ඉඩම් භුක්ති විඳීම වෙනුවට කරන රාජකාරි කිරීම හෝ එම රාජකාරි වෙනුවෙන් කරන මුදල් ගෙවීම් මෙයින් අවලංගු කරන අතර එම ඉඩම් භුක්ති විඳින්නන් නීත්‍යානුකූලව අයිතිකරුවන් ලෙස පිළිගනු ලැබේ" කියා නීතියක් ගරු සභාවට ඉදිරිපත් කර සම්මත කර ගත්තාම එය හොඳටම ප්‍රමාණවත් වේවි, මේ පනතෙහි අඩංගු දැ ක්‍රියාත්මක කරන්නට නම්. ඇත්ත වශයෙන්ම මණ්ඩලයක් පත් කිරීමෙන් වැඩක් නැහැ, මේ පනතෙ සඳහන් කාරණා ක්‍රියාත්මක කරන්නට. ඒ අන්දමට නීතියක් සම්මත කර ගත හොත් නින්දගම් හිමියාට ගෙවන්න සිද්ධ වන දහයෙන් එක් කොටස සම්බන්ධයෙන් හෝ ටිකක්වත් පොරයක් අල්ලන්න අර පරවේණි නිලකාර පංගුවල පදිංචි අයට පුළුවන් වෙනවා. සාමාන්‍යයෙන් මෙම ඉඩම්වල පදිංචි අය රාජකාරි කටයුතු නොකරන නිසා සුළු බදු මුදලක්, රුපියල් තුනයි පනහක් හෝ රුපියල් පහක් පමණ ගෙවන නිසා, මෙම පනතින් ඒක නැති කිරීම පමණයි කෙරෙන්නෙ. එසේ නැතුව දහයෙන් පංගුව දීම අඩු කිරීම ගැනවත්, පොලොවෙන් ලැබෙන වස්තුවෙන් පහෙන් දෙකෙන් පංගුවක් දීම ගැනවත් කිසිම විධියක සහනයක් ප්‍රවේණි නිලකාරයින්ට මෙම පනතින් සැලසෙන බවත් පෙනෙන්න නැහැ.

මා අදහස් කරන හැටියට හරියාකාර වැඩක් කරන්න නම් සියලුම නින්දගම් රජයට පවරා ගන්න ඕනෑ. එසේ පවරාගෙන එම ඉඩම් භුක්ති විඳගෙන ආ අයට සාධාරණ අන්දමට බෙදාදී ඒවා වගා කරගෙන ජීවත්වීමට ඉඩ කඩ සලසා දෙන්න ඕනෑ. අන්න ඒ අන්දමටයි මේ පනත සකස්කර ක්‍රියාත්මක කළ යුතු වන්නේ. එසේ නැති වුණොත් කුඹුරු පනත ඉදිරිපත් කළා වාගේ තත්ත්වයකට වැටෙනවා. කුඹුරු පනතට සංශෝධන දෙක තුනක් ඉදිරිපත් කළත් එයින් රත්නපුර දිස්ත්‍රික්කයෙ ජනතාවට සහනයක් සැලසී නැහැ; එම ප්‍රදේශයට කුඹුරු පනත ක්‍රියාත්මක කරන්න බැහැ. ඒ අන්දමට සලකන විට මේ පනතත් ක්‍රියාත්මක කරන්න ඉඩක් නැති, ක්‍රියාත්මක කළ නොහැකි පනතක් හැටියටයි හඳුන්වන්න තිබෙන්නෙ. කොටින්ම මෙය ක්‍රියාත්මක කළ හැකි පනතක් නොවෙයි. මේ පනත ගැන විස්තර කරනවා නම් හරියට කෙළින් ඇල්ලීමට ඇති නාසය ඔළුව වටා රවුමක් අතයවා ඇල්ලුවා වාගෙයි. එසේ වුණත් පනතෙන් ක්‍රියාත්මක කරන්න අදහස් කරන කාරණා ඉතාමත්ම කෙටියි; එය හරියට කෙළින්ම නහය අල්ලනවා වාගෙයි. කෙටි දුරකින් ළඟා විය හැකි දෙයකට ළඟාවීම සඳහා ලොකු රවුමක් ගසා තිබෙනවා. ලොකු ප්‍රචාරයක් කර තිබෙනවා. ඇත්තෙන්ම මෙම පනතෙන් නින්දගම් හිමියන්ට සිදු වන්නේ ඉතාමත්ම සුළු පාඩුවක්. ඒ අතර පරවේණි නිලකාරයාට සුළු යහපතක් සිදු වෙනවා. දැනට තිබෙන අයිතිය හැර අමුතුවෙන් කිසි අයිතියක් ඇති කිරීමක් මෙම පනතෙන් සිදු වන්නේ නැහැ. පරවේණි නිලකාරයන්ට මෙම පනතෙන් අමුතුවෙන් හිමිකමක් පවරා දෙන්නේ නැහැ. ඇත්තෙන්ම ඉතාමත්ම සුළු සේවයක් පරවේණි නිලකාරයන්ට සිදු වන මෙම පනත අංග සම්පූර්ණ එකක් යයි කිසි සේත්ම කිව නොහැකියි. නින්දගම් ඉඩම්වල දුක් විඳින ජනතාවට නියම සේවයක් සැලසෙන පරිද්දෙන් මෙම පනත සකස් කරන හැටියටත්, සියලුම නින්දගම් ඉඩම් රජයට පවරා ගෙන සාධාරණ පරිදි ඒවා බෙදා දෙන ලෙසටත් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

අ. භා. 3.50

**ටී. බී. සුබසිංහ මයා. (කටුගම්පොළ)**
(திரு. ரீ. பி. சுபசிங்ஹ—கட்டுகம்பொள)
(Mr. T. B. Subasinghe—Katugampola)

ගරු කථානායකතුමනි, මෙම පනත සම්බන්ධයෙන් දීර්ඝ වූත්, ව්‍යක්ත වූත් දේශනයක් කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් අප නියෝජනය කරන පළාත්වල නින්දගම් නැතත්, විහාර ගම් හා දේවාලගම් නිසා යම් යම් ප්‍රශ්න පැන නැඟී තිබෙන හෙයින් මේ කාරණයට සම්බන්ධ කර ගනිමින් ඒ ප්‍රශ්න ගැන යමක් කීමට අදහස් කරනවා. මා කාරණා දෙකක් තුනක් පමණයි, ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමනි, මෙම පනතේ අඩුපාඩුකම් රාශියක් ඇති වන්නට හේතුව සෑම අංශයක් ගැනම සම්පූර්ණ වශයෙන් කල්පනා කර බලන්නේ නැතිව මෙය සකස් කිරීම නිසයි. දැනට අවුරුදු දෙකකට පමණ පෙර හදිසියේ මෙම පනත මෙම ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ කාලයේ බලංගොඩ අතුරු මැතිවරණය පැවැත් වුණා. මා දන්නා හැටියට ඒ දවස්වල නීති කෙටුම්පත්කරු මෙම පනත සකස් කර තිබුණේ නැහැ. එහෙත් පැය 24 ක් ඇතුළත මෙම පනත සකස් කර ඇමති වරයා වෙත ඉදිරිපත් කරන ලෙසට නීති කෙටුම්පත්කරු වෙත නියෝගයක් ගියා. මෙම කඩිමුඩියට හේතුව බලංගොඩ අතුරු මැතිවරණයයි. මෙය බලංගොඩ අතුරු මැතිවරණය සඳහා රහස් ආයුධයක් ලෙස පාවිච්චි කරන්නටයි, ආණ්ඩුව බලාපොරොත්තු වුණේ. ඔය රහස් ආයුධය නිසා ලැබුණු ප්‍රතිඵල අපට දැක ගන්නට ලැබුණා. මා ඒවා ගැන විස්තර කරන්නට යන්නේ නැහැ. එක පක්ෂයකට හෝ එක කොටසකට හෝ පහරක් ගැසීමේ හා තවත් කොටසකට ප්‍රයෝජනයක් සලසා ගැනීමේ චේතනාවෙන් රටට බලපාන යම්කිසි වැදගත් ප්‍රශ්නයක් ගැන කල්පනා කරන්නට ගිය විට නොයෙකුත් වැරදි සිදු වෙනවා. අද මේ පනතේ ලොකු අඩුපාඩු ඇති වී තිබෙන්නේ අන්න ඒ හේතුව නිසයි. ඇත්තෙන්ම මෙම පනතේ දුර්වල කම් රාශියක් තිබෙන හෙයින් ගරු ඉඩම් ඇමතිතුමා මෙම පනත මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නට මුලදී අදහස් කළත් නැහැ. එහෙත් යම් යම් විවේචන නිසා අන්තිමේදී මෙය ඉදිරිපත් නොකර බැරිව ගියා.

රදළ යුගයේ නෂ්ටාවශේෂ තවමත් මේ රටේ ඉතිරි වී තිබෙන බව අප කවුරුනුත් පිළිගන්නවා. විශේෂයෙන්ම ඉඩම් ක්‍රමය තුළ ඒ නෂ්ටාවශේෂයන් තවම තියෙනවා. විසි වැනි ශතවර්ෂයේ අවසාන කාලයට ඔබින පිළිවෙලට අපේ සමාජය හැඩගස්වා ගන්නට නැත් කරනවා නම්, අපේ ආර්ථික ක්‍රමය හැඩගස්වා ගන්නට නැත් කරනවා නම්, සමාජයේ කොටස් අතර තිබෙන වෙනස්කම් විසි වැනි ශත වර්ෂයේ අවසාන කාලයට ගැළපෙන පිළිවෙලට හැඩගස්වා ගන්නට නැත් කරනවා නම්, ඒ ප්‍රශ්න ගැන ශාස්ත්‍රානුකූලව කල්පනා කර, ප්‍රශ්න නිරාකරණය කර, පනත් ඉදිරිපත් කිරීමට ඇමතිවරුන්ට යුතුකමක් තිබෙනවා.

ඒ අනුව කල්පනා කරන විට මේ පනතේ විශාල අඩුපාඩුකම් තිබෙන බව පෙනෙන්නෙ නැත්තෙ කාටද ? මේ පනතෙන් නිලකාරයන්ගේ යම් යම් අයිතිවාසිකම් තහවුරු කරන්නට උත්සාහ කරනවා මිස සම්පූර්ණයෙන් ප්‍රශ්නය දෙස බලා ප්‍රවේණි ක්‍රමයට සම්බන්ධ ප්‍රශ්න සියල්ලක්ම විසඳන්නට උත්සාහ කරන්නෙ නැත කියා මන්ත්‍රීවරුන් රාශියක් පෙන්වා දුන්නා. මේ විසඳීමෙන් වැඩක් වන්නෙ නැහැ. වැඩක් වන්නෙ නැත්තෙ මේ නිසයි. ඇත්ත වශයෙන්ම නිලකාරයන්ගේ අයිතිවාසිකම් අදත් ඒ අය භුක්ති විඳිනවා. ඒ අයිතිය වුණත් ඇමතිවරයා නීතියෙන් තහවුරු කරන්නට කටයුතු කරන්නේ එක පිරිසකට පමණයි ; නින්දගම්වල සිටින පිරිසට පමණයි.

අපේ පළාත්වල තිබෙන ප්‍රශ්නය ගැන මා මුලින් සඳහන් කළා. අපේ පළාතේ දේවාලගම් සහ විහාරගම් සමහරක් තිබෙනවා. මා පදිංචි පිටිගල් කෝරළෙත්, මැද පත්තු බස්නාහිර කෝරළෙත් මහ නුවර දේවාලවලට අයිති සෑහෙන ප්‍රමාණයක් දේවාලගම් තිබෙනවා. අපේ පළාත්වල මහජනයා මේවා පරම්පරාගතව භුක්ති විඳගෙන එනවා. ඒ අය ඒවායින් ජීවිකාව ලබාගෙන තිබෙනවා. අප කුඩා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

කාලයේ ඒ ඉඩම් භුක්ති වින්ද අය ඒ දේවාලවල පෙරහර කාලයේදී ගොස් යම් යම් ආවතේව කළා. එහෙත් පසුගිය පරම්පරා දෙක තුන ඇතුළත මේ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් වී අද ඒ ඉඩම්වල සම්පූර්ණ අයිතිය ඒ අයට ලැබී තිබෙනවා. ඒ අය ඒවා සම්පූර්ණයෙන් භුක්ති විඳ ගෙන එනවා. ඒ ඉඩම් කැබෙලි කර විකුණනවා ; බද්දට දෙනවා ; උගස් කරනවා. පෞද්ගලික දේපලවලට හිමි සෑම අයිතිවාසිකමක්ම වාගේ ඒ අය භුක්ති විඳිනවා. ඇත්ත වශයෙන්ම අර දේවාලවලට ලැබිය යුතු ආදායම ලැබෙන්නෙත් නැහැ ; සේවාවල් කෙරෙන්නෙත් නැහැ. බොහොම කලාතුරකින් බස්නායක නිලමේවරුන් ඇවිත් ඒ මුදල් එකතු කර ගැනීමට උත්සාහ කළත් ඒකත් කර ගන්නට බැහැ. ඒ අනුව, නින්දගම්වල පමණක් නොව දේවාලගම්වල පවා මෙවැනි තත්ත්වයක් ඇති වී තිබෙනවා නම්, අද තිබෙන නියම තත්ත්වය පිළිගෙන ඒ නීතිය සෑම අංශයකටම බලපාන ලෙස ක්‍රියාවේ යොදවන්නට ඇමතිතුමාට බැරි ඇයි? ඒක වැදගත් ප්‍රශ්නයක් හැටියට මා කල්පනා කරනවා.

ගරු කථානායකතුමනි, මා මේ දේවාලගම්වලට හානියක් කරන්නටය කියනවා නොවෙයි. එදා සිංහල රජ කාලයේදී විහාරගම්, දේවාලගම් දීමේදී ඒ රජවරුන් විහාරවලට, දේවාලවලට ඉෂ්ට විය යුතුය කියා බලාපොරොත්තු වූ ආවතේව අද කෙරෙන්නෙ නැහැ ; අද ක්‍රමයේ හැටියට කරන්නට බැහැ. ඒ විහාරවලට සහ දේවාලවලට ආවතේව කිරීමට අද තත්ත්වයක් නැත්නම් ඒවා කිරීමට තත්ත්වයක් ආණ්ඩුව විසින් යෙදිය යුතුයි. දැන් මහ නුවර පෙරහර සම්බන්ධයෙන් අපට අසන්නට ලැබෙන්නේ කුමක්ද? ඒ ආවතේව ආදිය හරියාකාර කෙරෙන්නෙ නැති නිසා පෙරහර පවා කරගෙන යාම බොහොම අමාරු බව අපට නිතර අසන්නට ලැබෙනවා. එහෙත් අපට 12 වැනි ශත ශතවර්ෂයට, 11 වැනි ශතවර්ෂයට, 10 වැනි ශතවර්ෂයට ආපසු ගොස් අර පැරණි රදල ප්‍රවේණි ක්‍රමය සම්පූර්ණයෙන්ම ආපසු ඇති කරන්නට බැහැ. ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම පිළිගන්න අතර, සංස්කෘතික වශයෙනුත් ආගමික වශයෙනුත් අපේ ඉතා උතුම් දේ හැටියට පිළිගන්නා වූ ඒ පෙරහර වැනි දේ, සිද්ධස්ථාන වැනි දේ ආරක්ෂා කිරීමටත්, ඒවායේ නඩත්තුව ගෙන යාමටත් යම් මාර්ගයක් සලස්වා, ඒ ඉඩම්වල වැඩ කරන ගොවි ජනයාට ඒ ඉඩම් පවරා දීමට, නින්දගම් සම්බන්ධයෙනුත්, විහාරගම් සම්බන්ධයෙනුත් ක්‍රමයක් සලස්වා ගන්නවා නම් ඒ විහාරවලට පාඩුවක් වන්නෙ නැතිව මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳා ගන්නට පුළුවන් වෙනවා. ප්‍රශ්න ගැන ඒ විධියට පුළුල් අන්දමින් කල්පනා කරන්න ආණ්ඩුවට බැරි ඇයි? විහාරවලට, දේවාලවලට කිසිම හානියක්, පාඩුවක් සිදු නොවන අන්දමට, නින්දගම් පමණක් නොව පොදුවේ විහාරගම් හා දේවාලගම්ද සම්බන්ධ කරගෙන, පැරණි රදල ප්‍රවේණි නෂ්ටාවශේෂ නැති කිරීමේ චේතනාවෙන් සම්පූර්ණ ආඥාපනතක් ඉදිරිපත් කරන්න බැරි ඇයි? එය ඉතා වැදගත් ප්‍රශ්නයක්.

මේ ඉඩම් සම්බන්ධයෙන් අපේ පළාත්වල සමහරුන් තුළ ලොකු කැක්කුමක් තිබෙනවා. භුක්තිය තිබෙන අය තුළ එවැනි කැක්කුමක් ඇති වීම ස්වාභාවිකයි. එහෙත් අද තමුන්නාන්සේලා යම් යම් විශේෂ කාරණා උඩ සබරගමුවේ එක් කොටසකට පමණක් ඒ භුක්තිය ස්ථිර කර දෙන්නට හදන අතර, අනෙක් අයගේ භුක්තිය ස්ථිර කර නොදෙන්නේ ඇයි? මෙවැනි පරස්පර විරෝධිකම්වලට මුහුණ පාන්නට තමුන්නාන්සේලාට සිද්ධ වන්නේ නරක චේතනාවෙන්, කෙනකුට හෝ පවුලකට පහර ගැහීමේ අදහසින් නීති-රීති ඉදිරිපත් කිරීම නිසායි.

මේ හැරුණාම මේ පනත් කෙටුම්පතේ තවත් විශාල අඩුපාඩුකම් තිබෙනවා. මේ ඉඩම් ප්‍රශ්නය විසඳනවා නම් සම්පූර්ණයෙන්ම විසඳිය යුතුයි. එසේ නියම සම්පූර්ණ විසඳුමක් කළ හැක්කේ, මේ ඉඩම්වල අයිතිය ඒවායේ වැඩ කරන්නන්ට, ගොවියන්ට ලැබිය යුතුය යන්න ප්‍රතිපත්තියක් වශයෙන් මේ රජය භාර ගන්නවා නම් පමණයි. ඒ මිස කොටසකට පමණක් සීමා කිරීමෙන් ප්‍රශ්නය හරි හැටි විසඳෙන්නේ නැහැ. එය තව දුරටත් පැතිරී යා යුතුයි. මේ ඉඩම් මෙන්ම විශාල කැලෑ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඩම්වල, විශාල වතු යායවල අයිතිය සම්බන්ධයෙන් ඇමතිවරයා නිහඬ වන්නේ ඇයි ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 4.30 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்ஹ)*
(Mr. Subasinghe)

කථානායකතුමනි, තේ පානයට විසිර යන්නට පෙර මා කියමින් සිටියේ, මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවේදී මේ ප්‍රශ්නය ගැන සම්පූර්ණයෙන් කල්පනා කර බලා, අද මේ ප්‍රශ්නය විසඳීමට ගැළපෙන මාර්ග යොදා ගත්තා නම් හොඳ බවයි. එම නිසා, මේ ප්‍රශ්නය ගැන නැවතත් කල්පනා කර බලන ලෙස ඇමතිතුමාගෙන් ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිනවා.

ඒ නින්දගම්වල, ඒ ඉඩම්වල සිටින නිලකාරයන්ට ඒවායේ අයිතිය තහවුරු කිරීමට ගන්නා පියවර යහපත් දෙයක් බව ප්‍රතිපත්තියක් හැටියට අප පිළිගන්නවා. ඒ අතර, මෙවැනිම තත්ත්වයක් තිබෙන අනෙක් අංශ ගැනත් අප සලකා බැලිය යුතුයි. අපේ පළාතේ තිබෙන විහාරගම් හා දේවාලගම් ගැන මා සඳහන් කළා. විහාරවලට, දේවාලවලට හානියක්, පාඩුවක් කරන්නැයි මා කියන්නේ නැහැ. ඇත්ත වශයෙන්, අද තිබෙන ක්‍රමයෙන් නම් ඒ දේවාලවලටත්, විහාරවලටත් කිසිම ප්‍රයෝජනයක් නැහැ. ඒ දේවාලවලට හා විහාරවලට නියම විධියට ඒ සේවාවන් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීම හේතුකොටගෙන ඒවාට වී ඇති පාඩුව වැළැක්වීමට ආදායම් මාර්ග යන් සලස්වා දෙන අතර, අර ඉඩම් භුක්ති විඳින නිලකාරයන්ට, ආවේණිකකාරයන්ට ඒවායේ සම්පූර්ණ භුක්තිය පවරා දෙන මාර්ගත් මේ පනත් කෙටුම්පතටම ඇතුළත් වුණා නම් මෙය මීට වඩා අංග සම්පූර්ණයි. මා තේරුම් කර දෙන්නට අදහස් කරන්නේ එයයි. මට පෙර කථා කළ දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) වැදගත් කරුණක් පෙන්වා දුන්නා. අද මේ ප්‍රශ්නය සම්බන්ධව සෑම පැත්තෙන්ම අපට පැමිණිලි ලැබෙනවා. විහාරගම් හා දේවාලගම් පාලනය කරන අයත් ඒ අයගේ යම් යම් අඩුපාඩුකම් පෙන්වා දෙනවා. සමහර අවස්ථාවලදී ඒවායේ භාරකාරයන් එම ඉඩම් විකුණා මුදල් තමන්ගේ ප්‍රයෝජනයට ගන්නා බවත් අප දන්නවා. එම නිසා, කිසිම කොටසකට පාඩුවක් නොවන ආකාරයට, විහාරගම් හා දේවාලගම් ආදිය සම්බන්ධයෙන් අද තිබෙන දූෂණයන් මගහැරවීමට හැකි වන අන්දමේ වැඩ පිළිවෙළක් මේ පණතෙන්ම සකස් කළා නම් මීට වඩා සුදුසු යයි මා කල්පනා කරනවා.

ඉඩම්වල ගොවිතැන් කරන අයටම එම ඉඩම් පැවරිය යුතුය යන ප්‍රතිපත්තිය මේ ආණ්ඩුව පිළිගන්නවා නම්—මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් කීපදෙනකුම කීවාක් මෙන්—අද නින්දගම් හැටියට තිබෙන කැලෑ සියල්ලම සම්පූර්ණයෙන්ම ආණ්ඩුව සන්තක කර ගත යුතුයි. ඒවාගේම, නින්දගම්වල යම්යම් කොටස් වතු කොම්පැනිවලට පැවරී තිබේ නම් ඒවායේ අයිතියත් සම්පූර්ණයෙන්ම ආණ්ඩුව සන්තක කර ගත යුතුයි.

මේ පණත අනුව කටයුතු කිරීමට අලුතෙන් දෙපාර්තමේන්තුවක් හෝ මණ්ඩලයක් හෝ පිහිටුවා සැලකිය යුතු නිලධාරි පිරිසක් පත් කරගෙන වැඩ කරන්නට සිදු වනවා ඇති. ඒ සඳහා වර්ෂයක් පාසා විශාල මුදලක් වියදම් කරන්නටත් සිදු වනවා ඇති. එසේ වැඩ කරගෙන යාමේදී, යම් කෙනකු තම ඉඩම නිරවුල් කරගෙන එහි බුක්තිය සවි කරගෙන අයිතිය ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ විටක ඒ සඳහා දිස්ත්‍රික් උසාවියක එවැනි වැඩක් කිරීමට ගත වන තරම් කාලයක් ගත වනවාට කිසිම සැකයක් නැහැ. ඒ කාලය ඇතුළත, ඉල්ලුම් පත ඉදිරිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

කළ තැනැත්තාට නොයෙක් වියපැහැදම් දරන්නට සිදු වනවාටත් කිසිම සැකයක් නැහැ. එම නිසා, මෙයින් ප්‍රයෝජනයක් ලබා ගන්නට බලාපොරොත්තු වන තැනැත්තාට අඩු වියදමකින් එය කර ගන්නට පුළුවන් වන හැටියට, මේ ගැන සම්පූර්ණ වශයෙන් කල්පනා කර බලා නිසි ක්‍රමයක් සකස් කෙළේ නැත්නම් ගරු ඇමතිතුමා බලාපොරොත්තු වන පර මාර්ථය ඉෂ්ට නොවී මෙය අතර මග කඩා වැටෙන්නට ඉඩ තිබෙනවා.

ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පණත ක්‍රියාත්මක කරන කාලයේදී, ණයතුරුස් නිසා තම ඉඩම් අහිමි වුණු විශාල පිරිසක් ඔවුන්ගේ ඉඩම් නිරවුල් කර ගැනීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළා. එවැනි ඉල්ලුම් පත් පරීක්ෂා කර බලා ඒවා සම්බන්ධ නොයෙකුත් කරුණු විභාග කොට අවුල් නිරවුල් කිරීමට බොහෝ කාලයක් ගත වුණා. ඒ කාලය අතරතුර සමහර උදවිය ඒ වෙනුවෙන් බොහෝ වියපැහැදම් දැරුවා. එහෙත්, අවසානයේදී ඔවුන්ගේ අයිතිය සාර්ථක ලෙස ඔප්පු කර ගන්නට බැරි වීම නිසා බොහෝ දෙනකු අතරමං වුණා. මේ පණත ක්‍රියාත්මක කිරීමේදීත් බොහෝ දුරට පරිස්සම් වුණේ නැත්නම්, හරියාකාර කල්පනාකර බලා නිසි වැඩ පිළි වෙළවල් යෙදුවේ නැත්නම්, අසරණ මිනි සුන් බොහෝ වියදම් දරාගෙන අන්තිමේදී අතරමං වීමට ඉඩ තිබෙනවා. ඒවාගේම ආණ්ඩුව මේ සඳහා අලුත් සංවිධානයක් ඇති කොට ඒ වෙනුවෙන් වර්ෂයක් පාසා මුදල් වියදම් කරන්නට අදහස් කරතොත් එසේ වියදම් කරන මුදලෙන් නියම ප්‍රයෝ ජන ලබා ගන්නට නම් මේ ඉඩම් ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳෙන පිළිවෙළට නීති සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනව. එමනිසා මා ඉතා ඕනෑකමින් ගරු ඇමති තුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ පනත් කෙටුම්පත සම්බන්ධ යෙන් විරුද්ධ පාර්ශ්වයෙන් මේ දක්වා කරන ලද විවේචනය ඉතාමත්ම වැදගත් විවේචනයක්. ඇත්ත වශයෙන්ම මේ ආණ්ඩුව අවංකවම ඒ පැරණි රදළ නෂ්ටාව ශේෂයන් දුරු කරන්නට බලාපොරොත්තු වෙනවා නම් මේ පනත ඒ සඳහා ප්‍රමාණ වත් නොවන බව පිළිගන්නට ඕනෑ. මේ පනත දුර්වලයි. මේ පනතේ යම්කිසි සහිත ස්වභාවයක් තිබෙනවා. එමනිසා කරුණාකර මේ පනත් කෙටුම්පත අස් කරගෙන සම්පූර්ණ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්නට කටයුතු කරන මෙන් මා අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
තව නීති ගෙනෙනවා.

අ. භා. 4.37

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගරු කථානායකතුමනි, අද විවාදයට භාජන වී තිබෙන මේ නින්දගම් පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්නට පෙර ආණ්ඩුව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ කුමන පරමාර්ථයක් අරමුණු කොට ගෙනද යන්න සොයා බලන්නට අපට සිද්ධ වී තිබෙනවා. ඒ පරමාර්ථය ගැන කල්පනා කරන මට බලන්ගොඩ අතුරු මැතිවරණයට ප්‍රථමයෙන් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නට ආණ්ඩුවට තිබුණු හදිසිය හා කඩිනම කොපමණද කියා මතක් වෙනවා. බලන්ගොඩ අතුරු මැතිවරණයට ප්‍රථමයෙන් මේ පනත් කෙටුම්පත සම්බන්ධව ආණ්ඩුව ක්‍රියා කළේ කොහොමද? මේ පනත් කෙටුම්පත බොහොම කඩිනමින් ඉක්මණින් සහ හදි සියෙන් මහජන මන්ත්‍රී මණ්ඩලයට ඉදිරි පත් කර සම්මත කරවා ගැනීමට ආණ්ඩුව තැතක් දරණවා යන හැඟීම බලන්ගොඩ ජනතාව අතර ඇති කරවන්නට මේ ආණ්ඩුව මහන්සි ගත්තා. නමුත් බලන්ගොඩ අතුරු මැතිවරණයෙන් පසු මා සිතන හැටි යට අවුරුදු එකහමාරක් පමණ ගත වන තෙක් මේ ආණ්ඩුවට පුළුවන් වුණේ නැහැ මුලින් ඒ තරම් ඉක්මණක් හදිසි යක් කඩිනමක් දක්වා ඉදිරිපත් කළ මේ පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්නට. මේ පනත යටතේ යම්කිසි සහනයක් සෙතක් යහපතක් ලබා දෙන්නට බලාපො රොත්තුවූ ඒ පොදු ජනතාවට එම සහනය සලස්වා දෙන්නට අවුරුදු එකහමාරක් තිස්සේ මේ ආණ්ඩුවට පුළුවන් වුණේ නැහැ. එයින්ම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ පරමාර්ථය තේරුම් ගන් නට පුළුවනි. මේ පනත් කෙටුම්පත ඉදිරි

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

පත් කළේ බලන්ගොඩ අතුරු මැතිවරණය දිනා ගැනීමේ පරමාර්ථයෙනුයි. එසේ නම් මේ පනත් කෙටුම්පත බලන්ගොඩ අතුරු මැතිවරණය දිනා ගැනීමට කළ උපක්‍රමයක් විනා ඒ දුක්විඳින ජනතාවට යහපතක් සෙතත් ලබා දීමට ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක් නොවන බව දන් සක්සුදක්සේ පැහැදිළියි.

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)
(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)
මහජනතාව මුළා කිරීමක්.

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
ඒ අනුව බලන විට මේ ආණ්ඩුව ද්වේෂයෙන් උපක්‍රමකාරීව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළාය යන හැඟීම ඇති කර ගන්නට කරුණු තිබෙනවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ පරමාර්ථය පිරිසිදු නැහැ. මේ පනත් කෙටුම්පත සම්මත කරගෙන ක්‍රියාත්මක කළත් නින්දගම් ක්‍රමය යටතේ ඒ නින්දගම්වල වාසය කරන උදවියට නැත්නම් නිලකාරයින්ට කිසිම සහනයක් නොලැබෙනවාය යන්න අපට මේ ඇමති මණ්ඩලයට කෙලින්ම කියන්නට පුළුවනි. තවත් වැදගත් කාරණයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත පිළිබඳව ප්‍රජාතන්ත්‍රවාදය හරියාකාරව ක්‍රියාවේ යෙදී තිබෙනවා. මේ පනත් කෙටුම්පත පිළිබඳව මහජන මතය විමසා තිබෙනවා. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලයි බලන්ගොඩ ජනතාව ඉදිරියට ගොස් නින්දගම් ඉඩම් පිළිබඳව අප මෙවැනි පනතක් ක්‍රියාත්මක කරන්නට යනවාය, ඒ සඳහා ඔබලාගේ සහයෝගය දෙනවාද, නැද්ද කියා ඇසුවේ. ඒ අනුව බලන විට, ආණ්ඩුව කෙලින්ම මේ ප්‍රශ්නය මහජනතාව ඉදිරියේ තැබූ බව අපට පිළිගන්නට පුළුවනි. එසේ මහජනතාව ඉදිරියේ මේ පනත් කෙටුම්පත තබා, බලන්ගොඩ අතුරු මැතිවරණයේදී මේ පනත් කෙටුම්පත ප්‍රධාන කාරණයක් වශයෙන් මුල් කරගෙන කටයුතු කර එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයාට ජයග්‍රහණය කරන්නට බැරි වුණා නම්—එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා පරාජය වුණා නම්—එයින් තේරෙන්නේ පොදු ජනතාව මේ පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කළ බවයි. නමුත් ගරු ඇමතිතුමාට එය තේරුණාද නැද්ද කියා මා දන්නේ නැහැ. මොකක්ද මේකෙ තේරුම? මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයා තමායයිද, මහජනයාගේ ආරක්ෂකයා තමායයිද, සර්වජන ඡන්දය සහිත ප්‍රජාතන්ත්‍රවාදයේ පතාක යෝධයා තමායයිද ගරු අගමැතිතුමා කියනවා. ඒ ඔාගේම ගරු ඇමතිතුමාත් කියනවා. එහෙත් මේ සුළු පනතින්වත් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වෙලා තිබෙනවාද?

ප්‍රජාතන්ත්‍රවාදයට මේ රටේ නොයෙක් දේවල් සිද්ධ වෙලා තිබෙනවා. නොයෙක් විධියේ පයින් ගැසීම් සිදු වෙලා තිබෙනවා. ඒ නිසා, මහජනයා විසින් ප්‍රතික්ෂේප කරන ලද මෙවැනි පනතක් තමන් සතු වැඩි ඡන්ද ගණනකින් සම්මත කරවා ගැනීම සඳහා මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරන්නට මේ ආණ්ඩුවට යුතුකමක් තිබෙනවාදැයි ප්‍රශ්න කරන්නට කැමතියි. එවැන්නක් කරන්නට තරම් විළිලජ්ජා නැතිකමක් තිබීමයි මෙහි ඇති පුදුමය. මේ රජයේ විළිලජ්ජා නැතිකම මහ මුදලිකමටත් වඩා ලොකුයි කියන්නට පුළුවනි. මහ මුදලිකමට නොවෙ, මහ ඇමතිකමටත් ලොකුයි කියා එය වෙනස් කරන්නට ඕනෑ. මහ ඇමතිකමද, එසේ නැතිව ඉඩම් ඇමතිකමදැයි කියන්නට දන්නේ නැහැ. යම් විධියකින් ඉඩම් ඇමති ධුරය මේ අවස්ථාවේ දරන නැනැත්තා මා නම්, සත්තකින්ම මා මෙය ඉල්ලා අස්කර ගන්නවා.

එපමණක් නොවෙයි, ගරු ඇමතිතුමා මේ පනත ඉදිරිපත් කරද්දී කළ කථාව ගැනත් මා කනගාටු වෙනවා. ගරු ඇමතිතුමා වෙත මොන මොන අඩුපාඩුකම් තිබුණත් එතුමා මහාත්ම ගුණ තිබෙන කෙනෙකැයි අප විශ්වාස කළා. එහෙත් මේ පනත ඉදිරිපත් කරමින් එතුමා කළ කථාව නිසා අපට දැන් සිද්ධ වී තිබෙන්නේ එතුමා ඒ තත්ත්වයෙනුත් අස් කරන්නටයි. හැම අවස්ථාවකදීම පාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

එතුමාට අපේ ගෞරවය ලැබුණා. එතුමාට හැම විටම අප ගරු කළා. රාජකාරි අංශයෙන්, ඇමති ධුරයේ තත්ත්වයෙන්, යනාදි නොයෙක් කරුණු ගැන සලකා, කොයි තරම් අඩුපාඩුකම් තිබුණත් ඒවා ගැන නොසලකා, හොඳ ගතිපැවතුම් ඇති මහත්මයෙකුයි සලකා එතුමාට සැලකූ අපට කොයි හැටි වෙතත් මේ පනත ගැන කළ කථාවේ හැටියට නම් එහෙම කෙනෙකැයි පිළිගන්නටත් බැහැ. ඔය පැත්තට ගියාට පස්සේ ඒ විධියට වෙනස් වීම ස්වභාවයක් වෙන්නට ඇති. එතුමා සඳහන් කළ ඇතැම් කරුණු සොයා ගත්තේ කොහෙන්දැයි අහන්නට අපට සිදු වුණා. ඒවා කියන්නට ලැස්ති නැහැ. සබරගමු පළාතේ කච්චේරියෙන්ද කොහේද්දෝ ලබාගෙන තිබෙනවාය කියනවා.

1968 පෙබරවාරි මාසයේ 25 වැනි ඉරිදා හැන්සාඩ් වාර්තාවේ 1221 වන තීරයේ සඳහන් වන කථාවෙන් කොටසක් දැන් මම කියවන්නම්. ඉංග්‍රීසියෙන් එය තිබෙන නිසා මම එය ඒ විධියටම කියවන්නම්. මෙන්න එය:

"Accordingly I will attempt briefly to place in historical perspective the development of the Nindagam System to show why this system is untenable in a modern democracy and also to illustrate how the release of this land from the encumbrance of service and settlement of same on the present holders will result in removing for ever"——

වැදගත්ම එක මෙන්න මේකයි:

—"a social stigma."

මොකක්ද ඒක? ඒක දැන් ඉවත් වෙලා තිබෙනවාදැයි අහන්නට කැමතියි. ඒක මම හොයන්නම්:

——"attached to tenancy of Nindagam land and, more important, why it is reasonable to assume that the settlement of this land on the present tenants will generate an enthusiasm for the proper utilization and development of this land wealth."

අන්තිම වචන දෙක නැවතත් කියන්නම්. "land wealth"; ඒ කියන්නේ ඉඩම් වස්තුව. අපේ ඉඩම් සම්පත්වල ආරක්ෂකයා තමයි ගරු ඉඩම් ඇමතිවරයා. එතුමා පාවිච්චි කළ වචනවලට නම් මාත් කැමතියි. කොයි තරම් අඩුපාඩුකම් තිබුණත් එතුමාට මේ කාරණය අවබෝධ වී තිබීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ කොටසත් කියවන්නට ඕනෑ:

—"an enthusiasm for the proper utilization and development of this land wealth."

ඒකත් එතුමාට තේරුම් ගොස් තිබෙනවා. මෙය සීමා වී තිබෙන්නේ වචනවලට පමණක්දැයි දන්නේ නැහැ. එතුමාගේ අදහස් ඒ විධියට ක්‍රියාත්මක වී තිබෙනවාදැයි මහජනයාගේ ඉඩම්වල ආරක්ෂකයා හැටියට ඉන්න ඇමතිතුමාගෙන් අහන්නට ඕනෑ. එදා තිබුණු නින්දගම් ක්‍රමය නරකය කියන්නට මහන්සි ගන්නවා නම් එහි තිබෙන අඩුපාඩුකම් නැති කර, ඒ ක්‍රමයෙන් යම් හානියක් නිලකාරයන්ට තිබුණා නම්, හිරිහැරයක් තිබුණා නම්, ඒවා තිබුණේ කොහේදැයි සොයන්නටත් බලන්නටත් ඕනෑ. ගම්බාරයාගෙන් නිලකාරයාට තිබුණු අපහසුව කොතැනදැයි අප සොයා බලන්න ඕනෑ. නිලකාරයන්ට තිබුණු අපහසුකම් මේවායයි මේ පනත ඉදිරිපත් කළ ගරු ඉඩම් ඇමතිතුමා සොයා තිබෙනවාද කියායි අපට දැනගන්ට වුවමනා කරන්නෙ.

ගරු කථානායකතුමනි, පුත්තලම් දිස්ත්‍රික්කයේ නිසා ඔබතුමාත් අනුමත කරනවා ඇති, සත් කෝරළයේත්, උතුරු-මැද පළාතෙත්, රජයේ ඉඩම් තිබෙන වෙනත් නොයෙක් පළාත්වලත්, එදා පැවතුණේ නින්දගම් ක්‍රමයයි කියන අදහස බව. එහෙත් නින්දගම් ක්‍රමයෙන් නිලකාරයාට එතරම් හිරිහැරයක් තිබුණා යයි ඔප්පු කිරීමට අපට කරුණු සොයා ගන්න අමාරුයි. අද තිබෙන්නෙ ඊට වඩා වෙනස් ක්‍රමයක්. නින්දගම් ක්‍රමය වෙනුවට අද තිබෙනව, ඊට වඩා වෙනස් භයානක ක්‍රමයක්. එනම්, විශේෂ බදු මණ්ඩල ක්‍රමයයි. එදා නින්දගම් ක්‍රමයයි අද බදු විශේෂ මණ්ඩල ක්‍රමයයි අරගෙන වෙන වෙනම විග්‍රහ කර බැලූවොත්, මේ දෙකින් වඩා භයානක ක්‍රමක්දැයි තමුන්නාන්සේට පැහැදිලි වෙයි.

නින්දගම් ගැන නොයෙක් විධියේ අදහස් ප්‍රකාශ කරනව. මා දැන් ස්වල්ප වේලාවකට කලින් කියවන්ට යෙදුණු, ඉඩම් ඇමතිතුමාගේ ඉංග්‍රීසි කථාවේන්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

උපුටා ගත් කොටසෙ සාමාන්‍ය අදහස මේකයි : මේ නින්දගම් ක්‍රමය සමාජයට කැලලක් බව එතුමා කියනව. මේ කැලල මොකක්දැයි එතුමා දන්නවාදැයි මා දන්නෙ නැහැ. එතුමාගේ පිළිතුරු කථාවේදී නින්දගම් ක්‍රමය නිසා සමාජයට වන කැලල කුමක්දැයි පැහැදිලි කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනව.

—" a stigma attached to tenancy of Nindagam land and, more important, why it is reasonable to assume that the settlement of this land on the present tenants will generate an enthusiasm for the proper utilization "——

එතුමා කියන අනික් කාරණය නම් මේ ඉඩම් කොටස් හරියාකාර පාවිච්චි කිරීමට මෙසේ කළ යුතු බවයි. හොඳයි, මේ ඉඩම් හරියාකාර පාලනය නොවෙනවා යයි කියන්ට එතුමාට කොයිතරම් දුරට කරුණු ඉදිරිපත් කරන්ට පුළුවන්ද? ඒ අනුව එතුමාට කියන්ට පුළුවන්ද, අසුවල් අසුවල් ප්‍රදේශවල අසුවල් අසුවල් උදවියට අයිති නින්දගම් වලින් අද හරියාකාර ප්‍රයෝජන ගන්නෙ නැත; එම නිසා ඒ ඉඩම්වලින් ප්‍රයෝජන ගැනීම සඳහා මම මෙන්න මේ පනත ක්‍රියාවේ යොදවනවා කියා? ඇමති තුමාට එහෙම කියන්ට පුළුවන් කමක් නැහැ. කියන්නට කැමති නැද්දැයි මා දන්නෙ නැහැ.

එතුමා මේ විධියේ දෙයකුත් කිව්ව :

" In the earliest days most of the land was probably held by village communities "......

එහෙම දිගට කියාගෙන ගිහින් එතුමාට කියන්ට ඕනෑ කළේ මොකක් ද? ඉඩම් ඇමතිතුමා එසේ කියාගෙන යන අවස්ථාවේදී මම නමුන්නාන්සේගේ අවසරය ඇතුව රීති ප්‍රශ්නයක් නගල ඇහැව්ව, ඔය කියවන්නෙ මොන පොතෙන්ද කියා. කරුණා කරල මටත් බලාගන්න පොතේ නම කියන ලෙස මා ඉල්ලා සිටිය. පොතේ නම එතුමා කිව්වෙ නැහැ. එතුමා කිව්ව, සබරගමුවේ සන්නස් පිටපත් ආදියෙන් ඒ කරුණු ලබාගත්තා කියා. හොඳයි. ඒවායේ පිටපතුත් මම ගෙනැවින් තිබෙනව. මම ඒව පසුව කියවන්නම්. ඒ කරුණු ගත්තෙ සබරගමුවෙ මොන සන්නසෙන්දැයි කිව්වොත් ඒ ගැන සොයල බලල ඉඩම් ඇමතිතුමා කිව්වෙ සත්‍යයක්ද, අසත්‍යයක්දැයි තෝරා බේරා ගන්න පුළුවනි.

එතුමාට කියන්ට ඕනෑ කළේ මේකයි :

" The grants of land by the king in this capacity of paramount owner of the soil, or by any other authority under his orders, "——

දැන් ඉඩම් ඇමතිතුමා වගේ

—" to private individuals and officials, "

පෞද්ගලික අයටත්, රජයේ නිල දරන්නන්ටත්, රජය වෙනුවෙන් පොදු මහජන සේවාවල යෙදී සිටි අයටත්, පෞද්ගලික සේවයටත්, යුද හමුදා සේවයටත්, සාහිත්‍ය සේවයටත් නින්දගම් දීල තිබෙන බව කිව්ව. එය හරියි කියා පිළිගන්නම්. ඊළඟට මෙහෙම කියනවා :

" කොළඹ යුද්ධයේදී විශිෂ්ඨ සේවයක් කළ නිසා ස්වාමීන් වහන්සේ නමකට නින්දගමක් දී තිබෙනවා............ "

යුද්ධ කාලයේදී විශිෂ්ඨ සේවාවක් කළ නිසා තමයි, ඒ නින්දගම දී තිබෙන්නේ. මොකක්ද ඒ විශිෂ්ඨ සේවය? ඒක විග්‍රහ කරන්නට ඕනෑ. " ඒක අපි දන්නේ නම් නැහැ; දැනගන්නට වුවමනා නම් අසුවල් පොතේ අසුවල් පිටුව බලන්න " යැයි නමුන්නාන්සේ කිව්වොත් අපි ඒ අනුව ගිහින් බලන්නම්. නින්දගම් ක්‍රමය ක්‍රියාවේ යෙදවීමේදී දුප්පත් පොදු මහජනතාවට, ගම්වාසීන්ට යම්කිසි කරදරයක් හිරිහැරයක් සිදු වෙනවා නම් අපි ඒ ක්‍රමය ක්‍රියාවේ යොදවනවාට විරුද්ධයි. ගමක සිටින වැසියකුට සුළු වශයෙන් හෝ කරදරයක් සිදු වෙනවා නම් අපි ඊට හාත්පසින්ම විරුද්ධයි. ඒ ඒ පලාත්වාසීන් හෝ නින්දගම් නිලකාරයන් හෝ වැටී තිබෙන දුකින් ඔවුන් මුදාවා ගැනීම පිණිස නම් ඇමතිතුමාට අපගේ සම්පූර්ණ සහයෝගය දෙන්නට කැමතියි. එහෙත් මෙයින් කෙරෙන්නේ එය නොවෙයි. නිලකාරයන්ට තිබෙන අපහසුකම් මොනවාද? මා ඔවුන්ගේ තත්ත්වය පසුව කියන්නම්. කෙසේවෙතත් එතුමාට ප්‍රකාශ කරන්නට වුවමනා වී තිබෙන්නේ, ඕනෑම කුපාඩිකමක් කළාම නින්දගමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

දී තිබෙනවාය යන්නයි. එදා එහෙම දීලා නැහැ. දැන් නම් ඒ වැඩේ වෙනවා. එදා තිබුණේ නින්දගම් ක්‍රමයක්. අද තිබෙන්නේ විශෙෂ බදු මණ්ඩල ක්‍රමයක්. අද තිබෙන විශෙෂ බදු මණ්ඩල ක්‍රමය උඩ නම් ඕනෑම කුපාඩිකමක් කළ මිනිහෙකුට ඉඩම් ලැබෙනවා. එදා විශිෂ්ඨ සේවයක් කළ නිසා නින්දගමක් දුන්නා. අද මේ ආණ්ඩුවට කුපාඩිකමක් කරලා දුන්නාම විශෙෂ බදු මණ්ඩලය යටතේ නින්දගමක් ලැබෙනවා. ඔකයි, අද පවතින තත්ත්වය. එතුමා කිව්වා, එදා මුවකු ගෙනැවිත් දුන් නිසා නින්දගමක් දුන්නාය කියා. ඒකේ ඇති වරද මොකක්ද? කොහේද ඕක පළවෙලා තියෙන්නේ? කාටද මුවකු ගෙනැවිත් දුන්නේ? කුමන කාරණයක් උදෙසාද ඒ මුවා ඇල්ලුවේ? කන්ද උඩරට ප්‍රදේශයේ සිංහලයන් කුපාඩිකම් කරලා නින්දගම් ලබා ගත්තාය යන්න ප්‍රකාශ කරන්නට එතුමාගේ කතාවේදී සුළු වශයෙන් හෝ උත්සාහයක් ගත්තා නම් අප එම මතයට සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම එහෙම කිසිවක් කිව්වේ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
අපි ඒක පිළිගනිමු. [බාධා කිරීම්]

එතුමා මෙසේ කියා තිබෙනවා:

"..........රජ මැදුරට පණ පිටින් සුදු මුවකු ගෙනැවිත් දුන් නිසා පව කෙනෙකුට නින්දගමක් දී තිබෙනවා.*........"

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒ සේරම ඇත්තයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
මොකටද මේ සුදු මුවා ගෙනාවේ? ඇයි ඒක නොසොයන්නේ? අපි ඒක තර්ක කරමු. මා කියනවා මේ මුවා [illegible] මුවන් අල්ලන්නට දන්නා දක්ෂයකු විසිනැයි කියා; දඩයම ගැන හොඳින් දන්නා කෙනෙකැයි කියා. ඔහු දිවීමේ ශක්තිය පෙන්වීම පිණිස මුවකු අල්ලා ගෙනැවිත් දුන්නා වෙන්නට පුළුවනි. අදත් සරඹ ක්‍රීඩාවලින්, දිවීමේ තරඟවලින් එහෙම ජයග්‍රහණය කරන අයට හොඳ තෑගි දෙන බව අප දන්නවා; කුසලාන දෙන බව අප දන්නවා. ඒ නැනැත්තාත් එවැනි දක්ෂකමක් තර තිබෙන නිසා නින්දගමක් දෙන්න ඇති. ඒකේ වරදක් තිබෙනවාද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
වැරදියි කියන්නේ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
එසේ කියනවා නම් අපි පිළිගන්නවා. එතැනින් එහාට යන්නට වුවමනා කරන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මා කිව්වේ වෙච්ච දේ විතරයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
එවිට තමුන්නාන්සේගේ හිතේ තිබුණු දේ පැහැදිලි වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මගේ හිතේ තිබෙන දේ තමුන්නාන්සේ දන්නවාද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
තමුන්නාන්සේගේ වචනවලින් ඒක තේරෙනවා. එතුමාගේ වචන කියවන කෙනෙකුට එතුමාගේ අදහස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තේරෙනවා ඇති. මා දන්නේ නැහැ. හිතේ මොනවා තිබෙනවාද කියන්න. එතුමා තවදුරටත් කියා තිබෙන කරුණු මගේ අදහස් සනාථ කිරීම සඳහා මා ඉදිරිපත් කරන්නට කැමතියි. එතුමා මෙසේ කියා තිබෙනව :

"............කොළඹ යුද්ධයේදී විශිෂ්ඨ සේවයක් කළ නිසා ස්වාමීන් වහන්සේ නමකට නින්ද ගමක් දී තිබෙනවා. රජ මැදුරට පණ පිටින් සුදු මුවකු ගෙනැවිත් දුන් නිසා නව කෙනකුට නින්දගමක් දී තිබෙනවා. එක්තරා විහාරයක බුදු රජාණන් වහන්සේගේ පින්තූරයක් ඇන්ද නිසා එක් සිත්තරකුට නින්දගමක් දී තිබෙනවා. මැදුම් සඟිය ගැන සිංහලෙන් පොතක් ලිවීම නිසා නව කෙනෙකුට නින්දගමක් දී තිබෙනවා."

එහෙම කෙනෙකුට නින්දගම් එකක් නොවෙයි, මුළු ලංකාවම දුන්නත් වරදක් නැහැ. ඒ වගේ පොතක් ලියපු කෙනෙකුට ඒ විධියට දුන්නාට කමක් නැහැ.

"රජතුමාගේ අඩුක්කුව හොඳට සැපයූ නිසා නව කෙනෙකුට නින්දගමක් දී තිබෙනවා. පුවක් වෙළඳාම දියුණු කළ නිසා නව කෙනෙකුට නින්ද ගමක් දී තිබෙනවා."

පුවක් වෙළඳාම දියුණු කළ නිසාත් නින්දගම් දී තිබෙනවා. තමුන්නාන්සේලාත් මේ රටේ ගොවිතැන දියුණු කරන අයට සෙනෙට් මන්ත්‍රී ධුරයක්වත් ලබා දෙනවාද ? තිලකරත්න සෙනෙට් මන්ත්‍රීතුමාගේ මරණයෙන් පසු ඇති වූ පුරප්පාඩුවට ගොවියෙකු පත් කරන්නය කියා මහජනයා ඉල්ලා සිටියා. අනුරාධපුරයේ අනඳහාමි ගොවි මහතා සෙනෙට් මන්ත්‍රීවරයෙකු කරන ලෙස ඒ දවස්වල ඉල්ලා සිටියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නැකැත් වෙලාව පැමිණියාම දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඇයි, එන්. එම්. අප්පුහාමි පත් කර සිටින්නෙ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගරු කථානායකතුමනි, මේකයි කාරණය.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා එයට පිළිතුරු දෙන්නම්. හොඳට ගොවිතැන් කරන අයගෙන් ගොවි රජකු තෝරා ඔහුට ඉඩම් දීමට ආණ්ඩුව නියම කර තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කැකිරාවේ මන්ත්‍රීතුමා හොඳට ගොවිතැන් කටයුතු කරන නිසා එතුමාට රජකමක් දෙන්න ඕනෑ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

මා කියන්නේ මෙයයි. උතුරු-මැද පළාතේ ගොවි ජනතාව වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරු එදා කිව්වා, උත්තර මන්ත්‍රී තනතුරක් ගොවියෙකුට ලබා දෙන්නය කියා. නමුත් තමුන්නාන්සේලා එය කළේ නැහැ.

පුවක් වෙළඳාම දියුණු කිරීම නිසා නින්දගම් ලබා දුන්නාලු. එහි කිසිම වරදක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

වරදක් තිබෙනවාය කියා අපි කිව්වේ නැහැ නේ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඇමතිතුමාගේ කථාවේ මේ විධියටත් දැක්වෙනවා :

"අනවලයා නමැත්තා හිස ලස්සනට ගසා දමූ නිසා නව කෙනෙකුට නින්දගමක් දී තිබෙනවා."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

කව්ද මේ අතවලයා ? ගරු කථානායකතුමනි, උඩරට ප්‍රදේශවල මේ නින්දගම් හිමියන් කවුරු හෝ වේවා, ඔවුන්ට මේ නින්දගම් ලැබී තිබෙන ක්‍රමය පැහැදිලි කරන්න ඕනෑ. ඔවුන්ට නින්දගම් ලැබී තිබෙන්නේ යම්කිසි සේවයක් ඉටු කිරීම නිසා බව පැහැදිලි කරන්න ඕනෑ.

මේ පනත අපට තේරුම් ගන්න අමාරුයි. මොකක්ද මේ පනතේ පරමාර්ථය ? එතුමාගේ කථාවේ හැටියට නම්, මේ පනතේ පරමාර්ථය ඉඩමේ නියම වටිනාකම සොයා ගැනීමයි. නමුත් මා කියන්න කැමතියි, මේ පනත ඉදිරිපත් කර තිබෙන්නේ උපක්‍රමකාරීවය කියා. මෙහි පරාමර්ථය ඉඩමේ නියම වටිනාකම සොයා ගැනීම නොවෙයි. " .... For the proper utilization and development of this land wealth. " පරමාර්ථය මෙය නොවෙයි. අතුරු මැතිවරණයෙන් කෙසේ හෝ දිනා ගැනීමයි පරමාර්ථය වූයේ. කෙසේ වෙතත් ඒ පරමාර්ථය හරි ගියේ නැහැ.

මේ නින්දගම් ක්‍රමයය කියන්නේ මොකක්ද කියා අපි සොයා බලමු. අද ඒ ගැන හුඟක් කරුණු සොයා ගැනීම අමාරුයි. ඒ මන්ද ? ඒ ගැන බොහෝ දුරට කරුණු පරීක්ෂා කර බලන්නේ නැහැ ; සොයා බලන්නේ නැහැ. මේ නින්දගම් ක්‍රමය සමහර අය හඳුන්වන්නේ රදල ක්‍රමය නැත්නම් පුංචි මිනිහා ගසා කෑමේ ක්‍රමය වශයෙනුයි. ඒ නිසා මේ නින්දගම් ක්‍රමය කියන්නේ මොකක්ද කියා සොයන්න නම්, සමාජය ඇතුළට යොමු කරවන ලද ඇහැකින් ඒ දෙස බලන්න ඕනෑ. මේ ක්‍රමය හොඳද නරකද කියා විග්‍රහ කරන්න ඕනෑ එසේ බැලීමෙනුයි.

ගරු කථානායකතුමනි, මේ ගැන සිංහලෙන් ලියැවී තිබෙන පොත් සොයා ගැනීම බොහොම අමාරුයි. අපි ඒ ගැන කනගාටු වෙනවා. පොත් නැතිවා නොවෙයි. ඒ පොත් සොයා ගැනීමට ටිකක් වෙලාව ගත වෙනවා. සිංහල පොත් සොයා ගැනීම අමාරුයි. භාෂාවේ අඩුපාඩුවක් නිසා නොවෙයි. අද පුස්තකාලයකට ගොස් බැලූ විට එහි මුල් තැනක් දී තිබෙන්නේ ඉංග්‍රීසි පොත්වලට බව තමුන්නාන්සේ ලාත් දන්නවා ඇති. අපට මේ සිංහල පොතක් සොයා ගන්න නම් ඒ සඳහා දවස් ගණනක් ගත කරන්න වෙනවා. පුස්තකාලයට, ලේඛනාගාරයට එහෙම නැත්නම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි තැනකට ගොස් පොත් සොයා බලන්න දවස් කිහිපයක්ම ගත වෙනවා. ඒ නිසා ඒ සඳහා වෙලාවක් ඇත්තේ නැහැ.

හදිසියට ලබා ගන්නේ ලෙහෙසියෙන් ලබා ගන්න පුළුවන් එකයි. කොහොම හරි වැඩේ කර ගන්නත් ඕනෑ. හදිසියට කරන දේවලින් ඒ තරම් හොඳ ප්‍රතිඵල ලබා ගන්නත් බැහැ. කෙසේ වෙතත් ගරු කථානායකතුමනි, මට පොතක් හම්බ වුණා. එහි නම සිංහල සමාජ සංවිධානය යනුයි : Sinhalese Social Organization —Ralph Pieris. එය ලියා තිබෙන්නේ රැල්ෆ් පීරිස් නමැත්තා විසිනුයි. එහි 63 වෙනි පිටුවේ නින්දගම් ගැන මෙන්න මේ විධියට කියවෙනවා. මෙය බොහොම ප්‍රයෝජනවත්. ඒ නිසා මේ කොටස කියවීම ගැන තමුන්නාන්සේ මට සමා වෙනවා ඇතැයි මා සිතනවා. දොස් තිබෙන තැන සොයා ඒ දෝෂයට බෙහෙත් දෙනවා මිස නැති ලෙඩකට බෙහෙත් දීමේ ඇති පලේ කුමක්ද ? එම පොතේ 65 වන පිටුවේ රැල්ෆ් පීරිස් මහත්මයා මෙන්න මෙහෙම කියා තිබෙනවා ; එය ඉංගිරිසියෙන් තිබෙන්නේ :

"Although nindagam 'tenants' were described as *nilakarayo*, and their holdings *nilapangu*, these *nilakarayo* became highly differentiated in the Kandyan times. In order to ascertain the nature of their tenure, it is necessary to consider two difficult questions : the permanency of nindagam holdings, and the nature of the services rendered to the lord of the village. In certain cases, *nilapangu* were held on a *maruvena* (changing) or *saramaru* (temporary) tenure— "

සැරමාරු කියන්නේ ඉක්මනට මාරු වීමයි.

"—on condition of cultivating the lord's *muttettuva* and performing other menial services.— "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙන්න මේකයි වැදගත්. ඇමතිතුමාට මා තහවුරු කර දෙන්න අදහස් කරන්නේ මේකයි. එනම් the stigma in society ගැනයි.

"—The relationship could be terminated at the instance of either party. Such a *nilakaraya* was liable to be called upon to give up his holding on the annual rent-day of the estate, or at any time if he failed to perform his services.— "

At any time if he failed to perform his services.

"—On the other hand, the *nilakaraya* could quit service by tilling his allotment of the *muttettuva* once, repairing the bunds of the fields, and planting a *malpala* or bunch of flowers in token of the ground having been prepared for the ensuing season. His obligations thus concluded, he was free to leave the estate.— "

He was free to leave the estate.

"—But it often happened that these servants, though liable to dismissal,— "

ගරු ඉඩම් ඇමතිතුමා මේක පිළිගන්නවාද ?

Though liable to dismissal.

"—were seldom evicted, having acquired, as it were, a birth-right by long residence and possession, and being content to perform the customary services to the lord."

මෙහි වැදගත් එකක් තිබෙනවා. මෙන්න මේක ඔබතුමා පිළිගන්නවා ඇති.

"But it often happened that these servants, though liable to dismissal, were seldom evicted, having acquired, as it were, a birth-right by long residence and possession, and being content— "

කෑකිරාවේ ගරු මන්ත්‍රීතුමාට නම් හොඳට තේරෙනවා. එතුමා මෙය සම්පූර්ණයෙන් පිළිගන්නවා ඇති.

"—to perform the customary services to the lord."

රැල්ෆ්ප් මහතාගේ ඒ විග්‍රහයෙන් පෙන්නුම් කර තිබෙන්නේ නින්දගමේ සිටින නිලකාරයත් නින්දගම අයිති ගම්භාරයත් යන දෙදෙනා අතර තිබුණු සම්බන්ධකම බොහෝම වැදගත් බවයි. ඒ දෙදෙනා අතර අන්‍යොන්‍ය සම්බන්ධකමක් තිබිලා තිබෙනවා. මා කියැවූ ඒ ඡේදයේ "being content" කියා තිබෙනවා. එතකොට නිලකාරයා ගම්භාරයා පිළිබඳව සෑහීමට පත් වී සන්තෝෂයෙන් සහ භක්තියෙන් යුක්තවයි ඒ සේවය කර තියෙන්නේ. අද කොයි තරම් දුරට ඒ භක්තිය තිබෙනවාද? තමන්ගේ ස්වාමියා කෙරෙහි භක්තියකින් ක්‍රියා කරන ඇත්තන් අද අපේ රටේ ඉන්නවාද? එතකොට ඒ සමාජ පිළිලය තිබෙන්නේ අදයි; එදා තිබී නැහැ. එදා නිලකාරයාගෙන් යම්කිසි සේවාවක් බලාපොරොත්තු වුණා නම් ඒ සේවය හරියාකාර ඉෂ්ට වුණා. ඒ වෙලාවේදී ඔවුන් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවක් සමාජයට පෙන්නුවා. ගම්භාරයා, නිලකාරයා කෙරෙහි විශ්වාසයක් ඇති කරගෙන තිබුණා. එමෙන්ම ගම්භාරයා කෙරෙහිත් නිලකාරයා විශ්වාසයක් ඇති කරගෙන තිබුණා. ඔවුන් අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් තිබුණා. මා කියවූ ඡේදයෙන් පෙන්වා දෙන්නේ මේ දෙදෙනාගෙන් ඕනෑ කෙනෙකුට තම කැමැත්ත උඩ ඕනෑ වෙලාවක නිලපංගුව අයින් කරන්නට, නිලපංගුවෙන් අයින් වන්නට, පුළුවන්කම තිබුණාය කියන එකයි. නියරවල වැඩ නිම වුණාට පසුව ඕනෑ නම් නිලකාරයාට අයින් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් හැවට පසුව ගම්භාරයාට බාරදී අයින් වෙන්න පුළුවන්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කුඹුර හාලා දමා යන නැත්තා පිස්සෙක්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

මා කියන්නේ මේකයි: කුඹුර හාලා බාර දී යන්නට නිලකාරයාට ඕනෑ අවසථාවක පුළුවන්කම තිබුණා. එමෙන්ම නිලකාරයාට අත්හැර යන්න පුළුවන්කම තිබුණු තවත් අවස්ථාවක් තමයි නියරවල වැඩ කළාට පසුව. මල් පැල හදලත් නිල පංගුව බාරදී අයින් වන්නට පුළුවන්කම තිබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

අවස්ථා කොපමණ තිබුණත් ගම්භාරයාගෙන් කරදරයක් ඇති නොවුණු නිසා කිසිම අවස්ථාවක නිල පංගුව ගම්භාරයාට භාරදෙන්නට නිලකාරයා ලැහැස්ති වී නැහැ. ගරු ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා ගම්භාරයාට ලැබෙන්නේ 1/10 යි කියා. ඒ විධියට දහයෙන් පංගුව දී තිබෙන්නේ මොන නින්දගමේද කියා කරුණාකර කියන්න. උඩරට ගම්වල සිටින අය කුපාඩිකම් කර නින්දගම් ගත් අය හැටියට ගරු ඇමතිතුමා සිතාගෙන සිටින බවක් එතුමාගේ කථාවෙන් පෙනී ගියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මා එහෙම කිව්වේ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ගරු ඇමතිතුමාගේ අදහස කුමක්ද කියන එක එතුමාගේ කථාවත් මගේ කථාවත් සංසන්දනය කර කියවා බලන කෙනෙකුට පෙනී යාවි. තමන්ගේ හිතේ තිබෙන දේ අවංකව කියන්නට තරම් ශක්තියක් ගරු ඇමතිතුමාට නැත්නම් එයින් එතුමාගේ තත්ත්වය තවත් පහත වැටෙනවා. ගරු ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා නිල කාරයාගෙන් ගම්භාරයාට ලැබෙන්නේ දහයෙන් එකයි කියා. එවැනි තත්ත්වයක් තිබෙන්නේ කොහේද කියා කරුණාකර කියන්න. එතුමාගේ කථාවේදී එතුමා මෙන්න මෙහෙම කියනවා :

"Chenas attached to the *muttettu* were cultivated by the *nilakarayas* who gave the *othu* or ground share, generally 1/10th of the crop, to the proprietor. *Maruwena pangu* means the allotment or share of land in a *gama* held by one or more *nilakarayas* at the will of the overlord."
—[OFFICIAL REPORT, 25th February 1968; Vol. 77, c. 1225.]

මෙවැනි තත්ත්වයක් තිබෙන්නේ කොහේද? කරුණාකර පෙන්වන්න. නිලකාරයා ගම්භාරයාට 1/10 ක් දී තිබෙන තැන කරුණාකර පෙන්වන්න. ගරු කථානායකතුමනි, මේ පනත ද්වේශ සහගතව ඉදිරිපත් කළ එකක්ද, උපක්‍රමකාරීව ඉදිරිපත් කළ එකක්ද, එසේ නැතිව මෙය යම් දුකකට පත් වී සිටින පිරිසක් එයින් මුදවා ගැනීමට ගත් පියවරක්ද යන්න ගැන කල්පනා කරන විට අපට පෙනී යන්නේ මෙය ඉදිරිපත් කර තිබෙන්නේ ද්වේශසහගතව තවත් කෙනෙකුට පහර ගැසීමේ අදහසින් බවයි; උපක්‍රමකාරීව තමන්ට බලය ප්‍රවරා ගැනීමේ ක්‍රියා මාර්ගයක් වශයෙන් බවයි. මේ නින්දගම් ක්‍රමය හරියාකාරව ක්‍රියාවේ යෙදෙන අවස්ථාවලදී ගම්භාරයත් නිල කාරයාත් අතර තිබෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාවය සුහදයි, හොඳයි. එය යහපත් එකක්. එහෙත් නරක පුද්ගලයිනුත් සිටින්නට ඇති. අයුක්තිසහගතව ක්‍රියා කරන පුද්ගලයින් සිටින්නටත් ඇති. ඒ අය හිතුවක්කාරකම් කරන්නත් ඇති. එහෙත් මෙතන තිබෙන ප්‍රශ්නය එවැනි අයගෙන් බේරීමට නිලකාරයින්ට හැමවිටම අවස්ථාව තිබුණාද නැද්ද කියන එකයි. ඒ අවස්ථාව නිලකාරයින්ට තිබුණාය කියා මා කියනවා. මේ නින්දගම් පිළිබඳව කරුණු සොයා ගන්නට ඕනෑ කාගෙන්ද කියා කාගෙන් ඇසුවත් කියාවි ඒ ගැන සොයාගන්නට පුළුවන් රල්ෆ් පීරිස් මහත්මයාගෙන්ය කියා. ඒ මහත්මයා නින්දගම් ක්‍රමය කොයි අන්දමද කියා සමාජය තුළින් සෙව්වා. සමාජයේ ජීවත් වන අයට පිළිලයක් වී තිබුණාද, කැලලක් හැටියට තිබුණාද, කියා නිදොස් ඇසකින් බැලුවා. කන්නාඩියක් තුළින් නොවෙයි බැලුවේ, නිදොස් ඇසකිනුයි බැලුවේ. නිදොස් ඇසකින් බැලූ අපක්ෂපාති පුද්ගලයන්ට පෙනී ගියා මෙම නින්දගම් ක්‍රමයෙහි එදා තිබුණු යහපත් භාවය ගැන.

මේ අවස්ථාවේදී මා කියවන්න කැමතියි, නින්දගම් ක්‍රමය සම්බන්ධයෙන් එදා තිබුණු සන්නසක් ගැන. "සපරගමුවේ පැරණි ලියවිලි" නමැති පොතේ දොළොස් වන පිටුවේ දැක්වෙන අන්දමට සන්නස් ගැන කරුණු ටිකක් දක්වන්න කැමතියි. මෙහි වැලිවිට සන්නස ගැන විස්තරයක් කර තිබෙනවා. "සපරගමුවේ පැරණි ලියවිලි" නමැති මෙම පොත පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල ස්ථවිරයන් වහන්සේ විසින් ලියා තිබෙනවා. ශ්‍රී පාදය නැඹීම පිළිබඳව තඹ සන්නසෙහි ඉතා ලක්ෂණට විස්තරයක් කරනවා. පළමුවෙන්ම, මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැලිවිට සන්නසෙහි ප්‍රමාණයන් ගැන විස්තර කර තිබෙන්නෙ මෙන්න මේ අන්දමටයි:

"දිග අඟල් 24 1/2, පළල 2 1/2, දෙපැත්තේ පේළි 18, තඹ තහඩුව වටේ පිදියෙන් කැටයම් කර වම් පැත්තේ රනින් රජුගේ ශ්‍රී නාමය කොටා තිබේ."

ගරු කථානායකතුමනි, අපේ පැරණි ලියකියවිලි වර්ග හතකට කොටස් කර තිබෙනවා: (1) සන්නස්, (2) තුඩපත්, (3) සීට්ටු, (4) දිවි සීට්ටු, (5) වට්ටෝරු, (6) විත්ති වට්ටෝරු, (7) තල්පත්, යනුවෙන් ඒ හත හැඳින්වෙනවා. එම වර්ගවලින් ප්‍රධාන වන්නෙ සන්නසයි.

ඊළඟට මෙම සන්නස්වල ඇති භාෂාව ගැනත් කරුණු ටිකක් හෙළිදරව් කරන්න කැමතියි. ඒ පිළිබඳව පොතේ මේ අන්දමට දැක්වෙනවා:

"සන්නස්වල හා සියළුම පැරණි ලියවිලිවලත් භාෂාව හා කුණ්ඩලී ආදී ලකුණුත් තිබෙන ලෙසම යොදන බැව් සැලකිය යුතුයි."

කුණ්ඩලී ආදී ලකුණුත් ඒ ආකාරයෙන්ම යොදන්න ඕනෑ බවයි කියන්නේ. ඇත්ත වශයෙන්ම භාෂාවෙ ගැන මහත් ආන්දෝලනයක් පවතින මෙබඳු අවස්ථාවක, සිංහල භාෂා ව්‍යවහාරය ගැන නොයෙක් නොයෙක් මත ඇති මෙබඳු අවස්ථාවක, අපේ භාෂාව ගැනත් වචනයක් කියන්න ඕනෑ. සිංහල භාෂාවෙන් වැඩ කරන්න බැරියයි කියන සමහර ඇත්තන්ට අපේ සිංහල භාෂාව කොතරම් ලක්ෂණද, කොතරම් පොහොසත්ද කියා පෙන්නා දීමට මෙයින් කොටස් කීපයක් උපුටා දක්වන්න කැමතියි. මෙන්න එම සන්නසෙහි ඇති ලියවිල්ලෙන් කොටසක් :

"ශ්‍රී සුගත තථාගතානි ප්‍රවර ශ්‍රී සද්ධර්මාමෘත දාන ප්‍රවීණ සර්ව සත්ව නෙත්‍රොත්සව වාත්‍රිංශද්වර මහා පුෂි ලක්ෂණ......"

ඔය විධියට ආරම්භ කර තිබෙනවා. මා එම සන්නස දිගටම කියවන්න ගියහොත් එයින් ඉංග්‍රීසියට අගෞරවයක් වන්න පුළුවනි. එම නිසා මෙය සම්පූර්ණයෙන්ම කියවන්න යන්නෙ නැහැ, එයින් කොටස් කීපයක් පමණයි කියවන්නෙ.

".........ප්‍රවර චක්‍ර ලක්ෂණාදී අෂ්ටාධිකසත සංඛ්‍යාත මඟල්‍ය ලක්ෂණාන්විත ශ්‍රීපාද ලාඤ්ඡනාදී පාරිභොගික ශාරීරික උද්දෙසිකය යන ත්‍රිවිධ ධාතූන්ට අසහාය මන්දිරානුසාර වූ"—

**බී. වයි. තුඩාවේ මයා.**

*(திரு. பி. வை. துடாவ)*

(Mr. B. Y. Tudawe)

ඔය සංස්කෘත නෙ.

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னக்கோன்)*

(Mr. M. Tennakoon)

කොහොමද සංස්කෘත වෙන්නෙ ? සිංහල භාෂාව පෝෂණය වී තිබෙන්නෙ වෙනත් වෙනත් භාෂාවලින්. සංස්කෘත, පාලි, ඉංග්‍රීසි ආදී භාෂාවන්ගෙන් පමණක් නොවෙයි. පෘතුගීසි, ඕලන්ද, ආදී භාෂාවන්ගෙනුත් පෝෂණය ලැබ තිබෙනවා. සිංහල භාෂාව ජීවත් වන භාෂාවක් මිස මළ භාෂාවක් නොවෙයි. එමනිසා හැමදාමත් එය අන් භාෂාවන්ගෙන් පෝෂණය ලබනවා. මාතර මන්ත්‍රීතුමා කියනවා නම් සංස්කෘත වචන සිංහලයෙහි නැත කියා, මා ඒ ගැන පුදුමයට පත් වෙනවා. මාතර මන්ත්‍රීවරයා වැනි සිංහල භාෂාව ගැන දන්නා පුද්ගලයකු ඒ අන්දමින් ප්‍රකාශ කිරීම ගැන මා වඩාත් පුදුමවෙනවා. එතුමා කියනවා නම් සන්නසෙහි ඇත්තෙ සිංහල භාෂාව නොවෙයි කියා, මා සූදානම් මෙය සිංහල බව ඔප්පු කරන්න.

**තුඩාවේ මයා.**

*(திரு. பி. வை. துடாவ)*

(Mr. B. Y. Tudawe)

වැඩියක්ම තිබෙන්නෙ සංස්කෘත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னக்கோன்)*

(Mr. M. Tennakoon)

වැඩිය හෝ අඩුව හෝ නොවෙයි ප්‍රශ්නය, මෙම සන්නස සිංහල බවයි මා කියන්නෙ. [බාධාකිරීමක්] බෙන්තර ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමාටත් (එච්. ජී. ඒ. කාරියවසම් මයා.) සිංහල භාෂාවත් සංස්කෘත භාෂාවත් අතර ඇති වෙනස සොයා ගන්න බැරිව එතුමා පැටලී සිටින බව පෙනී යනවා.

ගරු කථානායකතුමනි, වැලිවිට සන්නස දීමට හේතුව මෙහි මනාව විස්තර කර තිබෙනවා :

"ශ්‍රී බුද්ධ වර්ෂ 2294 (1752) නිකිණි මස පුර දොළොස්වක් ලත් බදාදා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ස්වකීය රාජෝපාදයෙන් සිව් වැන්නෙහි ශ්‍රී පාදස්ථානයේ පුදපූජා සත්කාර පැවැත්වීම හා එහි වත් පිළිවෙත් පිරිමැසීමත් කරණ සංඝයාගේ ප්‍රයෝජනය තකා මුල් බිජු එක්සිය හැටපස් අමුනේ වපසරියත් එහි බද ගෙවතු ගහ-කොළ ගොඩමඩ ඇතුළු කුට්ටාපිටිය ගම සහිත ශ්‍රී පාදස්ථානය වැලිවිට සරණංකර සාමීන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරානුගතව පුද පවත්වන ලෙස භාර කිරීම සඳහා මේ සන්නස [illegible] ළදී."

මේවා සිංහල නොවෙයිද ? "එහි බද ගෙවතු, ගොඩ මඩ, එකසිය හැටපස් අමුනේ වපසරිය, ශ්‍රී බුද්ධ වර්ෂ 2294"—මේවා සිංහල නොවෙයිද ?

ගරු කථානායකතුමනි, කරන ලද යම් කිසි සේවයක් සඳහා මේ සන්නස්වලින් මේ ඉඩම් දී තිබෙනවා. එහෙත් මෙම රජය විශේෂ බදු මණ්ඩලයක් පිහිටුවා අද රජයේ ඉඩම් බදු දීගෙන යන්නේ මහජනයාට හෝ රජයට හෝ විශේෂ සේවයක් කර තිබෙන පුද්ගලයන්ටද යන්න මේ අවස්ථාවේදී අප නිරාකරණය කර ගන්නට ඕනෑ. මේ නින්දගම් ක්‍රමය නැති කරන්නට යන්නේ ඉඩමෙන් නියම ප්‍රයෝජනය සලසා ගැනීම පිණිසයි. ඒ එක පරමාර්ථයක්. සමාජයේ ඇති කැළලක් නැති කිරීම අනෙක් පරමාර්ථයයි. මේ නිසා සමාජයට යම් කැලලක් තිබෙනවා නම් ඒක ඇමතිතුමා දන්නවා ඇති. තමාගේ තත්ත්වයට ගැළපෙන නොයෙක් දේවල් කරන පුද්ගලයන් මේ සමාජයේ සිටිනවා. පහත් දේවල් කරන පුද්ගලයන් පහත් පුද්ගලයන් හැටියට අප පිළිගන්නවා. පහත් වැඩ කරන පුද්ගලයන් සමාජයේ හැම පැත්තකම හැම පංක්තියකම ඉන්නවා. ඒ පුද්ගලයන් සම්බන්ධයෙන් අප කියන්නේ "අසෙවනාච බාලානං" කියායි. පහත් පුද්ගලයන් සම්බන්ධයෙන් ඇති විග්‍රහය කෙසේ වෙතත්, මේ අලුත් බදු ක්‍රමය ගැන අප කල්පනා කර බලන්නට ඕනෑ. මේ අලුත් බදු ක්‍රමය, මේ අලුත් නින්දගම් ක්‍රමය, නරක විධියට ක්‍රියාත්මක කර තිබෙනවා.

අපේ ඉඩම් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා හොඳ කාර්යශූර පුද්ගලයකු හැටියට පිළිගන්නට පුළුවනි. සමහර විට මා මෙසේ කියන විට අපේ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) කුමක් කියනවා ඇද්ද ? "මුදියන්සේ තෙන්නකෝන් මහියංගනයේ ගරු මන්ත්‍රීතුමාගේ තැරැව්කාරයෙක්" යනුවෙන් කියන්නට පුළුවනි. මුදියන්සේ තෙන්නකෝන් මුදල් ඇමතිතුමාගේ තැරැව්කාරයකු හැටියටත් අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා විසින් හංවඩු ගසනු ලැබ ඇති බවක් දැනගන්නට තිබෙනවා. එ වාගේම මුදියන්සේ තෙන්නකෝන් පත්තරකාරයන්ගේත් තැරැව්කාරයෙක්ලු. ඔය මොනවා කීවත් ඇත්ත කිව යුතුයි. මහියංගනයේ ගරු මන්ත්‍රීතුමා මහියංගන ප්‍රදේශයේ ඉඩම් අක්කර 500 ක් පමණ ලබාගෙන එය ක්‍රමවත් පරිදි හා සාරවත් පරිදි වගා කරනවා නම්, එහි වරදක් නැහැ. එහෙම නම් එතුමාට ඉඩම් අක්කර 500 ක් දුන්නාට තිබෙන වරද මොකක්ද ? නැහැ ; කිසිම වරදක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙත් අද සිදු වන්නේ මොකක්ද? විශේෂ බදු ක්‍රමය යටතේ දෙන ඉඩම් නියම විධියට වගා වන්නේ නැහැ. ඒවා නියම විධියට වගා වෙනවා නම් ඒ ගැන අපට අසතුටු වන්නට හේතුවක් නැහැ. කොළඹ ළමයින් මිනි ගවුම් ඇඳගෙන ලැන්ඩ් රෝවර්වල නැගී පාසල් යන විධියටයි, අද ඒ ඉඩම් තිබෙන්නේ. ධන වතුන්ට ඉඩම් දුන්නා. ඒ විතරක්ද? ඔවුන්ට වාහන ගෙන්වා ගැනීමට විනිමය දුන්නා; බදු සහන දුන්නා. නොයෙකුත් පහසුකම් දුන්නා. හොඳයි, මේ ඔක්කොම පහසුකම් දීලත් ඉඩම් වගා වුණාද? ඉඩම් ලැබූ අය ඒ ඉඩම්වලින් නියම ප්‍රයෝජනය ගත්තාද? නැහැ; ඒ අය අනෙක් සහන ලබා ගත්තා වගේම ඒ ඉඩම්වල තිබුණු ලී ටිකත් කපා ගත්තා. යාපහුවේ මන්ත්‍රීතුමත්—ගරු මුදල් ඇමතිතුමා—සාක්ෂි දරන්නට ඕනෑ. වගකියන්නට ඕනෑ මා මේ කියන දේට. ඉඩම් අක්කරයක් අනවසරයෙන් වගා කළාය කියා වන්නි හත් පත්තුවේ කී දෙනකුට මාහෝ උසාවියේ දඩගසා තිබෙනවද? පුත්තලමේ උසාවියේ හෝ, ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ කොට්ඨාශයේ හලාවත උසාවියේ හෝ අනවසරයෙන් වගා කළාය කියා කී දෙනකුට දඩගසා තිබෙනවද? ඒ අය පෙත්සම් දමා ඉල්ලුවම ඉඩම් ලැබෙන්නෙ නැහැ. ලැබෙන්නෙ නැති නිසා ඒ අය ගිහින් වගා කරනවා. ඒ අයට ඉඩම් දෙන්නට ඕනෑ. ඉඩම් අක්කරයක් නැති නිසයි, අනවසරයෙන් වගා කරන්නෙ. ඒ අය වගා කළාම ඒ අයව උසාවියට ගෙන්වා දඩ ගස්සනවා. සංඛ්‍යා ලේඛන තිබෙනවා නම් ඔප්පු කරන්නට පුළුවන්. 1965 සිට අද වන තුරු මාහෝ උසාවියෙත්, පුත්තලමේ උසාවියෙත්, හලාවත උසාවියෙත්—ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ වත් උපකාරී වන්නටයි මා මේ කියන්නෙ—අනවසරයෙන් ඉඩම් [illegible] කියා අහිංසක ගම්මුන් කී දෙනකුට කොයි තරම් මුදලක් දඩ ගසා තිබෙනවාද කියා ඉඩම් ඇමතිතුමාට අපට කියන්නට පුළුවන්ද?

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, අක්කර ලක්ෂ එකහමාරක් පමණ බලපත්‍ර නැතිව අල්ලා ගෙන ඉන්නවා. එයින් භාගයක් පමණ නිරවුල් කර භුක්ති විඳින්නට දී තිබෙනවා. ඔප්පු ලියා ගන්නට පුළුවන් වුණාද කියා මා දන්නේ නැහැ. ඒජන්තවරුන් රපෝර්තු කර තිබෙන හැටියටයි, මා මේ කීව්වේ.

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

අනික් භාගෙට?

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

තවම ඉවර නැහැ. ඒජන්තවරුන් ඒවා බලාගෙන යනවා.

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
(திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி)
(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

එක් කෙනකුවත් ඉඩමකින් එලවා නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

එලවන්නට ගියොත් නම් වැඩේ වරදිනවා. ඒකට අප ලෑස්තියි. එහෙත් උසාවියකට ගියාම අපට කරන්නට දෙයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

නැහැ. එලවන්නට ආවොත් ඒ අයට සිදු වන්නේ මාව එලවන්නයි. මා කියා තිබෙනවා, ඕනෑම තැනක රජයේ ඉඩමක් තිබෙනවා නම්, ගම්මුන් අතර භේදයක් නැත්නම්, පොදු කටයුත්තකට ඒ ඉඩම වුවමනා නැත්නම් මිනිසුන්ට එකතු වී ඒක වගා කරන්නය, බලපත්‍රය ලබා දෙන්නට මා වගකියනවාය, බලපත්‍රය නොලැබුනොත් ඒ අය හිරේ යන්නට වුවමනා නැත, මා හිරේ යනවාය කියා. මේ රජය ලැස්ති නැහැ, ඒ අයට ඉඩම් දෙන්නට.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඒක වැරදි හැඟීමක්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ගරු කථානායකතුමනි, නවගත්තේගම ගැන මා කිව්වා. නවගත්තේගම ඉඩම් කොටසක් එම්. ජේ. කොම්පැනියට දී තිබෙනවා. නවගත්තේගම නින්දගම දී තිබෙනවා, එම්. ජේ. කොම්පැනියට. ගම්වාසීන් අනවසරයෙන් වගා කළ ඉඩම් කොටස්වලට බලපත්‍ර ලැබුනේ නැහැ. එම්. ජේ. කොම්පැනියෙන් ගිහින් අක්කර 500 ක් මැන්නා. නම් සඳහන් කිරීම ගැන සමා වන්න. ඔප්පු කරන්නට වුවමනා නිසයි, නම් සඳහන් කරන්නේ. අක්කර 500 ක් මැණ මේ අය වැටවල් දැම්මා. සිදු වුණේ මොකක්ද? අවුරුදු 5 ක 6 ක කාලයක් තිස්සේ අක්කර එකහමාරක්, දෙකක් ලබා ගන්නට බලාපොරොත්තුවෙන් සිටි ගම්මුන් විසි දෙනකුට පමණ තමන් අනවසරයෙන් වගා කරමින් සිටි ඉඩම් කොටස් අත්හැර—ඒවා එම්. ජේ. කොම්පැනියට භාර දී—අයින් වන්නට සිදු වුණා. කුරේ නමැති මහත්මයෙක් මට පෞද්ගලිකව ලියමනක් එවා තිබුණා. නම් සඳහන් කිරීමෙන් කරදරයක් අවහිරයක් වෙනවා නම් මට සමා වන්න. කරුණු ඔප්පු කරන්නට මේවා නොකියා බැරි නිසයි, කියන්නේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා සමා වන්න. මේ පනත ගැනද තමුන්නාන්සේ කථා කරන්නෙ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ නියෝගවලට සෑම විටම අවනත වන්නට මා ලැස්තියි.

"Enthusiasm for the proper utilization and development of land wealth."

ඉඩම් නමැති වස්තුව හරියාකාර ප්‍රයෝජනයට ගෙන, ඒ ඉඩම් නමැති වස්තුවෙන් වැඩිම ප්‍රයෝජනය ලබා ගැනීමයි, මේ පනතේ. පරමාර්ථය. ඒ අනුවයි, මා දැන් කථා කරන්නේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
නින්දගම් ඉඩම් ගැන.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ගරු කථානායකතුමනි, කාලය ගත කිරීමට නොවෙයි, මා මේ කථා කරන්නේ. අපේ ඇමතිතුමාට කාරණයක් පෙන්වා දීමටයි, කථා කරන්නෙ. අනවසරයෙන් වගා කරන අයට මේ රජය යටතේ හිරිහැරයක් නැත කියා ගරු ඇමතිතුමා කියනවා. ඒක වැරදි මතයක්. බොහොම හිරිහැර තියෙනවා. බොහෝම දඩ ගහනවා. ඉවසන්නට බැරි දඩ ගහනවා. සමහර අය හිරේ පවා ගිහින් තියෙනවා. හැබැයි, ගෙවල් කඩා පන්නන්නට නම් එන්නෙ නැහැ, අපේ පළාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වලට. ඒක කරන්නට ආවොත් වැඩ වර දිනවා. ඕකයි, අපට පෙන්වන්නට වුව මනා කර තිබුණේ.

මේ රජය එක නින්දගම් ක්‍රමයක් නැති කරනවාය කියා බොරු ඝෝෂාවක් කරනවා. නින්දගම්වල ඉන්න නිලකාර යන්ට සහන දෙනවාය කියනවා. මොන වාද නිලකාරයින්ට ලැබෙන සහන? සෑහෙන සහනයක් ලැබෙනවා නම් මා මෙයට සහයෝගය දෙන්නට ලැස්තියි. රජය ඉදිරිපත් කළ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පනත් කෙටුම්පතට මා සහයෝගය දුන්නා. මා පමණක් නොව මුළු විරුද්ධ පාර්ශ්වයම ඊට සහයෝගය දුන්නේ, එයින් සංඝයා වහන්සේලාට මෙන්ම මුළු සමාජයටම සෙතක් සැලසෙන නිසායි. ඒ විධියට, මේ ඉඩම්වලිනුත් නියම ප්‍රයෝජනය ලැබෙන අන්දමේ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න. එවිට අනෙක් අය කෙසේ වෙතත්, මා ඊට සහයෝගය දෙන බව කියන්න කැමැතියි.

පුරාණ රජ කාලයේ කළ සේවා වන් වෙනුවෙන් ලැබුණු එක නින්දගම් ක්‍රමයක් නැති කරන් නට තමුන්නාන්සේලා මහන්සි ගන්නවා. යම් කෙනෙක් ඒ ඉඩම්වලින් නියම ප්‍රයෝජනය ගන්නේ නැත්නම්, අයුතු විධියට ඒ ඉඩම් තබා ගන්නට ඉඩ දෙන්න එපා. ඒවා ඔවුන්ගෙන් අරගෙන ඒවායේ වැඩ කරන අයට, ඒවායේ ඉන්නා අයට—ඒ විතරක් නොව බලපිටි යෙන් වුණත් මිනිසුන් ගෙනත් දමන්න, මා ඊට විරුද්ධ නැහැ—ඒවා දෙන්න. හැබැයි, ඒ ඉඩම් පාවිච්චි කළ යුත්තේ නියම ප්‍රයෝජනය ලැබෙන ආකාරයටයි.

නරක අදහසකින් සඳහන් නොකළත් ගරු ඉඩම් ඇමතිතුමාගේ කථාවේදී සඳ හන් වුණා, උඩරට ප්‍රදේශයේ සිංහල යන්ගේ කුපාඩිකම්වලටත් නින්දගම් ලැබුණාය—

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා එහෙම නොකී බව නැවත වරක් කියන්න කැමැතියි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එහෙම කියනවා නම් මම පිළිගන්නම්. ඒ කෙසේ වෙතත්, සිංහලයන්ගේ උදාර ගතියක් ඔප්පු කිරීම සඳහා කරුණක් දෙකක් කිව යුතුව තිබෙනවා.

"Gazetteer of the Central Province of Ceylon excluding Walapane" by Archibald Campbell Lawrie, District Judge of Kandy from 1873 to 1892, and Senior Puisne Justice of Ceylon—Volume II.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

සිංහලෙන් කියන්න.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

"ආචිබෝල්ඩ්" කියන්නේ ඉංග්‍රීසි නමක්. එය සිංහලෙන් කියන්නේ කොහොමද? හොඳයි, "සිල්වා" කියන එක සිංහලෙන් කියන්න. [බාධා කිරීම්] එය ශබ්ද වන විධියට සිංහලයට පරිවර්තනය කරන්නයි, සිදු වී තිබෙන්නේ. මේ ලෝරි මහත්මයා 1873 සිට 1892 දක්වා මහනුවර දිස්ත්‍රික් විනිශ්චයකරු හැටියට කටයුතු කර තිබෙනවා. පසුව ඔහු සුප්‍රීම් උසාවියේ නඩුකාරයකු හැටියටත් කටයුතු කර තිබෙනවා. එතුමාගේ පොතකිනුයි, මා මේවා උපුටාගෙන කියවන්නේ. අර අදහස ඔප්පු කිරීම සඳහා මෙයින් ප්‍රයෝජනයක් ලැබෙනවා.

It states at page 721 :

"The Dalada Maligawa owns a Murakarana or Hamudawale Panguwa—a field of one pela. Tenant : Puncha Kankaniya. Service (commutable for Rs. 2) to perform one mura of fifteen days of menial work in the month of Wesak ; may commute the Mura by paying four shillings to the Diwa Nilame ; to present to the Diwa Nilame after the new year a pingo

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

of vegetables; when on duty receives the morning meal and a hunduwa of raw rice in the evening."

ඒ කීවේ, රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක වුණු හැටියි.

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரி. பி. எம். ஹேரத்—வளப்பனே)*
(Mr. T. B. M. Herath—Walapane)

සිංහලෙන් කියන්න එපායෑ? [බාධා කිරීම්]

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඔව්, සිංහලෙනුත් කියන්නම්. දළදා මාළිගාවේ—[බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

වලපනේ නින්දගම් නැහැ. [බාධා කිරීම්]

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එහි බදුකරු පුංචා කන්කානියා නමැත්තෙක්ලු. ඔහුගේ සේවය මුර කිරීමලු. ඔහුට මුර කරන්නට තිබුණේ, වෙසක් මාසයේලු. ඒ සේවය නොකරනවා නම් ඒ වෙනුවෙන් රුපියල් දෙකක් ගෙවන්නට සිදු වී තිබුණාලු. මුර සේවය කරන දාට දිය වඩන නිළමේට එළවළු කදක් අරගෙන යා යුතුව තිබුණාලු. මුර සේවය කරන දවසේ උදේ කෑම දිය වඩන නිළමේගෙන් ලැබුණාලු. ඒ වාගේම, රෑ කෑමට ගැනීම සඳහා හාල් හුණ්ඩුවකුත් ලැබුණාලු.

ඊළඟට එම පොතේම 725 වැනි පිටුවෙහි මෙසේ කියා තිබෙනවා:

Then at page 725 it states:

"Pathini Dewale: The old dewale is in ruins. The new one was built at the same time as the Pathige Dewale. Madugalle Basnayake Nilame stated that the members of the Yakdehige family held lands in this village on the tenure of supplying oil for five lamps at each festival annually to the Pathini Dewale in Kandy and Dumbara. There is a small vihara and a pansala called Gal-edande *alias* Erabadugolla Pansala at Labukola-anga.

The Wisinge family, as tenants of a Tamboru Panguwa of the Dalada Maligawa, hold one amuna field. Services (commutable for Rs. 47.10): to beat the drum in the processions of the Maligawa for four days at the festivals, ten days perahera, and two days Wesakmahe Puja Mangallaya: at the four festivals the tenant receives meals, for Alutsal Mangallaya two measures of rice and one measure of paddy,"—

අලුත් සහල් මංගල්‍යය කුමක්ද යන වග ගරු ඉඩම් ඇමතිතුමා දන්නවාද? [බාධා කිරීම්] අලුත් සහල් මංගල්‍යය යි කියන්නේ පළමුවෙන්ම ගන්නා හාලෙන්, මංගලෝත්සවයක් සහිතව පූජාවක් පැවැත්වීමයි.

ඊළඟට තව කොටසක් මේ විධියට තිබෙනවා.

"—for the perahera a white cloth and a handkerchief, and on the last day of perahera receives his meals: to give the Diwa Nilame after the new year a penuma of five watti of vegetables. The Tamboru are supplied by and kept in the Maligawa; it supplies all that is required for repairing them; when the skins of the Tamboru are repaired, the tenant gets a cloth and a handkerchief."

ගරු කථානායකතුමනි, මා මේවා කිය වන්නේ පුරාණ කාලයේදී නින්දගම් ක්‍රමය ක්‍රියාත්මක වුණු හැටි පෙන්වා දීමටයි. නින්දගම් ක්‍රමයෙන් සමාජයට කැළලක් වුණේ කොහොමද යන වග ගරු ඇමතිතුමාගෙන් දැන ගැනීමට අපට වුව මනා කරනවා. සමාජයේ එක් කොටසක ගෙන් තවත් කොටසකට සිදු වුණු කැළලක් ඉවත් කොට, නින්දගම් ක්‍රමය නිසා දුක් විඳින්නට සිදු වී සිටින එක් කොටසක් එම දුකින් මුදවා ගැනීම සඳහා මේ පණත ගෙනත් තිබෙන බව එතුමා කියනවා. එතුමා ඒ කරුණු හරිහැටි අපට විස්තර කර දෙනවා නම්, සමාජයේ කොටසක් දුකින් මුදවා ගැනීම පිණිස මේ පතාක යෝධයා විසින් ගෙනැවිත් තිබෙන පණ නට කෙළින්ම සහයෝගය දෙන්නට අපට පුළුවන්කම ලැබෙනවා. මේ දුක, මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැළල තිබෙන්නේ කොහේද යන වග අප එතුමාගෙන් දැන ගන්නට ඕනෑ. එතුමාට සන්නස්වලින් කරුණු කියවන්නට පුළුවන් නම් අපටත් එසේ කියවන්නට පුළුවනි. ඇයි ගරු ඇමතිතුමා යන්නේ ?

ඊළඟට ගරු කථානායකතුමනි, එම පොතේ දෙවැනි කාණ්ඩයේ තිබෙන වැදගත් කොටසක් කියවන්නට මා අදහස් කරනවා. මෙය තමයි වැදගත්ම කොටස. මේවා කියවන විට මෙහි සිටින්නට බැරිව එතුමා පිට වී යනවා. මේ කොටස තමයි විශේෂයෙන්ම කියවන්නට මට ඕනෑ කෙළේ. මොකද ? බෙල්ල ගසා දමනවාට බයේ ඉංග්‍රීසි කාරයින්ට පන්දම් ඇල්ලූ නිසා සමහර අයට නින්දගම් ලැබුණායයි එතුමා කිව්වා. ඉංග්‍රීසින්ට පන්දම් ඇල්ලූ නිසා යම් යම් අයට නින්දගම් ලැබෙන්නට ඇති. ඒ ගැන විග්‍රහයක් කරන්නට මා අදහස් කරන්නෙ නැහැ. ඒ අතරම, ඉංග්‍රීසින්ට පන්දම් ඇල්ලූ නිසා සිංහල වර්ගයා අද කෑලිවලට කැඩී භේද වී සිටින බව කීමේ ශක්තියක් එතුමාට නොතිබීම ගැනයි මා කණගාටු වන්නේ. එම නිසයි මා මේ කොටස කියවන්නෙ. ලෝරි මහත්මයාගේ දෙවන පොතේ 311 වන පිටුවෙනුයි මා දැන් කියවන්නෙ. වුවමනා නම් කෞතුකාගාරයට ගොස් මේ පොත බලා ගන්නට පුළුවනි.

"Uduwawola Wijekone Dissawa who was the ancestor of the family Halangoda Abeykone Mudiyanse in the reign of King Narendara Sinha, married the daughter of the Namale Arachchi. He had two sons by her, Halangoda Gajanayake Nilame and Halangoda Mohottala. To the former the Mudiyanse gave his Duganna lands in Harispattu and to the latter his Dissavani lands in Matale. Halangoda Mohottala, in Saka 1725 (1803 A.D.) was cut to pieces at Hanguranketa by order of the King, for having gone over to the English at Hikgolla."

මෙන්න මේකයි මට කියන්නට ඕනෑ කරන්නෙ. ඉඩම් ඇමතිතුමා අගෞරව කිරීමේ ස්වරූපයෙන් එතුමාගේ කථාව නොකළාය කියා කිව්වා. ඒක මා පිළි ගන්නවා. එතුමා අගෞරව කිරීමේ සිතින් ඒ කථාව නොකළ බව වැඩියෙන් ඔප්පු කරන්නටයි මමත් උත්සාහ කරන්නෙ. ඒ කියන්නෙ සෑම අවස්ථාවකදීම කුපාඩි කම් කළාට නින්දගම් ලැබී නැහැ. දැන් බලන්න මෙතැන. ඉංග්‍රීසිනට එකතු වුණාය කියා සිංහලයනට අයිති කෙනෙක් හඟුරන්කෙතදී පෙති ගසා තිබෙනවා. [බාධා කිරීමක්] මේ ගමන පෙති ගසන්නෙ කඩුවෙන් නොවෙයි කතිරයෙනුයි. සිංහලට අහිතකර ඕනෑම කෙනෙකු කතිරයෙන් පෙති ගසන්නට සිංහල ජනතාව ලෑස්ති බව මා පැහැදිලිවම කියනවා.

ගරු කථානායකතුමනි, මට පෙන්වා දෙන්නට වුවමනා කරන්නේ මේකයි. නරේන්ද්‍රසිංහ රජතුමාගේ කාලයේදී සිටි මේ උඩුවාවල විජේකෝන් දිසාවට පුත්‍රයින් දෙදෙනෙකු සිටියා. එක්කෙනෙක් හලංගොඩ ගජනායක නිලමෙ. අනිත් එක් කෙනා හලංගොඩ මොහොට්ටාල. එක්කෙනෙකුට හාරිස්පත්තුවෙන් දුක්ගන්නා ඉඩම් ලැබුණාලු. හලංගොඩ මොහොට්ටාලට මාතලෙන් ඉඩම් ලැබුණාලු, 1802 දී. 1803 දී —was cut to pieces at Hanguranketa —හඟුරන්කෙතදී පෙතිවලට කපා දැම්මා. සිංහලයට අහිතකර ලෙස ක්‍රියා කළාය කියා, සිංහලයට විරුද්ධව උපක්‍රම කළාය කියා පෙති ගසා දැම්මා. ඒ නිසා මා කියන්නේ, සිංහලයාටත් සිංහල භාෂාවටත් හානි කළ අයට කවදාවත් නින්දගම් ලැබී නැති බවයි. ගරු ඉඩම් ඇමතිතුමා ඔප්පු කරන්නට උත්සාහ කළා නම් අනවලයාගේ බෙල්ල ගහලා දැම්මාය කියා, ඇත්ත වශයෙන්ම හලංගොඩ මොහොට්ටාලගේ බෙල්ල හොඳට කැපූ එක්කෙනාට නින්දගමක් දෙන්නට ඇති. මොකද වරද ? අධිරාජ්‍යවාදීන්ට කත් ඇදලා, ඉංග්‍රීසි වර්ගයාට එකතු වෙලා, සිංහල වර්ගයාට අහිතකරව එදා ඒ විධියේ යමක් කළා නම්, හඟුරන්කෙතදී පෙති ගහලා කැපූ ඒ පුද්ගලයාට මුළු හඟුරන්කෙත ප්‍රදේශයම නින්දගම් වශයෙන් දුන්නත් මොකද වරද ? කුපාඩි කම් කළ අයට නින්දගම් දුන් බවක් ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ඉඩම් ඇමතිතුමා කියනවා නම් එය එසේ නොවන බව ඔප්පු කරන්නටයි මා මේ විස්තර ඉදිරිපත් කළේ.

මේ පනතින් යම් සහනයක් අපට වුව මනා කරනවා. ඉඩම්වල ජීවත් වන අයට යම් සහනයක් ලබා දෙන්නට වුවමනා කරනවා. අද බලංගොඩ ගරු මන්ත්‍රීතුමිය (මල්ලිකා රත්වත්තෙ මිය.) මෙහි සිටියා නම් හොඳයි. එහි රැස්වීමකට මාත් ගියා. පාන දූර පළාතේ කෙනකුට මේ ආණ්ඩුව අක්කර පණහක් ඉඩම් දී තිබෙනවා. ඒ ප්‍රදේශයේ තිබුණු ගස්කොළන් කපාගෙන ගිහිල්ලා ඒ ඉඩම කාබාසීනියා කර තිබෙනවා. විශේෂ බදු මණ්ඩලය මොනවාද මේ කරන්නේ ? ඒ ගැන ගරු මුදල් ඇමතිතුමා නොකියන්නේ ඇයි ? විශේෂ බදු මණ්ඩලයෙන් ඉඩම් ලබා ගන්න උදවියට බදු සහන පවා දෙනවා. එසේ බදු සහන පවා ලබා ගත් උදවිය හිතුවක්කාරකම් කරනවා. ඉඩම් වගා කළත් දිය යුතු බද්ද අපට දෙන්නැයි කියන්නට තරම් ගරු මුදල් ඇමතිතුමාට පණ නැත්තේ මන්දැයි එතුමාගෙන් මා අහන්නට ඕනෑ.

අපේ රටේ ඉඩම් අපට වුවමනා කරනවා. අපේ රටේ අයට ඒ ඉඩම් වුවමනා කරනවා. නින්දගම් පමණක් නොවෙයි වගා කරන්නට ඕනෑ. ඉඩම් කට්ටි වශයෙන් බලපත්‍ර යටතේ ලබාගෙන උදවු උපකාරත් රාශියක් ලබාගෙන වගා කළ උදවිය ඉන්නවා. ඒ බව ගරු ඇමතිතුමා දන්නවා. ගංවතුරට හෝදාගෙන ගිය ඉඩම් රාශියක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. ඒවා වගා කළ ඇතැම් ගොවීන් එසේ කර තිබෙන්නේ අනවසරයෙන් වෙන්නට පුළුවනි. අනවසරයෙන් වගා කළ අයත් විශාල පිරිසක් සිටිනවා. ඒ අය වගා කළ ඉඩම් ඔක්කොම හෝදාගෙන ගියා. ඒ සමගම තමන් සාදා ගත් ගෙවල් පවා විනාශ වී ගියා. අහිංසක ගොවීන්ට විශාල කරදර රාශියකට මුහුණ පාන්නට සිදු වුණා. මේ අහිංසක ගොවීන්ට ඒ ඉඩම් වගා කිරීම සඳහා බලපත්‍ර නොතිබුණු නිසා තමන්ගේ වගාව විනාශ වීමේ පාඩුවත්, ගෙවල් දොරවල් කැඩී යෑමේ පාඩුවත් විඳ දරා ගන්නට සිදු වී තිබෙනවා. ඒ අයට සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් පවා සතයක්වත් සහන ආධාරයක් වශයෙන් ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. බලපත්‍රයක් නැතිව සිටින නිසයි එසේ වන්නේ. අවුරුදු හත අටක්, එහෙම නැත්නම් දහයක් තරම් කාලයක් සමහර උදවිය ඒවායේ පදිංචි වී සිටියා. රුපියල් දෙතුන් දහක් මුදල් වියදම් කර ගෙවල් හදාගෙනයි සිටියේ. හැබැයි, බලපත්‍ර නැහැ. ගංවතුර ආවා. ගොවිතැන් කළ ඉඩම් හෝදාගෙන ගියා. බලපත්‍ර නැති නිසා සහනයක් ලැබෙන්නේත් නැහැ. දැන් ඒ අයට ජීවත් වන්නට විධියක්, මාර්ගයක් නැහැ. බලපත්‍ර නැති වුණත් ඒ අයට සිදු වූ පාඩුව ගැන සලකා සහනාධාරයක් දෙන්නැයි මා ඉල්ලා සිටිනවා.

නින්දගම් ගැන කථා කරමින් සබරගමු ජනතාවට සහනයක් දෙන්නට යන බවක් කියනවා. මෙය කොලොප්පමක්, ප්‍රෝඩාවක් සහ බොරුවක්. විලි ලජ්ජාවක් තිබෙනවා නම් තමන්ගේ වැඩි ඡන්දවලින් සම්මත කරවා ගැනීමට මෙවැනි පනතක් ඉදිරිපත් කරන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් පොදු මහජනයා තරම්වත් කල්පනාකාරී අය නොවන නිසයි මේ පනත අනුමත කරනවා නම් අනුමත කරන්නෙ කියන එක මම කියන්ට ඕනෑ.

මේක තේරුමක් නැති පනතක්. මේ පනත සම්පූර්ණයෙන්ම මහජනයා ඉදිරියේ සාකච්ඡා වුණා. මේ පනත සාකච්ඡා වුණු පළමුවෙනි වේදිකාව තමයි, බලන්ගොඩ මැතිවරණ කොට්ඨාශය. අගමැතිතුමාත් ඊට සහභාගි වුණා. ඒ අවස්ථාවේ පතාක යෝධයා වුණේ ඉඩම් ඇමතිතුමායි. ඇයි ? මේ නින්දගම් පනත ඉදිරිපත් කරල නින්දගම්වල නිලකාරයන්ට විඳින්නට සිදු වී තිබුණු දුක් ගැහැටවලින් ඔවුන් මුදවා ගැනීමේ පතාක යෝධයා හැටියට බලන්ගොඩදී පෙන්වා දෙන්ට යෙදුණේ ඉඩම් ඇමතිතුමාවයි. අන්තිමේදී බලන්ගොඩ වැඩි ජනතාව කිව්වෙ මොකක්ද ? "තමුසෙල ගෙදර යන්ට යනව. අපි අපේ කැමැත්ත පාවිච්චි කරනවා" කියායි. සම්පූර්ණයෙන්ම පනත ප්‍රතික්ෂේප කෙරුව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ නිසා පාර්ලිමේන්තුවේ සිටින ඇත්තන්ට යුතුකමක් නැහැ—පොදු ජනතාව ගැන තිබෙන හැඟීම් අඩු වෙන්ට පුළුවන්: ඒ නිසා තමයි අද මෙහෙම වෙලා තිබෙන්නෙ—පොදු ජනතාව ප්‍රතික්ෂේප කළ මේ පනත සම්මත කරන්න. ඒ නිසා කරුණාකර මේ පනත අස් කරගෙන, මේ පනත ඉදිරිපත් කරන්නෙ ඉඩම්වලින් නියම ප්‍රයෝජන ලබා ගැනීමේ චේතනා වෙන් නම් ඒ සඳහා වෙනත් පනතක් ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමනි, තවත් එක කරුණක් විතරක් කියන්ට ඕනෑ. බෙල්ල කැපුවටත් නින්දගම් දුන්න වර්ගයක් අපි, කියා ඉඩම් ඇමතිතුමා කියනවා. ඒ සම්බන්ධයෙන් මා කියන්නෙ මෙපමණයි. මිත්තේරියේ මන්ත්‍රීශ්වර ගරු ඉඩම් ඇමතිතුමා මා හිතන්නෙ බලපිටියේ උපත ලත් සමහර විට බ්‍රාහ්මණ පරම්පරාවලට සම්බන්ධකම් පෙන්වන්ට උත්සාහ කරන—එහි සාධාරණකම් තිබෙනව—සිංහලයෙක්. ඒකෙ ප්‍රශ්නයක් ඇත්තෙ නැහැ. එතුමා සිංහලයකු වෙලත් මෙතරම් නිවට අදහස් දරණ නිසා මට සිද්ධ වෙලා තිබෙනවා, මෙන්න මේකත් කියවන්න. ගරු කථානායකතුමනි, ඩබ්ලිව්. එස්. සීනියර් නමැති ඉංග්‍රීසිකාර මහත්මයා—

ස්ටැන්ලි තිලකරත්න මයා. (කෝට්ටේ)
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)*
(Mr. Stanley Tillekeratne—Kotte)
Rev. Senior, Sir.

එම්. තෙන්නකෝන් මයා.
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ගරු කථානායකතුමනි, අපේ නීතිඥතුමා ඉන්නවා, මා වෙනුවෙන් මට උපකාර කරන්න. සීනියර් මහත්මයාගෙ "Vital-Magistra" නමැති පොතේ සිංහලයින් ගැන මෙන්න මෙහෙම කියනවා. සී. පී. ද සිල්වා ඇමතිතුමා වැදගත් ප්‍රදේශයකින් එන සිංහලයකු වෙලත් කියනව, සිංහලයො නින්දගම් දීල තිබෙන්නෙ මිනිසුන්ගෙ බෙල්ල කැපුවටයි, මුවන් ගෙනැල්ල දුන්නටයි, කුස්සියේ ඉව්වටයි කියා. සී. පී. ද සිල්වා මහත්මයා සිංහලයන් ගැන එහෙම කියන කොට, ඩබ්ලිව්. එස්. සීනියර් නමැති ඉංග්‍රිසි ජාතික මහත්මයා සිංහල වර්ගයා ගැන මෙහෙම කියනව:

"Fair in the hills the Kandyan halls,
Proud hearths of ancient name;
The strength and grace of the Lion race,
The Lion that none shall tame."

ඒක මම සිංහලෙනුත් කියන්නම්. ඒත් විජාතිකයෙක් එහි සිංහල පරිවර්තනයකට සමාන අදහසක් දීල තිබෙනව. ටිබැට් ජාතික එස්. මහින්ද හාමුදුරුවො ඒක සිංහලෙන් කිව්වෙ මෙහෙමයි:

"බලෙන් කන්ද පිරූ ගන්නොරුව සිඹ
කැළණියෙ පහස ගෙන එන මද සුළඟ ලැබ
බලවත් සිහළ පැටියෙකු මෙන් වැඩෙන ඔබ
මැලවෙන්නෙහිද ඇයි ගත සිත නොකර පොබ"

ඒ නිසා සිංහලයකු වන සී. පී. ද සිල්වා ඇමතිතුමා සිංහල වර්ගයාට නිග්‍රහ කිරීමට මෙය අවස්ථාවක් කර ගැනීම ගැන කනගාටුව ප්‍රකාශ කරන අතර, මේ පනත හොඳ හිතකින් ඉදිරිපත් කළ පනතක් නොවන නිසාත්, මේ පනත සාකච්ඡා කළ මහජනයා විසින් මෙය ප්‍රතික්ෂේප කර තිබෙන නිසාත්, මෙය ඉල්ලා අස් කර ගන්නා ලෙස ඉල්ලමින් මගේ කථාව නවත් වනව.

අ. භා. 5.50

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ)
*(திரு. பேர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)
ගරු කථානායකතුමනි, මේ නින්දගම් පනත ඉදිරිපත් කර ඇත්තෙ අවුරුදු ගණනාවක් තිස්සේ පුල පුලා බලා සිටි ගැමි ජනයාගේ අවශ්‍යතාවයක්, ඔවුන්ගේ හිත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුළ තිබුණු විශාල බලාපොරොත්තුවක්, ඉෂ්ට කිරීමටය කියන මුවාවෙන් වුවත් මෙය පලක් නැති දෙයක් හැටියටයි, සලකන්ට තිබෙන්නෙ.

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ රටේ ඉඩම් ප්‍රශ්නය පිළිබඳව වැදගත් පිළිවෙළකට සංශෝධනයක් ඉදිරිපත් කරන්නට යුතුකමක් තිබෙනවා. ඉතාමත් අවුල් සහිතව තිබෙන තත්ත්වයක් නිසි පිළිවෙළකට පිරිසිදු කර ගන්නට නම් මීට වඩා ගැඹුරු ලීලාවෙන් කල්පනා කර සකස් කරන ලද පනතක් මගින් මෙම ප්‍රශ්නය විසඳිය යුතුව තිබුණා. එසේ නොවීම පිළිබඳවයි, වරද පැවරිය යුත්තේ. අපත් එම වරද පිළිගන්නට ඕනෑ. මෙම ප්‍රශ්නය පිළිබඳව තරමක්වත් නිසි විධියට කල්පනා කරන්නට පටන් ගත්තේ 1956 අවුරුද්දෙන් පසුව එක් කොටසකට පමණක් සීමා කොට කුඹුරු පනතක් ඉදිරිපත් කළායින් පසුවයි. එහෙත් එම පණතෙන් වුවත් නියම අන්දමට අපේ රටේ ඉඩම් පිළිබඳව පවත්නා අවුල් සහගත තත්ත්වය ලිහන්නට මාර්ගයක් සැලසුනේ නැහැ. ඒ බව කනගාටුවෙන් නමුත් කියන්නට ඕනෑ. සංශෝධනයක් මගින් එම පනතට අනුකූලව යම්කිසි වැඩක් කරන්නට පුළුවන් වේවිය යන අදහස ඇතුව අප එම පනත සංශෝධනය කරන්නට උත්සාහ දැරුවා. එහෙත් ඇත්තටම එම පනතේ නියම හරය ක්‍රියාත්මක කිරීමේ පිළිවෙළක් තවම අපට ලබා ගන්නට බැරිවී තිබෙනවා.

ගරු කථානායකතුමනි, ආණ්ඩුව පැත්තේ ඉතිරිව සිටි එකම ඇමතිතුමාත් දැන් නැගිට යන බවයි පෙනෙන්නේ. ඒ කෙසේ වෙතත් තමුන්නාන්සේ සිටින නිසා අපට කතා කරන්නට පුළුවන්. මෙම ප්‍රශ්නය පිළිබඳව අප ඇත්ත වශයෙන්ම කල්පනා කළ යුත්තේ කෙසේද? ඉතිහාසයේ කියා තිබෙන පිළිවෙළේ හැටියට වැඩවසම් ක්‍රමයෙන් ඉවත් වී යන සමාජයකට, රදළ පැලැන්තියකට අනුව විශේෂ අයිතිවාසිකම් හා වරප්‍රසාද ලැබුණු වැඩවසම් ක්‍රමයකින් ඉවත් වී යන සමාජයකට, සිදු වෙනවා ඉඩම් ප්‍රශ්නය පිළිබඳව පරවේණි අයිතිවාසිකම් කාටවත් තිබෙනවා නම් ඒවා නැති කරන්න. මෙය මුලින්ම දකින්නට ලැබුණේ ධනේශ්වර සමාජයට ප්‍රථමයෙන්ම පා තැබූ රට හැටියට සලකන මහා බ්‍රිතාන්‍යයේයි. 17 වන ශත වර්ෂයේ මුල් භාගයේදී පටන් ගත් ඒ ධනේශ්වර විප්ලවයෙන් පසු එම විපර්‍යාසයේ ප්‍රතිඵලයක් වශයෙන් 18 වන ශත වර්ෂයේදී ඉඩම් පිළිබඳවත් වෙනසක් කරන්නට සිදු වුණා. එම වෙනස කරන්නට සිදු වුණේ එහි තිබුණු වැඩවසම් ක්‍රමය යටතේ, රදළ ක්‍රමය යටතේ, නිසි විධියට ගොවිතැන් කොට අස්වැන්නක් ලබා ගන්නට බැරි බව පෙනී ගිය නිසායි. එහෙත් ඒ සඳහා යෙදූ පිළිවෙළ කුමක්ද? කලින් ගැමි ජනතාව ගොවිතැන් කිරීම සඳහා තියාගත් ඉඩම් වටකරගෙන ඒ ගැමියන් ඒවායින් එළවා දමා පැරණි රදළ ඉඩම් හිමියන් ධනේශ්වර ඉඩම් හිමියන් හැටියට පරිවර්තනය වීමයි. සිදුවුණේ එයයි. 19 වන ශත වර්ෂයේදී ජර්මනියේත් සිදුවුණේ ඊට සමාන දෙයක්. ප්‍රංශයේ කොහොමද? 18 වන ශත වර්ෂයේ කෙළවර හරියේදී සිදු වුණු ප්‍රංශ විප්ලවයෙන් පසු තත්ත්වය කුමක්ද? එදා ප්‍රංශයේ සිටි ගැමියන් එම රදළයන්ගේ හිස් ගසා දමා ඉඩම් අල්ලා ගෙන ඔවුනොවුන් අතර බෙදා ගත්තා. එසේ බෙදා ගැනීමෙන් ඇති වූයේ රදළ හිමියන් පෙළක් වෙනුවට ධනේශ්වර ඉඩම් හිමියන් පෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ළක් ජනසම්මත ධනේශ්වර විප්ලවයක් හැටියට සලකන ඒ විපර්යාශයට අයත්වූ එක් අංගයක් හැටියටයි, ඒ ගැන ඉතිහාසයෙහි සඳහන් වන්නේ. මේ විධියට විපර්යාසයක් යටත් විජිත හැටියට තිබුණ ආසියාතික රටවල, අප්‍රිකානු රටවල, දකුණු අමෙරිකාවේ රටවල සිදු වුණේ නැහැ. විශේෂයෙන්ම ආසියාවේ ශත වර්ෂ ගණනාවක් තිබුණ ආසියාතික රදල පිළිවෙල ඇත්තෙන්ම සෙල්ලුම් කන්නට පටන් ගත්තේ—අධිරාජ්‍ය ක්‍රමය නිසා—වෙනත් අර්ථ සංරක්ෂණ පිළිවෙළක් මේ රටවල් ආක්‍රමණය කිරීමෙන් පසුවයි.

මෙම ආසියාතික සංරක්ෂණ පිළිවෙළ සම්බන්ධව නියම විස්තරයක් දී ඇත්තේ මාක්ස් පමණයි. ඉන්දියාව පිළිබඳව ලියවී ඇති ලිපි පෙළක කියා තිබෙනවා ආසියාතික සමාජ හැඩගැස්ම ඇති වූයේ කුඹුරු කෙටීම වටාය කියා. බත් කන උදවිය සිටින රටවල, හාල් නිෂ්පාදනය කිරීමට අවශ්‍යවූ රටවල, වී ගොවිතැන් කරන්න අවශ්‍ය වූ රටවල ඇත්ත වශයෙන්ම වී ගොවිතැන් කිරීමට අවශ්‍ය වූ ජලය සම්පාදනය කිරීම වටා රජයක් ගොඩ නගන්නට සිදු වුණා. සාමාන්‍ය දුප්පත් ගැමියෙකුට, ගැමි පවුලකට තම ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය ජල සම්පාදනය කර ගැනීමට ශක්තියක් නැහැ. වාරිමාර්ග දියුණු කිරීම සඳහා ප්‍රධාන සංවිධානයක් අවශ්‍ය වෙනවා. මධ්‍ය සංවිධානයක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා බලගතු සංවිධානයක් වුවමනා කරනවා. ඒ වගේම එයට වුවමනා කරන වැදගත් වස්තුවත් ශ්‍රමයත් එක තැනක සංවිධානය කරන්නට පුළුවන් බලතල ඇති සංවිධායකයෙකු වුවමනා කරනවා. අන්න ඒ සංවිධායකයා හැටියට තමයි රජ කෙනෙක් පත් කර ගත්තෙ. ඒ නිසා තමයි මාක්ස් කියන්නේ ඒ ආසියාතික සමාජයේ කටයුතු තුනක් තිබෙනවාය කියා. මොනවාද ඒ තුන ? අභ්‍යන්තර මංකොල්ල කෑම නැත්නම් බදු එකතු කිරීම, බාහිර මංකොල්ල කෑම නැත්නම් යුද්ධ කිරීම හා වාරි මාර්ග දියුණු කිරීමයි.

මේ අනුව තමයි, චීනයේ හෝ ඉන්දියාවේ හෝ ඉන්දුනීසියාවේ හෝ ලංකාවේ හෝ රජදරුවන්ගේ පෙළපත් පිට පෙළපත් බැලුවම ඔවුන් සම්බන්ධව ඉතිහාසය ලියන අය සඳහන් කරන්නේ—විශේෂ කටයුත්තක් හැටියට, පොදු ජනතාවගේ ප්‍රයෝජනයක් හැටියට—වාරිමාර්ග දියුණු කිරීම. අනුරාධපුර සමයේ සිට--දුටුගැමුණු කාලයේ සිට—කෝට්ටේ රාජධානිය ඇති වීම දක්වා, ඒ රජදරුවන් පිළිබඳව ප්‍රශංසා කිරීමට ලියන ලද ඉතිහාස පොත්වල ලියා ඇත්තේ ලංකාවේ වාරිමාර්ග දියුණු කිරීම ගැනයි. අපේ රටේ ඉතිහාසය පිළිබඳව තිබෙන විශේෂ ග්‍රන්ථයක් හැටියට සැලකෙන මහාවංශය හා ඊට පසුව චූලවංශය සම්පාදනය කළ ගරුස්වාමීන් වහන්සේලා විශේෂයෙන් සඳහන් කළේ රටේ දාගැබ් වහන්සේලා තැනවීම ගැනයි. මේ රටේ සිටින වැඩි ජනතාව බෞද්ධයන් නිසා ඔවුන්ගේ බෞද්ධ ප්‍රතිපත්තීන් නිසි විධියට පිළිපැදවීම සඳහා රටේ ඇති කරන ලද දාගැබ් වහන්සේලා ගැන සඳහන් කරන අතරම විශේෂයෙන් සඳහන් කරන්නේ වාරිමාගී ගැනයි.

මේ කරුණ බැලුවාම අපට පෙනෙනවා, මේ ආසියාතික රටවල ඇත්තටම ඉඩම් පිළිබඳව අමුතු විධියේ විපර්යාසයක්, විප්ලවයක්—අයිතිය පිළිබඳව නියමයක්—ඇති කර ගැනීමට තිබුණේ අවුරුදු ගණනාවකට උඩදී බව. එය ශත වර්ෂ ගණනාවකින් ප්‍රමාද වී තිබෙනවා. නමුත් ඒ විපර්යාසය තවම නිසි විධියට මේ රටේ සිදු වුණේ නැහැ. මේ ගැන බැලුවාම අපට පෙනෙනවා 1917 අවුරුද්දේදී ඇති වුණ රුසියන් විප්ලවයේ ප්‍රථම භාගයේදී ඒ රටේ සිටි රදල ඉඩම් හිමියන්ගේ විශාල වතුයායවල් ඒවායේ සිටි ගැමියන්ට අර ගන්නටය කියා නියම කළ බව. ඒ ගන්නා ලද ඉඩම් එදා ධනේශ්වර පිළිවෙළට දියුණු කරන්නට නොව එක පැත්තකින් ඉඩම පිළිබඳව තිබෙන තනි අයිතියත්, ලබා ගන්නට ඇති ඇල්මත් සලකා සම් [illegible]ඩපිළිවෙළක් ඇති කරන්නට බැලු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

නිසා තමයි, එක් පැත්තකින් පෞද්ගලික ඉඩම් කැබලි අයිතිකාරයිනුත්, තවත් පැත්තකින් සමුපකාර ක්‍රමයට හෝ සාමූහික පිළිවෙළටත්, තවත් පැත්තකින් රජයේ ගොවිපළවල් හැටියටත් යන තුන් ආකාරයට සංවිධානයන් පටන් ගත්තෙ. අපට එය පිළිගන්නට සිදු වී තිබෙනවා. රුසියන් විප්ලවයෙන් ඉඩම් පිළිබඳව විශාල පරිවර්තනයක් ඇති කෙළේ වී නමුත්, කෘෂිකර්මය පිළිබඳව පරිවර්තනයක් ඇති කෙළේ වී නමුත්—ඒ රටවල අත්දැකීම් අවුරුදු 50 කට පසුව අපට දක්නට ලැබී තිබෙන අන්දමට—එහි කළ සෑම දෙයක්ම සෑම රටකටම එක විධියට කරන්න බැරි බවත් අපට පිළිගන්නට සිදු වී තිබෙනවා. ඒ නිසා මෙම 20 වන ශතවර්ෂයේ, විපර්‍යාසයකින් පටන්ගෙන බලනවා නම්, අර ප්‍රංස විප්ලවයෙන් සිදු වුණ අන්දමට හෝ මහා බ්‍රිතාන්‍යයේ සිදු වුණ පිළිවෙළට හෝ ධනේශ්වර ඉඩම් හිමියන් ඇති කිරීමේ දර්ශනයෙන් මෙය කරන්නට බැරි බව නම් ඔප්පු වී අවසානයි. 20 වෙනි ශත වර්ෂයෙන් පටන්ගන්නවා නම්, රදළ ශේෂයන් නොහොත් වැඩවසම් ක්‍රමයක නෂ්ටාවශෙෂයන් නැති කර දැමීමේ ක්‍රමයෙන් පටන් ගන්නවා නම්, එම පරිවර්තනයේ කෙළවර විය යුත්තේ සමාජවාදී සමාජයක් කරා ගමන් කිරීම බව අපට පිළිගන්නට සිද්ධ වී තිබෙනවා. එම ගමන ඉක්මන් වෙන්න පුළුවන්; තරමක් ප්‍රමාද වෙන්නත් පුළුවන්; අවුරුදු ගණනක් ගත වෙන්නත් පුළුවන්. නානා විධියේ අත්දැකීම් අනුව තමන්ගේ වැඩ කටයුතු සලසාගන්නට අපට සිද්ධ වෙනවා. කෙසේ නමුත් එය කෙළවර විය යුත්තේ සමාජවාදී පිළිවෙළකින් පමණක් බව කෙටියෙන් පිළිගන්න සිද්ධ වී තිබෙනවා.

මෙයට සාධක වශයෙන්, සාක්ෂි වශයෙන්, ලෝකයේ අඩු දියුණු රටවල්ය කියන ආසියාතික රටවල 1948න් පස්සේ ඇති වුණ විපර්යාස කීපයක් මතු කර පෙන්වන්න පුළුවනි. එයින් විශෙෂයෙන් මතක් කර පෙන්විය යුතු එකක් නම් මහජන චීනයයි. චීනයේ ඇති වුණ ඒ විපර්යාසයෙන් පැරණි රදළ ඉඩම් හිමියන්ගේ බලය නැති කළා පමණක් නොවෙයි, එදා පත් වුණ ආණ්ඩුව පුහුණු වූ පිරිසක් ගම් ප්‍රදේශවලට යවා ඒ කණ්ඩායම් විසින් ඉඩම් මැන මෙන්න මේ ප්‍රමාණයට වඩා කෙනෙකුට ඉඩම් අයිතිකර තබා ගන්නට අයිතියක් නැතැයි කියා දුප්පත් ගැමියන්ට ඒ ඉඩම් බෙදා දුන්නා. ඒ වාගේම තමයි මෑතදී කියුබාවේ ඇති වුණ විපර්යාසය. ඇමෙරිකන් ධනේශ්වරයන්ගේ ආධාරය ඇතිව රදළ ක්‍රමයට හිමිවන ආකාරයෙන් පවත්වාගෙන ආ විශාල වතු—ස්පාඤ්ඤයේ පාවිච්චි කරන වචනයකින් Latifundia කියා භාවිතා වුණ විශාල වතු යායවල්—කඩා බෙදා ඒ ගම්මුන්ට බෙදා දෙන්නට කස්ත්‍රෝගේ ආණ්ඩුවෙන් ක්‍රියා කළා. මෙවැනි අත්දැකීම් රාශියකින් පසුව මෙම 20 වන ශතවර්ෂයේ—1968 වන අවුරුද්දේ—වැඩවසම් ක්‍රමයක නෂ්ටාවශේෂයන් නැති කරනවාය කියන බලාපොරොත්තුවෙන් මොකක්ද මේ ආණ්ඩුවෙන් කෙරෙන්නේ ? ගරු ඉඩම් ඇමතිතුමාගේ නින්දගම් පනත පමණයි. අපේ ඇමතිතුමාට ඉතිහාසයෙන් හෝ වෙනත් රටවල ඇති වුණ අත්දැකීම්වලින් හෝ පාඩමක් ලබාගන්නට බැහැ. ගරු ඉඩම් ඇමතිතුමාගේ මේ පිළිවෙල අනුවම මේ ප්‍රශ්නය විසඳන්නට ඉදිරිපත් වූ භාරත ප්‍රදේශයේ ඉන්දියාණ්ඩුව මොන විධියේ අවුලකට මුහුණ පෑවාද කියා මා ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි. ඒ අවුල ගැන ගරු ඇමතිතුමා දන්නේ නැතුව ඇති.

කථානායකතුමනි, ඉන්දියාවේ ධනේශ්වර ක්‍රමය සොලවන්නේ නැතුව, එයට කිසිම හානියක් නොකර ඉඩම් ප්‍රශ්නය විසඳන්නට—රදළ ප්‍රශ්නය විසඳන්නට, ඒ ක්‍රමය වෙනස් කරන්නට—උත්සාහයක් තිබුණා. ඒ පිළිබඳ ඉතිහාසය කෙටියෙන් සඳහන් කළ යුතුය කියා මා කල්පනා කරනවා. මහා බ්‍රිතාන්‍යයන් ඉන්දියාව ආක්‍රමණය කළ අවස්ථාවේදී ඓතිහාසික ලෙස හැඩගැසුණු රදළ පිළිවෙළක් ඉන්දියාවේ තිබුණා. එම පිළිවෙළ යටතේ, ඉඩමක් ගැන අයිතියක් නිසි විධියට නීත්‍යානුකූලව පෙන්වන්නට හැකි කිසිම දෙයක් කාටවත් තිබුණේ නැහැ. තිබුණේ රජයකට වුවමනා කරන බදු එකතු කිරීමේ පිළිවෙළක් පමණයි. එ බදු එකතු කිරීම අනුව ඒ ගම් ප්‍රදේශවල දුප්පත් ගැමියන් සොයාගත් අස්වැන්නෙන් කොටසක් ඉහළ සිටින රදළයන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගියා. එයින් කොටසක් ඊටත් ඉහළ සිටින රදළ කොටසකට ගියා. ඒ විධියට ගොස් අවසානයේදී රාජධානියක ප්‍රධානයා හැටියට සලකන රජුන්ට කොටසක් අයිති වුණා. මේ තත්ත්වයේ තිබුණු ඉඩම් පිළිවෙළ වෙනස් කරන්නට ඉදිරිපත් වුණේ බ්‍රිතාන්‍ය ආණ්ඩුවයි. ඒ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ඉන්දියාවේ ආණ්ඩුකාර ධුරය දරූ ඩැල්හවුසි මහතා තමයි ඒ රටට විශේෂයෙන්ම සමින්දාර් ක්‍රමය කියන එක බෝ කළේ. සමින්දාර් ක්‍රමය නමින් බ්‍රිතාන්‍ය රජය යටතේ තිබුණු ඒ නව රදල පිළිවෙල ඩැල්හවුසි මහතාගේ වචනවලින්ම ප්‍රකාශ කර ඇත්තේ, එය බ්‍රිතාන්‍ය ආණ්ඩුව තහවුරු කර ගැනීමට ඇති කළ උපක්‍රමයක්ය කියලයි.

ආර්. පී. දත් මහතා ඉන්දියාවේ ඉඩම් ප්‍රශ්නය පිළිබඳව ලියා ඇති වැදගත් පොත් දෙකක් තිබෙනවා. ඒ පොත් දෙක ටිකක්වත් කියවන්නය කියා ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමාගෙන් මා ඉල්ලනවා. ඉන්දියාවේ ඉඩම් පිළිබඳව ඇති වූ ඉතිහාසය ඩැල්හවුසි මහතා මෙසේ කියා තිබෙනවාය කියා ආර්. පී. දත් මහතා මෙසේ පෙන්නුම් කරනවා.

"We must create a body of persons in this country, by the conferment of this ownership of land and the collection of rents, who will have a permanent and abiding interest in the continuation of British rule."

බ්‍රිතාන්‍ය ආණ්ඩුව වෙනුවෙන් බදු එකතු කිරීමට පත් කර ගත් නිලධාරීන් වශයෙන් සිටි මේ සමින්දාර්වරුන්—හින්දි භාෂාවෙන් 'සමින්' කියන්නේ භූමියටයි, 'දාර්' කියන්නේ හිමියාටයි, 'සමින්දාර්' කියන්නේ භූමිය අයිති කර ගත් තැනැත්තාටයි—බ්‍රිතාන්‍ය ආණ්ඩුව මගින් ඇති කළේ එක පැත්තකින් බදු එකතු කර ගැනීමටත්, අනික් පැත්තෙන් කොටසක් සමාජයෙන් වෙන් කර සදහට ම බ්‍රිතාන්‍ය රජය පවත්වාගෙන යෑමට වුවමනාවක් ඇති වන පිරිසක් ඇති කිරීමේත්, බලාපොරොත්තුවෙනුයි.

ගරු කථානායකතුමනි, මේ පිළිවෙල ගැන මහාත්ම ගාන්ධිතුමාගේ කොන්ග්‍රස් දේශපාලන පක්ෂය විරුද්ධ වූ නමුත්, ඒ පක්ෂයට ධනේශ්වර දර්ශනයෙන් තොරව යන්නට බැරි වූ බව මා පිළිගන්නවා. කෙසේ නමුත් දුප්පත් ගැමියන් ගැන අනුකම්පාවක් තිබුණු මහත්මා ගාන්ධිතුමාගෙන් පසුව එහි නායකත්වය ගත් විනෝබා භාවේ තුමා වැනි අය භූදාන් ව්‍යාපාරය කියා දුප්පතාට තමන්ගේ කැමැත්තෙන්—විප්ලවකාරී ව්‍යාපාරයකින් නොවෙයි— ඉඩම් පරිත්‍යාග කිරීමේ පිළිවෙළක් පටන් ගත්තා. 1948 න් පසුව ඒ ඒ ප්‍රදේශවල පාලනය භාරගත් කොන්ග්‍රස් ආණ්ඩු උත්තර ප්‍රදේශය, දකුණු ඉන්දියාව පංජාබය, ආදී සෑම තැනකම පරිවර්තනයක් ආරම්භ කළා. එහෙත් ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමා මෙන් සීමිත පිළිවෙළට ප්‍රශ්නයේ නියම හරය වටහා ගත්තේ නැතිව, මූලික ප්‍රශ්න විසඳා ගැනීමට පිළිවෙළක් යොදා ගත්තේ නැතිව, මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නට ගිය නිසා ප්‍රශ්නය අවුලෙන් අවුලට පත් කර ගත්තා. තවමත් දකුණු ඉන්දියාවේ සහ ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ මේ ප්‍රශ්නය නියම විධියට නිරවුල් කර ගන්නට බැරිව දඟලනවා. ඇත්තටම ධාන්‍ය වගාව පිළිබඳව ඇති කර ගත් බලාපොරොත්තුව, පස් අවුරුදු සැලැස්ම අනුව ඉන්දියා ආණ්ඩුව ඇතිකරගත් බලාපොරොත්තුව, නියම විධියට ඉටු කර ගන්නට බැරිව අද දඟලන්නේ ඒ නිසා තමයි.

මෙවැනි අත්දැකීම් රාශියක් තිබියදීත්, රටින් රටට බලන්නට පුළුවන් දේවල් මෙපමණ තිබියදීත්, අපේ ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමා අපේ රටේ තිබෙන ප්‍රශ්න නියම විධියට විසඳන්නට මීට වඩා ගැඹුරු පිළිවෙළකට කල්පනා කර ඉදිරිපත් නූණේ මන්ද කියා සොයනවා නම්, එතුමාට එසේ කල්පනා කිරීමට ශක්තියක් ඇද්ද නැද්ද කියන කරුණ ගැන සැකයක් ඇති වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ මේ වැඩවසම් ක්‍රමයේ උත්පත්තිය මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් කී පිළිවෙළට, සිංහල රජවරුන්ගේ කාලයේ ඇති කළ පිළිවෙළක්. ගරු කථානායකතුමනි, නින්දගමක්ය කියන්නේ මොකක්ද? මේ වැඩවසම් පිළිවෙළට අයිති වූ ක්‍රම තුනක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඇත්තෙ එකම ක්‍රමයයි. හිමිකරුගේ වෙනසින් පමණයි වෙනස් වෙන්නෙ. විහාරගම් පිළිබඳව, දේවාලගම් පිළිබඳව, නින්දගම් පිළිබඳව ඇත්තේ එකම තත්ත්වයක්. කෙසේ වුණත් ගරු කථානායකතුමනි, මෙම නින්දගම ලැබුණේ නීච සේවයක් කළ නිසාද,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

රටට ද්‍රෝහිකමක් කළ නිසාද, වැදගත් සේවයක් කළ නිසාද යන ප්‍රශ්නය ගැන කා සමගවත් විවාදයකට බහින්න මගේ බලාපොරොත්තුවක් නැහැ.

මෙහිදී අපට අවශ්‍ය වන්නෙ මෙපමණයි: යම් සේවයක් කිරීමේ බලාපොරොත්තුවෙන් හෝ යම්කිසි සේවයක් ලැබීම නිසා හෝ—එම සේවය කොපමණ වැදගත් වුණත්, කොපමණ නීච වුණත් ප්‍රශ්නයක් නැහැ—කුමන කරුණක් නිසා හෝ වේවා යම්කිසි සේවාවක් වෙනුවෙන් හෝ අපේක්ෂාවෙන් හෝ වගා කිරීම පිණිස ඉඩම්වල අයිතිය පැවරීමේ තත්ත්වයක් එදා තිබුණා. සමහර විට වැදගත් කවියක් ලිවීම නිසා වන්න පුළුවනි, විහාරස්ථානයක් ගොඩනැංවූ නිසා වන්න පුළුවනි, කාරණය කුමක් වුණත් වගා කිරීම පිණිස එකල පැවතුණ ඉඩම් පැවරීමේ තත්ත්වය ඒකයි. අන්න ඒකයි මෙහිදී මතුවන වැදගත් කරුණ. මෙන්න මේ තත්ත්වය අනුව ඇති වූ නින්දගම් පිළිවෙළෙහි බ්‍රිතාන්‍යයින් සෙංකඩගල රාජධානිය අල්ලා ගැනීමෙන් පසුව ඇති වුණ වෙනස කුමක්ද? පහළ වුණු තත්ත්වය මොකක්ද? අපේ ගරු ඉඩම් ඇමතිතුමා ඒ කනගාටුදායක තත්ත්වය ගැන, ඒ කරුණ ගැන වචනයක්වත් කියන්න ඉදිරිපත් වුණේ නැහැ. එසේ ඉදිරිපත් නොවීමට බලවත් හේතුවක් තිබෙනවා. ඉඩම් ප්‍රශ්නය ගැන කථාවක් තිබෙනවා. ඉඩම් ප්‍රශ්නය ගැන කථා කරන අවස්ථාවේදී වචනයක්වත් කියන්න මේ ආණ්ඩුවට නිර්භීතකමක් තිබුණේ නැහැ, ශක්තියක් තිබුණේ නැහැ, නින්දගම්වලට වඩා විශාල වශයෙන් මෙරට ධනය සූරා කෑමට අදාළ වී ඇති වතුකරය ගැන. එබඳු ධෛර්යයක් එතුමාට තිබුණේ නැති නිසා තමයි, 19 වන ශත වර්ෂය තුළ අපේ රටේ ගැමි ජනතාවට විඳින්න සිදු වූ විශාල අමාරුකම් ගැන, දුක ගැන වචනයක්වත් සඳහන් නොකළේ. ගරු කථානායකතුමනි, තමුන්නාන්සෙ වාගේම මේ ගරු සභාවෙ අනිකුත් ගරු මන්ත්‍රීවරුනුත් හොඳාකාර දන්නවා, මුඩුබිම් පනත යටතේ, මුඩුබිම් පනතෙ අණ පනත් යටතෙ අපේ ගැමියන් සතු ඉඩම් අල්ලා ගත් අන්දම ගැන. මා කලිනුත් සඳහන් කළ අන්දමට මෙරටට පැමිණි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් බලාපොරොත්තු වුණේ දුප්පත් ගැමියන්ගේ ඉඩම් බලහත්කාරයෙන් ගැනීමෙන් ධනේශ්වර පංක්තියෙ විපර්යාසයක් ඇති කරන්නටයි. එම නිසා ඉන් පෙර නොතිබුණු තත්ත්වයක් පහළ වුණා.

ඉඩම් පිළිබඳව අයිතිය නීතිගත කිරීමේ තත්ත්වයක් අපේ රටේ කවදාවත් තිබුණෙ නැහැ. බ්‍රිතාන්‍ය නීතිය අනුව නැතිනම් ඕලන්ද නීතිය අනුව අසුවල් ඉඩම අසුවල් පුද්ගලයාට අයිතිය කියා නියම කිරීමේ තත්ත්වයක් අපේ රටේ තිබුණේ නැහැ. එසේ වුණත් බ්‍රිතාන්‍යයින් මෙරටට ආවාට පසුව අදහස් රාශියක්ම පදනම් කර ගෙන සම්පාදනය කළ නීති මේ රටේ ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. සිය එම ඉඩම් රජුන්ට අයිතිය, රටේ තිබෙන සියළුම දේ රජුන් සතුය ඔහුගෙන් පැවරෙන අයිතියක්ය කෙනෙකුට අයත් වෙන්නෙ, එය සීමා කිරීමේ ඔප්පුවක් තිබිය යුතුය යනාදී වශයෙන් ඇති වුණ අදහස් අනුව නීති ක්‍රියාත්මක කරන්නට පටන් ගත්තා පමණක් නොවෙයි, 1817 ඌවේ ඇති වූ මහා කැරැල්ලෙන් පසුව, ගම් විනාශ කර දැමීමේ අරමුණ ඇතුව, ගැමියන්ගෙන් පළිගැනීමේ චේතනාවෙන් මුඩුබිම් හැටියට සලකා ගැමියන් සතු ඉඩකඩම් පැහැර ගැනීමේ විශාල ව්‍යාපාරයක් ගෙන ගියා.

ගරු කථානායකතුමනි, එකල පැවති තත්ත්වය ඒකයි. කිසිම අන්දමක පක්ෂපාතිත්වයක් නොමැතිව මේ කාරණා පිළිබඳව විස්තර කරන ලිපි පෙළකින් එක් ලිපියක් උපුටා දක්වන්න කැමතියි. මේ ලිපිය සපයා ඇත්තෙ පේරාදෙණිය, ලංකා විශ්ව විද්‍යාලයේ කේ. එම්. ඩී. සිල්වා මහත්මයයි. එතුමා පවා පෙන්නුම් කර තිබෙන්නේ මොකක්ද? 19 වන ශත වර්ෂයේ මුල් භාගයේදී කෝපි වගාව සඳහා බ්‍රිතාන්‍යයන්ට ඉඩම් වුවමනා කර තිබුණා. මේ අතර පැරණි අදහස්වලටම බැඳී සිටි ඒවා කිසිම විධියකින්වත් වෙනස් කරන්නට අකැමති වූ, රදළ ඉඩම් හිමියන් එක පැත්තකින්ද, දුප්පත් ගැමියන් පිරිසක් අනෙක් පැත්තෙන්ද සිටියා. මේ දෙපාර්ශවය අතරේ ඇති ව ගැටුමෙන් ජය ගත්තේ කවුද, කාගේ පිහිටෙන්ද, යන්න අපට වැදගත් වෙනවා. බ්‍රිතාන්‍යයන් ජය ගත්තා. ජය ගත්තේ කෝපි වගා කිරීමට අවශ්‍ය යයි කල්පනා කළ ඒ බ්‍රිතාන්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධනේශ්වරයත් පමණයි. කෝපිවලින් පටන්ගෙන ඊට පසුව තේවලට බැස්සා. ඉතිහාසය මේකයි. ගැමියන් අතරේ වගාවට දෙන්නට ඉතුරු වූයේ, බ්‍රිතාන්‍යයන් සමග කිට්ටු ආශ්‍රයක් ඇතිව සිටි රදලයන් රට පාලනය කිරීමට ආදායම් සොයා ගැනීමට පාවිච්චි කළ රදල ක්‍රමයට අයත් වූ ඉඩම් පමණයි.

ශත වර්ෂයකට පමණ පෙර සිදු වූ මේ දේ ගැන දැන් කුමක් කළ යුතුද? කුමක් ද සිදු වී ඇත්තේ? අපට තිබෙන්නේ ධනේශ්වර සමාජයක්. මේ ආණ්ඩුව බැඳී සිටින්නේ ධනේශ්වර ක්‍රමය රකින්නටයි.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. செல்ற்றன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

කවුද කියන්නෙ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

තමුන්නාන්සේලා සෑම පියවරක්ම ගන්නේ ධනේශ්වර ක්‍රමය රකින්නටයි; ධනේශ්වර ක්‍රමය දියුණු කිරීමටයි. [බාධා කිරීමක්] තමන්ගේ ආසනයෙන් පිට තැනක වාඩි වී සිටින කර්මාන්ත කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා විවාදයට බසිනවා නම්, කරුණා කර තමන් කියන දේ පැහැදිලි ලෙස කියන්න. එවිට ඒ කියන දේට පිළිතුරු දෙන්නට පුළුවනි. [බාධා කිරීමක්] එතුමා නින්දගම් ආරක්ෂා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් නින්දගම්වලටත් වඩා නරක තත්ත්වයේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමට අතකොළුවක් වන්නට එතුමා ලැස්තියි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I do not think that is a fair comment.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

What is unfair.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

What you said about him; the last sentence.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I only talked about a property system. We are debating a property system.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Yes, carry on.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව කුමන විධියේ ප්‍රතිපත්තියක් අනුගමනය කළත් අද තිබෙන මේ ධන්ශ්වර සමාජය තුළ ඉඩම් පිළිබඳව කුමන විධියේ විපර්යාසයක් ඇති කරන්නට පුළුවන්ද? සෑම තැනම සියලුම දේවල් සිදු වන්නේ මුදල් හුවමාරුව අනුවයි. මුදල් හුවමාරු ක්‍රමයට යට වූ අර්ථ සංරක්ෂණයෙන් මේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නය විසඳන්නට ඉදිරිපත් වෙනවා නම්, එය කළ හැකි වන්නේ මේ පනතෙන් නොවෙයි. මූලික ප්‍රශ්නයට නිසි විධියට මුහුණ දෙන්නට ගරු ඉඩම් ඇමතිතුමා සූදානම් නැහැ.

ගරු කථානායකතුමනි, මේ ඉතුරු වෙච්ච දේවල් ගැන, වැඩ වසම් ක්‍රමයෙන් පැවතගෙන එන සේවාවන් ගැන කුමක් කළ යුතුද කියන ප්‍රශ්නයට මුහුණ දෙන්නටයි, තිබෙන්නේ. බලාපොරොත්තු වන්නේ ඇත්තටම නින්දගම් නැති කරන්නට නම්, රදල පිළිවෙල නැති කරන්නට නම්, පංගුවලට පමණක් මේ පනත සීමා කෙළේ ඇයි? පරවේණි පංගු, මාරු වන පංගු, හැටියට කෘෂිකර්මයට යොදා ඇති පංගුවලට පමණක් මේ නින්දගම් පනත සීමා කළා. ඒ ඇයි?

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මා ගරු ඇමතිතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. මේ රටේ නින්දගම් හැටියට සැලකෙන්නෙ මොනවද? ඓතිහාසික වශයෙන් පැවරී එන නින්දගම් මොනවාද? නින්දගම්වලට අයිති පංගු හැටියට, පරවේණි පංගු

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

හැටියට බෙදා දී තිබෙන ඉඩම් කැබෙලි තිබෙනවා. වගාවක් කෙළවර වුණායින් පසු වුවමනා වේලාවක අස් කරන්නට පුළුවන් පිළිවෙළක් අනුව පැව තෙන මාරු වෙන පංගු තිබෙනවා. මුත් තෙට්ටු ඉඩම් හැටියට, බණ්ඩාර ඉඩම් හැටි යට මඩ බිම්, ගොඩ බිම් දෙකෙන්ම යුක්ත වූ ඉඩම් කැබෙලි තිබෙනවා. ඒ සමගම නින්දගම් යටතේ මුකලාන වශයෙන්—කැලෑ වශයෙන්—වෙන් කිරීමට පුළුවන් විශාල භූමිභාග තිබෙනවා. මේ සියල්ලක්ම අත්හැර ගොවිතැනට යොදාගෙන තිබෙන පංගුවලට පමණක් සීමා කර තිබෙන පනතකින් නින්දගම් නැති කරනවාය කියන අදහසයි, මෙතැන පෙන්නුම් කරන්නට හදන්නේ. මේක ව්‍යාජ අදහසක්; ව්‍යාජ පනතක්. පරමාර්ථය ඉෂ්ට නොවන දෙයක්. ඇත්තටම මහජනතාවට කරන වංචාවක් හැටියට හඳුන්වන්නට පුළුවනි.

ගරු කථානායකතුමනි, මෙය දේශපාලන හේතූන් නිසා ඉදිරිපත් කළාය කියන්නට පුළුවනි. ඒ පිළිබඳව විස්තර සහිතව කියන්නට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. යම් කිසි හේතුවක් නිසා මේ පනත ගෙනෙන්නට ඉක්මන් වුණා. ඒ ඉක්මන් වීම නිසා නිසි ප්‍රශ්න ගැන සලකන්නට බැරි වුණා. මේ රටේ බ්‍රිතාන්‍ය ඉතිහාසයේ මුල් භාගයේ සිටම සලකා බැලූ විට පෙනෙනවා, මේ රටේ ඉඩකඩම් බෙදා නිරවුල් කිරීමේ පිළිවෙතක් ඇති කරන්නට කට යුතු කෙළේ නෝත් අග්‍රාණ්ඩුකාරතුමා බව. නෝත් අග්‍රාණ්ඩුකාරතුමා ඉඩම් නිරවුල් කිරීමේ අදහසින් රෙගුලාසි මාලාවක් පැනෙව්වා. එහෙත් එයින් ප්‍රශ්නය විසඳුනේ නැහැ. ඔහුගේ චේතනාවෙන් පසුව බ්‍රිතාන්‍ය සමයේදී කිසිම කෙනෙකුට ඒ පිළිබඳව නිසි පිළිවෙළට චේතනාවක් ඇති වුණේ නැහැ. නෝත්ගේ ඒ රෙගුලාසි වලින් පටන් ගෙන අද කර්මාන්ත හා ධීවර ඇමති ධුරය දරණ ගරු පිලිප් ගුණවර්ධන ඇමතිතුමාගේ කුඹුරු පනත දක්වා සලකා බලන විට ඉඩම් පිළිබඳව ඇති වූ සෑම අණපනත්වලින්ම සිදු වුණේ ඉඩම් ප්‍රශ්නය නිරවුල් කරනවා වෙනුවට එම ප්‍රශ්නය අවුලෙන් අවුලට පත් කිරීම පමණයි. හොඳ චේතනාවකින් ඉදිරිපත් කළත් කුඹුරු පනතිනුත් සිදු වුණේ එයයි.

ගරු කථානායකතුමනි, නීතියකින් පමණක් මේ ප්‍රශ්නය ලිහීමට බැරි තත්ත්ව

වයක් තිබෙනවා. ඩොනමෝර් ආණ්ඩු කාලයේදී තමයි, වර්තමාන අගමැතිතුමාගේ පියා ඉඩම් ප්‍රශ්නය පිළිබඳව අළුත් පිය වරක් ගන්නට ඕනෑය කියන අදහසින් වැඩ කිරීමට පටන් ගත්තේ. අතිගරු ඩී. එස්. සේනානායක අගමැතිතුමා ධනේශ්වර ක්‍රමය යටතේ කෘෂිකර්මයේ යෙදෙන අමුතු ව්‍යාපාරිකයන් පිරිසක්—ගැමි මහත්වරුන් පිරිසක්—ඇති කිරීමේ අදහසින් ඉඩම් බෙදා දීමේ ව්‍යාපාරයක් පටන් ගත්තා. එතුමාට ඒ අදහස කොහෙන් ආවාද කියා බැලුවොත්, 1927 දී එදා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවට ගියු ක්ලිෆර්ඩ් මහතා ඉදිරිපත් කළ රාජාසන කථාවේ මේ අදහස මුලින්ම ගැබ් කර තිබෙන බව පෙනෙනවා. මේ කථාව ගැන දැන ගන්නට කාට හෝ වුවමනා නම් සොයා ගන්නට පුළුවන් කොහෙන්ද කියා මම කියන්නම්. ලංකාවේ ඉඩම් මැනීම සහ සිතියම් පිළිබඳව ආර්. එල්. බ්‍රෝහියර් මහතා විසින් ලියා ඇති පොතේ මේ කථාව සම්පූර්ණයෙන් විස්තර කර තිබෙනවා. 1927 අවුරුද්දේදී ගියු ක්ලිෆර්ඩ් මහතා තමයි කිව්වේ, අපේ රටේ කෝපි වගාව, තේ වගාව කිරීම සඳහා රජයේ ඉඩම් දීම යුක්තිසහගතය කියා. මේ රටේ ජනගහණය වැඩි වන අන්දමට සරිලන සේ, ජනතාවට ජීවත් වීම සඳහා පිළිවෙළක් සලස්වන්නට නම් රජයේ ඉඩම් වලින් කොටසක් ගැමි ජනතාව අතරේ බෙදා දිය යුතුය යන අදහස මුලින්ම ඉදිරිපත් කළේ සර් ගියු ක්ලිෆර්ඩ් මහත්මයායි. ඒ අදහස අවුරුදු ගණනාවක් නිස්සේම ක්‍රියාත්මක වූයේ නැහැ. එහෙත් ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ ඉඩම් පිළිබඳ ඇමති නිලය දැරූ අතිගරු ඩී. එස්. සේනානායක මහතා රජයේ ඉඩම් බෙදා දීමේ වැඩ පිළිවෙළක් පටන් ගත්තා. 1956 ඉඩම් පිළිබඳ ඇමති නිලය දැරූ, අදත් එම නිලය දරන ගරු ඇමතිතුමා ඒ පිළිවෙළ තවදුරටත් ක්‍රියාත්මක කරන්නට උත්සාහ කළා. එහෙත් ඒ වැඩ පිළිවෙල යටතේ වුණත්, අපේ ගැමියන්ගේ ප්‍රශ්න විසඳී නැහැ. ඒ ඇත්ත අප කවුරුනුත් පිළිගත යුතුයි.

ඇත් තත්ත්වය ඊටත් වඩා හාත්පසින් වෙනස් පිළිවෙළකටයි පවතින්නේ. එම නිසා ඒ ලෙඩය සුව කිරීම සඳහා ඊට වඩා වෙනස් විධියේ බෙහෙතක් සෙවිය යුතුව තිබෙනවා. එහෙත් ඒ බව කල්පනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නේ නැතිව, මෙවැනි ව්‍යාජ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරමින් රට මුළා වට පත් කරන්නට බලාපොරොත්තු වන රජය කෙරෙහි අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. ගරු මන්ත්‍රී වරුන්ට වැරදි හැඟීම් දෙන්නට වුවමනා වක් නැහැ. තමුන්නාන්සේලා තරයේම කියනවා නම්, මේ පනත් කෙටුම්පත ඡන්දයට ඉදිරිපත් කරනවා නම්, මෙය සම්මත කර ගන්නට අපේ ඡන්දයත් ලැබේවි. එහෙත් මේ පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කොට, නියම හර යක් ඇති කිරීමට අප බලාපොරොත්තු වෙනවා. තමුන්නාන්සේලාට අභියෝග කරනවා, අපේ සංශෝධන පිළිගන්නා ලෙස.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඔබතුමාගේ සංශෝධනයක් මා ඊයේ භාර ගත්තා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මේ පනත් කෙටුම්පත ටිකක් පැහැදිලි කරවීම සඳහා, එහි සමහර වචනවල අර්ථය විස්තර කර දීමේ කොටස සංශෝධනය කරවා ගන්නට කළ ඉල්ලීමට ටිකක්වත් කන් දී තිබෙනවා. එහෙත් එය මදි. තවත් සංශෝධන තිබෙනවා. ඒ සංශෝධන මම කියන්නම්. අපේ සංශෝධන පිළිගන්න වාද නැද්ද කියා දැන්ම දන්වන ලෙස ඇමතිතුමාට මා අභියෝග කරනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කිසි දෙයක් හදිසියෙන් කරන්නට බෑ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මා කියන දේවලට කරුණාකර ටිකක් ඉවසිල්ලෙන් ඇහුම්කන් දෙන්න. මේ පනත් කෙටුම්පතින් නින්දගම් විස්තර කර දී තිබෙන්නේ පරවේණි පංගුවටයි, මාරු වන පංගුවටයි සීමා කරලයි. පදිංචියට පාවිච්චි කරන හා ඇත්තටම ගොවිතැන් කරන බණ්ඩාර ඉඩමක් හැර, පරවේණි පංගු හා මාරු වන පංගු අත්හළ පසුව, කෘෂි කාර්මික, කාර්මික, වෙළෙඳ ව්‍යාපාරයන් සඳහා හෝ ආගමික කටයුත්තක් සඳහා හෝ යෙදූ ඉඩම් හැර, පාළුවට ගිය මුඩු බිම් හැටියට තිබෙන ඉඩම්, මූකලාන ඉඩම්, පාවිච්චි නොකරන ඉඩම් යන සියල්ලම ජනසතු කරන ලෙස මා රජයෙන් ඉල්ලා සිටිනවා. ඒ සංශෝධනය භාර ගන්න ලැස්තිදැයි ඉඩම් ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. ඇත්තටම නින්දගම් නැති කරන්නට, වැඩවසම් ක්‍රමයේ නෂ්ඨාවශේෂ ඇත්තටම නැති කරන්නට තමුන්නාන්සේලා තුළ බලාපොරොත්තුවක් තිබෙනවා නම්, පංගුවලට පමණක් සීමා වුණු නින්දගම් පනතකින් ඒ බලාපොරොත්තුව ඉෂ්ට කර ගන්නට බැහැ. මේ වාගේ පනතකින් ඇති වන්නට පුළුවන් වාසියේ සීමාව මම පෙන්වා දෙන්නම්. මෙයින් සම්පූර්ණ ප්‍රයෝජනයක් අත් වන ආකාරයට අප ගෙනෙන්නට බලාපොරොත්තු වන මූලික සංශෝධනය මෙයයි: මේ පනත් කෙටුම් පතේ "නින්දගම්" යන වචනයට දී තිබෙන අර්ථය සීමිතයි. එය සීමා කර තිබෙන්නේ පරවේණි පංගුවලට හා මාරු වන පංගුවලට පමණයි. කෘෂිකාර්මික, කාර්මික, වෙළෙඳ හෝ ආගමික කටයුත්තකට යොදා නැති ඉඩම්, පදිංචියට පාවිච්චි නොකරන බණ්ඩාර ඉඩම් හැර—රදළයකු වුණත් වාසය කරන ගෙයින් පන්නා දමන්නට අප උත්සාහ කරන්නේ නැහැ—සාමාන්‍යයෙන් ගොවිතැන්වලට පාවිච්චි නොකරන මුඩු බිම්, මූකලාන ඉඩම්, කැලෑ ඉඩම් යන මේ සියල්ලම රජය සතු කරන්නැයි අප ඉල්ලා සිටිනවා. අප ගෙනෙන සංශෝධනය, එයයි, එය පිළිගන්නවාද නැද්ද කියා කරුණාකර දැනුම් දෙන්න.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.**
(අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டார நாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

සීතා ඉඩ දෙන එකක් නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ සංශෝධනය පිළිගන්නේ නැත්නම් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

තිබෙන්නේ ව්‍යාජ අදහසකින් බව මා කියන අතර, එය මුළු රටටමද ස්ථිරවම ඔප්පු වන බව මා තරයේම කියා සිටිනවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
සීතා නෝනාගෙන් අහල—

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

එක් අතකින් එකම තත්ත්වයක සිටින ගරු ඉඩම් ඇමතිතුමාටත් මටත් නෝනලා ගෙන් යම් යම් කරුණු අසන්නට යාම ටිකක් අමාරු වැඩක්. ඒ කෙසේ වෙතත්, මා ගරු ඇමතිතුමාට කියන්නේ මගේ ඉල්ලීම පිළිගන්නේ නැත්නම් එතුමාගේ මේ පණතින් වැඩක් නැති බවයි. නින්දගම් ඉඩම් පිළිබඳව පවතින ඇත්ත තත්ත්වය මොකක්ද? මුලින් තිබුණු තත්ත්වය අනුව ඒවා විකුණන්නට බැහැ. එහෙත් පසුව විකුණා ගන්නට පුළුවන් තත්ත්වයක් ඇති වුණා. පරවේණි පංගුවල සිටින නිළකාරයන් මුල් අය නොවෙයි. මුල් අයගේ පෙළපතින් ආ අයත් නොවෙයි. පරවේණි පංගු කොටස් කර කැබැලි කර විකුණා තිබෙනවා. ඒ නිසා ඒවායෙහි වෙනත් අය පදිංචි වී සිටිනවා. මාරු පංගු සම්බන්ධයෙනුත් එසේම සිදු වී තිබෙනවා. බණ්ඩාරගම්වලත් දැන් වෙනත් අය පදිංචි වී සිටිනවා. අඳේට දුන් මුත්තෙට්ටු ඉඩම් හා බණ්ඩාරගම්වලත් වෙනත් අය පදිංචි වී සිටිනවා. මේවා ගැන මේ පණතේ වචනයක්වත් සඳහන් වී නැහැ. එහෙම නම් මේ ප්‍රශ්නය මේ පණතින් නිරවුල් කරන්නේ කොහොමද?

ඇත්ත වශයෙන්ම ගරු කථානායකතුමනි, නින්දගම් ප්‍රශ්නය පිළිබඳව වැදගත් වාර්තා කීපයක් අපේ රටේ තිබෙනවා. උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාවත් ඉන් පසුව පළ වුණු නින්දගම් හා විහාර දේවාලගම් පිළිබඳ 1956 සැසි වාර්තාවත් ඉන් සමහරක්. මෙම වාර්තාවලින් පැන නගින, ගරු ඉඩම් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු විය යුතු කරුණු රාශියක් තිබෙනවා. නින්දගම් පිළිබඳව ඩොයිලි කියා තිබෙන පිළිවෙළ මෙන්න:

"උඩරට පළාත්වල පැතිර පවතින මේ විශේෂ වැඩවසම් බුත්ති ක්‍රමයේ ආරම්භය රටේ [illegible] නොමැතිව මිල මුදල් හිඟව තිබූ කාලයේ සිදුව ඇති අතර එය දේශපාලන හා සාමාජික නොහොත් ගෘහර්ථ පාලනයත් සැප පහසුවත් පිළිබඳ උපාය මාර්ගයක් ලෙස පැතිර ගියේය. කොටින් කිව හොත්, කිවයුත්තේ නිලකාරයන් විසින් අධිපතියාට කරන ලද්දාවූ ද කළ යුතු වූද සේවාවලට කුලී වශයෙන් ඉඩම් දී ඇති බවයි."

මේ වාර්තාවෙන් විශේෂයෙන්ම පෙන්නුම් කෙරෙන දෙයක් නම් ඉඩම් පිළිබඳ ප්‍රශ්නයයි. මුලින් කී පිළිවෙලට, නීතිගත කරන ලද පිළිවෙලක් අනුව අයිතිය ඔප්පු කිරීමේ ක්‍රමයක් අපේ රටේ තිබුණේ නැහැ. දේපල ක්‍රමය අනුව—විශේෂයෙන්ම ධනේශ්වර දේපල ක්‍රමය අනුව—තම අයිතිය පෙන්නුම් කරන ලෙස ගැමියන්ට දැන්වූ නමුත්, පරම්පරා කීපයක් තිස්සේ, ශතවර්ෂාධික කාලයක් මුළුල්ලේ බුත්තිය අනුව පදිංචි වී සිටි ගැමියන්ට එය ඔප්පු කරන්නට බැරි වුණා. ඒ අනුව, මුඩුබිම් පනත යටතේ එම ඉඩම් රජයට අයිති වුණා. ඒ තත්ත්වය තවමත් එසේම පවතිනවා. ගැමියන් ඉඩම් මණින පිළිවෙල ගරු ඇමතිතුමා දන්නවාද? අමුණු, කුරුණි, පැල යන වචන ගැමියන් ඉඩම් මැණීමේදී පාවිච්චි කරන බව ඉඩම් නිරවුල් කිරීමේ පනත ක්‍රියාත්මක කරන අවස්ථාවේදී ගරු ඇමතිතුමා දකින්නට ඇති. ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් පිළිවෙලක් යොදා තිබෙනවා. වී වගාව සඳහා පාවිච්චි කරන තෙත් කලාපයේ ඉඩම්වල අමුණක් වශයෙන් සැළකෙන්නේ අක්කර දෙකයි. වියලි කලාපයේ නම් අක්කර පහයි. මඩ බිම් නැතිව ගොඩ බිම් නම්, එසේ නැත්නම් හේන් ගොවිතැනට පාවිච්චි කරන වියලි කලාපයේ ඉඩමක් නම්, අක්කර 40 ටත් නගින්නට පුළුවනි. කුරක්කන් පමණක් වගා කරන ඉඩමක නම් අමුණක් හැටියට සලකන ප්‍රමාණය අක්කර 40 ක් දක්වා නගින්නට පුළුවනි. එම නිසා මේ විධියට ධාන්‍ය වගාවෙන් ලබන අස්වැන්න මැණ ගන්නා පිළිවෙළේ හැටියට ඉඩම මණින පිළිවෙලක් තිබෙන තැන්වල, තවමත් නිරවුල් කර නොමැති තැන්වල, මේ පනත ක්‍රියාත්මක කරන්නට යන්නේ කෙසේද කියා මා ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරනවා. කොහේද මේ පංගුවල සීමාවල් අඳින්නට යන්නෙ? තමුන්නාන්සේ මේ පනත් කෙටුම්පත සකස් කරන්නට ඇත්තේ විහාරගම් දේවාලගම් හා නින්දගම් ඉඩම්වල බුත්තිය පිළිබඳ කොමිසමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාර්තාව අනුවයි. මේ වාර්තාවේ තිබෙන වගන්ති කීපයක් තමුන්නාන්සේ කියවා බැලුවාද? මෙන්න බලන්න. 55 වන පිටුවෙන් මා කියවන්නෙ:

"92. අප විසින් අසන ලද සාක්ෂි හා වැඩවසම් ක්‍රමය පිළිබඳව අප දැන උගත් දේ අනුව මීට වඩා ඉදිරියට යැමට පෙර මූලික වටිනාකමක් ඇති ඇතැම් ප්‍රශ්න නිරාකරණය කළ යුතු යැයි තරයේම හැඟේ. මේ ප්‍රශ්න නම්:

(1) විහාරගම්, දේවාලගම් හා නින්දගම්වලට ඉදිරිපත් කරන අයිතිවාසිකම් රජය මගින් නිරවුල් කර දීම."

1956 වර්ෂයේදීයි මේ නිර්දේශය කළේ. නමුත් තවමත් එය කර නැහැ.

"(2) බණ්ඩාර ඉඩම් හා පරවේණි පංගු අතර ඇති නියම සම්බන්ධය, ඒවායේ විශාලත්වය හා එකිනෙක පිහිටීම."

මේවා කළ යුතු යයි නිර්දේශ කළා. නමුත් තවමත් නිසි විධියට ඒවා කර නැහැ. මෙන්න තවත් තැනක්:

"118. රජයේ අයිතිවාසිකම් නිරවුල් කිරීම සඳහා අප ඉදිරිපත් කරන නිර්දේශ සාරාංශය මෙසේය:—

(1) විහාර ඉඩම් පිළිබඳ කොමසාරිස්වරුන්ගේ ඉල්ලීම පිට සකස් කළ, තිකුත් නොකරන ලද විහාර හිමිකම් පිඹුරුවලට ඇතුළත් නින්දගම්, විහාරගම් හා දේවාලගම්වලට රජයේ යම්කිසි අයිතියක් තිබේ නම් එය ඉක්මණින් නිරවුල් කිරීම."

තවත් නිර්දේශයක්, නමුත් ඒකත් කර නැහැ:

"119. එක් එක් විහාරගම්, දේවාලගම් හා නින්දගම්වල ඇති පරවේණි පංගු පෙන්වන ලේඛන ඇතත් බණ්ඩාර ඉඩම් පිළිබඳව කිසිම ලේඛනයක් නොමැති බව අපේ වාතර්ාවේ 76 වෙනි ඡේදයෙන් පෙන්වා දුන්නෙමු. පරවේණි පංගුවල මායිම් ගැන විස්තර නොමැති බවත් පංගු ඉඩම්වල වපසරිය වර්ග ප්‍රමාණයට පෙරළීමේදී සිදු විය හැකි වෙනස ගැනත් සඳහන්කොට ඇත."

ඒ වැපිරීම අනුව ඉඩම් ප්‍රමාණය මැනීමයි. ඒ අනුව ඉඩම් ප්‍රමාණය අක්කරවලට පරිවර්තනය කරන්නට ගියාම ඇති වන අවුල් ගැනයි සඳහන් කළේ. ඒ අනුව මේ ඉඩම් කොහෙන්ද නවතින්නෙ? පංගු කොහෙන්ද පටන් ගන්නෙ? නියම ඉඩම් මැනීමක් කරන්නට තමුන්නාන්සේ දන්නවත් පටන් ගත්තාද? ඉඩම් දෙපාර්තමේන්තුව මගින්, ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මගින්, මේ කටයුත්ත කිරීම ආරම්භ කරලවත් තිබෙනවාද? එසේ නැත්නම් මේ කටයුත්ත ආරම්භ කරන්නට උත්සාහ කරන්නේ මේ පනත් කෙටුම්පත සම්මත වූවාට පසුවද? එතකල්ද බලා ඉන්නෙ?

ගරු කථානායකතුමනි, මේ වාර්තාවේ 77 වැනි ඡේදයේ තිබෙන්නේ මෙන්න මේ ආකාරයටයි:

"පරවේණි පංගු ඇතුළු විවිධ ඉඩකඩම් පිළිබඳ ලේඛනයක් රාජකාරි ලේඛනවලට ඇතුළත්ව ඇති නමුත් මායිම් දක්වා නොමැති බැවින්, ඒවායේ පිහිටීම නිවැරදිව දැන ගැනීමට නුපුළුවන."

ඒවායේ පිහිටීම නිවැරදිව දැනගැනීමට නුපුළුවන් බවයි මේ වාර්තාවේ සඳහන් කර තිබෙන්නේ. කරුණු මෙසේ තිබියදී මේ පනත ක්‍රියාත්මක කරන්නට යන්නෙ කොහොමද? මේ වාර්තාව සැහැල්ලු අදහසකින් ඉදිරිපත් කළ දෙයක් නොවෙයි. පුළුවන් තරම් හොඳින් කරුණු සොයා බලා මේ සම්බන්ධ විග්‍රහයකුත් කර ඉදිරිපත් කරන ලද වාර්තාවක් තමයි මෙය. එසේ තිබියදී, මේ ප්‍රශ්නය ගැන එක වචනයක්වත් ගරු ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වේ නැහැ.

මේ වාර්තාවේ එක් තැනක, මේවා නිරවුල් කරන්නට ගියොත් බණ්ඩාර ඉඩම් හිමියන් සහ පරවේණි පංගුවල සිටින නිලකාරයන් අතර ඇති වන්නට පුළුවන් ආරාවුල් ගැන පෙන්නුම් කර තිබෙනවා. ගරු ඇමතිතුමා මේ වාර්තාව කියවා නැති බවයි අපට පෙනී යන්නේ.

මෙන්න මේ වාර්තාවේ 247 වැනි ඡේදයේ අඩංගු දේ:

"මෙය සතුටින් පිළිගන්නා යහපත් වෙනස් වීමක් විය හැකි බව අපේ හැඟීමයි. නොසැලකිලිමත් ලෙස ගොවිතැන් කළ ඉඩම්, මේ ක්‍රමය නිසා ඉතාමත් ඕනෑකමින් ගොවිතැන් කිරීම, රටේ ගොවි ද්‍රව්‍ය වැඩිවීමට නිසැකව හේතු විය හැක. නින්දගම්වල අයිතිය පිළිබඳව නින්දගම් හිමියන් හා නිලකාරීන් අතර වඩාත් විශාල අරගල ඇති වීමට ඉඩ ඇති බව කෙසේ හෝ වටහා ගත යුතුය. ඇත්ත වශයෙන්ම ඇතැම් අවශ්‍ය ඉඩම් පිළිබඳවත් නිලකාරයින්ගේ හා නින්ද හිමියන්ගේ අයිතිවාසිකම් නිරවුල් කිරීමට ක්‍රමයක් නොසැළසුවහොත්, ඔවුන්ගේ ඉඩම් වශයෙන් සාධාරණව ඉදිරිපත් කරන අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමේදී ඊට සම්බන්ධ සියලු දෙනාට මහත් කරදරවලට මුහුණ පෑමට සිදු වන බව පවා කිව හැක."

මේ කරුණු ගැන ගරු ඇමතිතුමා කල්පනා කර බලන්නේ නැද්ද? මේ කරුණු ගැන මතක් කර දෙන්නේ මේ නිසයි. බණ්ඩාර ඉඩම්වල අයිතිය කොහෙන්ද නවතින්නේ? ඒවායේ මායිම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

පටන් ගන්නේ කොතැනින්ද? පංගු පටන් ගන්නේ කොහෙන්ද? මේවා නිසි විධියට තවමත් නියම කර නැහැ. මෙන්න මේ විධියේ තත්ත්වයක් තිබියදී මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවනැයි ගරු ඇමතිතුමා කල්පනා කරන්නේ කොයි අන්දමින් දැයි මං අහනවා. මේ ඉඩම් මැනීමට අපේ ඉඩම් ඇමතිතුමා ගන්නට බලාපොරොත්තු වන පියවර කුමක්ද? අපේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මේ කටයුත්ත කරන්නට පටන් ගත්තොත් කවදා තරමට ඒ කටයුත්තේ නිමාවක් දකින්නට පුළුවන් වේදැයි ගරු ඇමතිතුමා ගෙන් මා අහනවා. අද අපේ කැලෑ ඉඩම්, බණ්ඩාර ඉඩම්, මුත්තෙට්ටු ඉඩම්, ගොඩ ඉඩම්, මඩ ඉඩම් යනාදි සියල්ලම නිසි විධියට මනින්නට—මේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා—අවුරුදු කීයක් ගත විය හැකි දැයි ගරු ඇමතිතුමාට කියන්නට පුළුවන්ද?

මා මේ කරුණු සවලපය ඉදිරිපත් කළේ මේ පනතට විරුද්ධ වන්නට නොවෙයි. මේ පනත මේ විධියට ඉදිරිපත් කළත් ඊට සහාය දෙන්නට අප ලැස්තියි. එහෙත් ඒ ගැන මේ රටට කියන්නට ඕනෑ නියම තත්ත්වය. මෙයින් යම්කිසි වාසියක් බලාපොරොත්තු වන ගැමි ජනතාවට මේ ගැන කරුණු පැහැදිලිව කියා දෙන්නට ඕනෑ. මෙය වැදගත් කාරණයක්. මෙයින් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන සහනයක් නොවෙයි ලැබෙන්නේ; තමුන් නාන්සේලා බලාපොරොත්තු වන ඒ සහනයක් දීමට මීට වඩා වෙනස් විධිවිධාන යොදන්නට සිද්ධ වෙනවා. ඒ බව මේ ගරු සභාව මගින් ගැමි ජනතාවට පැහැදිලිව කියන්නට ඕනෑ.

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කළ පිළිවෙල අනුව නියම විධියට මැනීමක් කරන්නට ඇත්ත වශයෙන්ම යන වියදම ගැන මේ වාර්තාවේ කියා තිබෙනවා. මුදල් හිඟයක් ගැන, මුදල් අමාරුකම් ගැන කථා කරන මේ ආණ්ඩුව ලැහැස්තිද ඒ සඳහා වුවමනා කරන මුදල වියදම් කරන්න? මේ මිනින් දෝරු කටයුතු කරන්ට ආණ්ඩුව සූදානම්ද කියා මා අහනවා. ගරු කථානායකතුමනි, මෙන්න මේකයි, තත්ත්වය.

මේ පනතේ තිබෙන තවත් විශාල අඩු වක් ගැන මතක් කර දෙන්ට ඕනෑ. ගරු ඇමතිතුමාගේ අදහසේ හැටියට වැඩ වසම් ක්‍රමයේ ශේෂයන් තිබෙන්නේ පළාත් හතක පමණයි. උතුරු සහ නැගෙනහිර පළාත්වල වැඩ වසම් ක්‍රමය ගැන මේ පනතේ වචනයක්වත් නැහැ. ජාතික ආණ්ඩුවක් වීමට හිමිකම් කියන මේ ආණ්ඩුව, ද්‍රවිඩ ජනතාවගේ සාධාරණ අයිතිවාසිකම් රකිනවා කියන මේ ආණ්ඩුව, ඇත්තටම ද්‍රවිඩ ජනතාව අතරේ රදළ අයිතිවාසිකම් කියා ගන්නා කොට සක් සිටිනවා නම්, ඒ උදවියගේ අයිති වාසිකම් රකින්ට ලැහැස්ති වුණොත්, තමුන්නාන්සේලාගේ ඊනියා ජාතික ආණ්ඩුවට විරුද්ධව ඒ ද්‍රවිඩ පෙදෙස්වල සිටින දුප්පත් ගැමියන්ගේ අයිතිවාසි කම් ආරක්ෂා කර ගන්නට ඉදිරිපත් වෙන්නෙ මේ විරුද්ධ පාර්ශ්වයේ සිටින අප බව ආඩම්බරයෙන් අපට මතක් කරන්ට පුළුවන්. ගරු ඉඩම් ඇමතිතුමාට උතුරු නැගෙනහිර පෙදෙස්වල තිබෙන රදළ ක්‍රමය පෙනිල නැහැ. එහි සිටින වන්නියාර්ලගෙ, උසස් පැලැන්තියට අයත් වෙල්ලාල මහත්වරුන්ගෙ වැඩ වසම් ක්‍රමය මතක් වෙලා නැහැ. ඉඩම් ඇමතිතුමාට රදළ ක්‍රමය නැති කරන්ට වුවමනා වෙලා තිබෙන්නෙ සිංහල පළාත් වල පමණක්ද? ද්‍රවිඩ ජනතාව අතරේ සිටින ඒ දුප්පත් ගැමියන්ගේ අයිති වාසිකම් ගැන දැන්වත් කල්පනා කරන ලෙස මා මතක් කරනව. රදළ ගසාකන් නන්ගෙන් මේ දුප්පත් ගැමියන් බේරා ගන්ට කියා කොපමණ ඉල්ලුවත් මේ ඇමතිතුමා යටතේ නම් ඒ කාරණය ඉෂ්ට වෙයි කියා මගේ කිසිම විශ්වාස යක් නැහැ.

ගරු කථානායකතුමනි, මේ පනතේ තිබෙන දුර්වලකම් රාශියක් පෙන්වා දෙන්ට පුළුවනි. මේ පනත ක්‍රියාත්මක කරන්ට කොයි විධියේ සංවිධානයක් ඇති කරන්ටද, ගරු ඇමතිතුමා බලාපො රොත්තු වෙන්නෙ? හිමිකම් ගැන තීර ණය කිරීමට මණ්ඩලයක් පත් කිරීමෙ නුයි. මේ ආරංචිය මට ලැබී තිබෙන නිසා මම දන්නව, කලින් එතුමං අදහස් කර තිබුණේ ඒ ඒ පළාත්වල ශාඛා ඇති කරල ඒවා මගින් මේ වැඩ කටයුතු කර ගෙන යන්න බව. ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විරුද්ධත්වය දැක්වූ නිසා ගරු ඇමතිතුමාට ඒ අදහස අත් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්නට සිද්ධ වුණු බවට මට ආරංචියක් ලැබී තිබෙනවා. ගරු ඇමතිතුමා මේ අවස් ථාවේ නිකම් මුහුණෙන්වත් පෙන්වන්නෙ නැහැ, මේ කියන දේ ඇත්තද නැද්ද කියා. ඇත්තටම මේ ඉදිරිපත් කර තිබෙන පිළිවෙල අනුව මේ පත් කරන මණ්ඩලයේ සභාපති හැර දහ හතර දෙනකු සිටිනවා. මේ දහ හතර දෙනා සභාවක් වශයෙන් එකවර රැස්වුණොත් මණ්ඩලයෙන් කිසිම වැඩක් කෙරෙයි කියා මා විශ්වාස කරන්නෙ නැහැ. එවිට මෙක විවාද වීමේ මණ්ඩලයක් වෙයි. මේ දහ හතර දෙනාම එකවර රැස් කර යම් තීන්දුවක් ගන්නට ගරු ඇමතිතුමා බලා පොරොත්තු වෙනව නම්—

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
පැනල්ස්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
පැනල්ස්. මේ පැනල්ස් කියන එකෙන් අදහස් කරන්නෙ ඉඩම් වගේම මේ මණ් ඩලත් කෑබලිවලට කඩන්ට යනවා කියා යි. කෑබෙලිවලට කඩා ඊට පසු තමයි— [බාධා කිරීමක්]. එහෙම නැතිනම් මේකේ ඇති අර්ථයක් ඇත්තේ නැහැ. මෙහි ගණ පූරණය 3 දෙනයි. නමුත් 15 දෙනෙක් සිටිනවා. අතුරු මණ්ඩල 5කට කැඩුවොත් එක අතුරු මණ්ඩලයක සිටින්නේ 3 දෙනයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
3 කට කැඩුවොත් ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
5 දෙනයි. ගණපූරණය 3යි. මා කියන් නම් ගරු ඇමතිතුමාට මෙහිදී සිදු වී තිබෙන අමාරුව කුමක්ද කියා. ගරු ඇමතිතුමා බලාපොරොත්තු වුණා, එක් එක් පෙදෙස් වලට වෙන වෙන මණ්ඩල පත් කරන්නට. භාණ්ඩාගාරය ඒකට ඉඩ දුන්නේ නැහැ. එම නිසා එක මණ් ඩලයක් පත් කර ගත්තා, අනුරු මණ් ඩල පත් කර ගන්නට ඉඩ තබාගෙන. ඒ වෙනුවෙන් 14 දෙනෙක් පත් කර ගත්තා. දැන් මේ වැඩේට 14 දෙනා මදි යි. එක් මණ්ඩලයක් වශයෙන් වැඩ කරන්නට නම් 14 දෙනා වැඩියි. කෑබෙලි වශයෙන් විසිරී වැඩ කරන්නට 14 දෙනා මදියි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඇයි 5 ඒවා 3ක්. 3 ඒවා 5ක්. 2 ඒවා 7½ක්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මෙම ප්‍රශ්නය විසඳීම සඳහා ඉක්ම ණින් කටයුතු කරන්නට බලාපොරොත්තු වෙනවා නම්, විසිරී ගිය පිළිවෙළක් වශ යෙන් අතුරු මණ්ඩල ඇතුව කටයුතු කරන්නට බලාපොරොත්තු වෙනවා නම් මේ 14 මදියි. එහෙත් එක් මණ්ඩලයක් හැටියට එක් තැනක රැස් වී කටයුතු කරන්නට නම් 14 වැඩියි. එතකොට තීරණයක් අරගන්නට බැරි වෙනවා. මෙතැන එක්තරා විශෙෂ අඩුවක් තිබෙන බව පෙන්වා දෙන්නට ඕනෑ. 8 වන ඡේදයේ 2 වන උප ඡේදයේ මෙම මණ්ඩලයට පත් වන්නට බැරි උදවිය ගැන සඳහන් කරනවා. ඒ කවුරුන්ද ? සෙනෙට් සභිකයකු නම්, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු නම්, නින්දගම් ඉඩමක් පිළිබඳව යම්කිසි හිමිකමක් අයිතියක් හෝ වුවමනාවක් තිබෙනවා නම් එවැනි අයකු ඒ කොට සට ඇතුළත් වෙනවා. මා අහනවා, ආත් මාර්ථකාමී අදහසින් ඇඟිලි ගසන්නට හැකි සියළු දෙනාම මේ වගන්තියෙන් ඉවත් වෙනවාද කියා. නැහැ. මෙහි පාවිච්චි කරන වචනවලට අනුව එසේ වන්නේ නැහැ.

සිංහලෙන් කොපමණ මේ අණපනත් සකස් කළත් වලංගු වන්නේ මෙහි ඉංග්‍රීසි පිටපතයි. මෙහි ඉංග්‍රීසියෙන් තිබෙන title or interest කියන වචන දෙකෙන් මේ නින්දගම් පිළිබඳව ඇති සබඳතාවයන් සියල්ල අහෝසි වෙනවාද ? ඉවර වෙනවාද ? මෙම වචන දෙකෙන් සඳහන් වෙන ඒවා හැර වෙනත් විධියේ සම්බන්ධකම් තිබෙන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]
මෙම මණ්ඩලයට පත් කරන්නට හැකි අය පිළිබඳව මීට වඩා විස්තරයක් තිබුනොත් හොඳය කියා ගරු ඇමතිතුමාට මතක් කර දෙන්නට කැමතියි.

මෙම මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ ව්‍යවස්ථා හදන්නේ ගරු ඇමතිතුමායි. මණ්ඩලයට ඒ පිළිබඳව කිසිම අයිතියක් ඇත්තේ නැහැ. එම ව්‍යවස්ථා හැදුවාට පසු ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරනවා. පළ වුණු දා සිට ක්‍රියාත්මක වෙනවා. නමුත් මේ ගරු සභාවට ඒවා ඉදිරිපත් කරන්න ඕනෑ. මේ ගරු සභාවේ යෝජනාවක් මගින් එය සම්මත නුණොත් එදා සිට එය අවලංගු වූ හැටියටයි සලකන්නේ. ගරු කථානායකතුමනි, මා ගරු ඇමතිතුමාට මෙන්න මේ කරුණ මතක් කරන්න කැමතියි. දැන් මේ ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළ වූ දා සිට ඒවා ක්‍රියාත්මක කරන්න නැත්නම් ඒ යටතේ වැඩ කටයුතු කරන්න පටන් ගන්නවා. එහි තිබෙන යම්කිසි දුර්වලකමක් අප මෙහිදී පෙන්නුම් කරන නමුත් ගැසට් පත්‍රයේ පළ වූ දා සිට ඒවා ක්‍රියාත්මක වන නිසා එවැනි දුර්වල දේවලුත් ක්‍රියාත්මක වී අවසාන වෙන්න පුළුවනි. ගරු කථානායකතුමනි, එයින් ඇති වන හානියක් තිබෙනවා නම් මේ රෙගුලාසි අනුව ඒවා අවලංගු කර ඇමීමෙන් පසු ඒ සියල්ලටම සමාවක් දෙන්න පුළුවනි. ඒවා ඊට පසු අවලංගු වෙනවාය කියා සිතන්න පුළුවනි. නමුත් ඒ වන විට මේ රෙගුලාසිවලින් යම් හානියක් සිදු වී තිබෙනවා නම් එය ශුද්ධ කරන්න පුළුවන් වන්නේ නැහැ. එයත් වලංගු වෙනවා. ගරු කථානායකතුමනි, මේ පනතේ තිබෙන ප්‍රධානම අමාරුව මෙයයි. නින්දගම් හැටියට මෙහි විස්තර කර තිබෙන සීමිත පිළිවෙළෝ හැටියට, ගරු ඉඩම් ඇමතිතුමා විස්තර කර දෙන ඉඩම් ඇත්තටම නින්දගම්වලින් ඉවත් කළාසින් පසු මේ පනතින් කෙරෙන්නේ කුමක්ද? තමුන්නාන්සේලා කරන්න යන්නේ නිල කාරයින්ට අයිතියක් පවරා දීමේ පනතක් සකස් කිරීමයි. නිල හිමියන්ගේ නින්දගම් එක්තරා පිළිවෙළකට ඉවත් කර ඇමීමෙන් පසුව ඉතුරු වෙන ඉඩම් පිළිබඳව සඳහටම අයිතිය නිල හිමියන්ට පැවරීමේ පනතක් හැටියටයි මෙය පෙනෙන්නෙ. තමුන්නාන්සේගේ ඇත්තටම තිබෙන නින්දගමෙන් කෑල්ලක් කඩා නින්දගම්ය කියා පෙන්වා ඊට පසු ඒ සම්බන්ධ සම්පූර්ණ සින්නක්කර අයිතිය නිලකාරයින්ට පවරනවාය කියා කියනවා. නීතියේ අර්ථයෙන්ම එය කෙරෙනවාලු. නමුත් එම කෙටුම්පත් පනතින් සිදු වන්නේ අර ඉතුරු වන කොටසේ සින්නක්කර අයිතිය නින්දගම් හිමියන්ට පැවරීමයි. එවැනි පනතක් හැටියටයි මෙය ක්‍රියාත්මක වන්නේ. මේවා ගැන සිතන්නේ නැතුවද මේවා ගැන බලන්නේ නැතුවද මෙවැනි අනපනත් මේ සභාවට ඉදිරිපත් කරන්නෙ? ගරු කථානායකතුමනි, මේ කරුණ නිසා මේ පනතත් වෙනත් අන පනතුත් අතරේ ගැටීමක් තිබෙනවා නම් කොයි එකද වලංගු වන්නේ? මාෂල්ගේ නීති සංග්‍රහය අනුව නම් පසුව ගෙනෙන පනතයි වලංගු වන්නේ, කලින් සම්මත වුණ පනත නොවෙයි. තමුන්නාන්සේත් එය පිළිගන්නවා ඇති. නමුත් මේ අනුවද මේ පනතේ අර්ථය සොයන්න යන්නෙ? මේ පනතත් වෙන අන පනතුත් අතරේ ගැටීමක් තිබෙනවා නම් ඒ ගැටීම අනුව කොයි ආකාරයටද මේ පනතට අර්ථයක් දෙන්න යන්නෙ? ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා මේ පනතේ වචනයක්වත් කියා නැහැ. මේ දුර්වලකම් පෙන්වන්නේ මා මුලින් කී පිළිවෙළටම මේ පනතට විරුද්ධ වෙන නිසා නොවෙයි. මේ පනත නියම හැටියටම ගෙනාවොත් අපි අපේ ඡන්දය දෙනවා. අපේ සංශෝධනයන් ඇතුළත් කරවීමට පුළුවන් තරම් උත්සාහ දරනවා. අපේ ප්‍රධාන සංශෝධනය ගැන දැනටමත් ගරු ඇමතිතුමාට කියා තිබෙනවා. නමුත් විශේෂයෙන් මා කියන්නේ මෙය ව්‍යාජ පනතක් බවයි. මෙය බොරු පනතක්. මේ පනතින් තමුන්නාන්සේලා කරන කෙටි විස්තර ටිකවත් ඉටු වන්නේ නැහැ. තමුන්නාන්සේලාට වුවමනා කරනවා නම් මේ රටේ ඉඩම් ප්‍රශ්නය පිළිබඳව නියම විසඳුමක් කරන්න, ඒ සඳහා නියම වැඩ පිළිවෙළක් සකස් කරන්න, මේ ගරු සභාවෙන් මේ පනත සාකච්ඡා කිරීම පිණිස විශේෂ කාරක සභාවක් පත් කරන්න. එසේ විශේෂ කාරක සභාවක් පත් කරන මෙන් මා ඉල්ලා සිටිනවා. අපි ලැහැස්තියි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එවැනි කමිටුවක වැඩ කරන්න. අපේ රටේ අද තිබෙන ඉඩම් ප්‍රශ්නය පිළිබඳව නියම නිරවුල් තත්ත්වයක් ඇති කිරීම සඳහා මෙන්න මේ විධියට කටයුතු කළ යුතුය කියා යෝජනා කිරීමට—පෙන්නුම් කරදී මට—අපි කැමතියි.

දැන් වේලාව 7 යි. ඊළඟ සභා වාරයේදී තවත් කරුණු ඉදිරිපත් කිරීමේ බලාපොරොත්තුවෙන් මේ අවස්ථාවේදී මගේ කථාව අවසන් කරනවා.

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1968 මාර්තු 11 වන සඳුදා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 7.00 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது. 1968, மாச் 11, திங்கட்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.*

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Monday, 11th March 1968.*

## කල් තැබීම

### ஒத்திவைப்பு

### ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු සී. පී. ද සිල්වා].

" சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக "[கௌரவ சீ. பீ டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed,* "That the House do now adjourn".—[*The Hon. C. P. de Silva*].

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, අද මාතර රෝහලේ තත්ත්වය සම්බන්ධයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම් තුමියගේ අවධානය යොමු කර වීමට මා බලාපොරොත්තු වෙනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සභාග රජය සමයේදී මාතර ආරෝග්‍යශාලාවේ තදබදය වැළැක්වීම පිණිස තට්ටු තුනක ගොඩනැගිල්ලක් සඳහා මුල්ගල් තැබුවා. එම මුල්ගල් තැබීමෙන් පසුව එහි සියලුම කටයුතු කරන්නට සිද්ධ වුණේ අලුතෙන් පත් වුණ ආණ්ඩුවටයි. දැන් අවුරුදු තුනකුත් මාස තුනක් ගත වී තිබෙන නමුත් මේ ගොඩනැගිල්ලේ වැඩ කටයුතු හමාර කිරීමට තවමත් මේ ආණ්ඩුවට පුළුවන් වුනේ නැහැ. දැන් මාස ගණනාවක් තිස්සේ ආරෝග්‍යශාලාව ඉදිරිපිට ඇට සැකිල්ලක් වාගේ කිසිම වැඩක් නොකර මේ ගොඩනැගිල්ල ඔහේ තිබෙනවා. මාස අටක පමණ කාලයක සිට කිසිම වැඩක් කෙරී නැහැ. මෙය ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක්.

මෙම ආරෝග්‍යශාලාව, කථානායකතුමනි, ඡන්ද කොට්ඨාශ 10 ක ලෙඩුන්ට පිහිට වන ආරෝග්‍යශාලාවක්. එසේ වුණේ වී නමුත්, මෙම අලුත් ගොඩනැගිල්ල වහාම සම්පූර්ණ කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය සැලකිල්ලක් දක්වන්නේ නැති බව කනගාටුවෙන් ප්‍රකාශ කරන්නට සිද්ධ වී තිබෙනවා.

මෙම ගොඩනැගිල්ල ආරම්භ කළාට පසුව මාතර ප්‍රදේශයේ ඒ ඒ පුද්ගලයන් විසින් ආරම්භ කළ වෙනත් ගොඩනැගිලි රාශියක—විශාල ගොඩනැගිලි රාශියක— වැඩ අවසන් කර දැනට ඒවායේ වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යනවා. එහෙත් මෙම ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් කර ගැනීමට තවමත් ආණ්ඩුවට බැරි වී තිබෙනවා. එම නිසා මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා, මේ තත්ත්වය ගැන සොයා බලා වහාම මෙම ගොඩනැගිල්ලේ වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නය කියා.

මෙම ආරෝග්‍යශාලාවේ දැනට නේවාසික රෝගීන් 800ක් පමණ මහත් දුක් කම්කටොලු මධ්‍යයේ ප්‍රතිකාර ගනිමින් බොහෝම අමාරුවෙන් තමයි කල් ගත කරන්නේ. විශේෂයෙන්ම මාතර දිස්ත්‍රික්කය තුළ සිටින දුප්පත් ලෙඩුන් තමයි මෙම ආරෝග්‍යශාලාවේ සිටින්නේ. ඉතාමත් අමාරුවෙන් ඒ ආරෝග්‍යශාලාවේ ඔවුන් සිටින අතර, මෙම තදබදය නිසා එහි ඉතාමත්ම අපවිත්‍ර තත්ත්වයක් පව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ තුඩාවේ මයා.]

තිනවා. මා වෛද්‍ය නිලධාරීන්ට දොස් කියන්නේ නැහැ. ඒ මොකද? එහි අප විත්‍ර තත්ත්වය නැති කරන්නට බැරි වී තිබෙන්නේ තදබදය නිසයි. ඒ නිසා වහාම අලුත් ගොඩනැගිල්ල සම්පූර්ණ කර දෙන ලෙස මා අවධාරණයෙන්ම නැවතත් ඉල්ලා සිටිනවා.

දෙවැනි කාරණය මේකයි. එම ආරෝග්‍ය ශාලාවේ වෛද්‍ය නිලධාරිතුමා සම්බන්ධයෙන් මීට ප්‍රථම මා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී මෙම කාරණය ඉදිරිපත් කළා. එනම් මෙම වෛද්‍ය නිලධාරියාට සන්තෝෂමක් නොදී මේ රටේ කිසිම පුරවැසියකුට ඔහුගෙන් කිසිම සේවයක් ලබා ගැනීමට බැරි බවයි. විශෙෂයෙන් ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අයට වෛද්‍ය සහතික ආදිය ලබා ගැනීමට සිදුවන අවස්ථාවලදී ඒවා ලබාගත යුත්තේ මුදල් දී මෙනුයි. මෙම වෛද්‍ය නිලධාරියාගේ මේ කැත දූෂිත ප්‍රතිපත්තිය ගැන මා මෙම ගරු සභාවට කරුණු ඉදිරිපත් කළ විගසම ඔහු විසින් කර තිබෙන්නේ කුමක්ද? විශ්‍රාම ගැනීම සඳහා ලියවිලි ඉදිරිපත් කිරීමයි. එසේ ලියවිලි ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේදී මාතර කච්චේරියේ පැවැත්වුණ දිස්ත්‍රික් සම්බන්ධිකරණ කාරක සභාවේදී අපි ඉල්ලා සිටියා එම නිලධාරියා වහාම මාරු කර යවන්නය කියා. ඒ සමගම අප ඉල්ලා සිටියා දික්වැල්ලේ වෛද්‍ය නිලධාරියාත් මාරු කර යවන්නය කියා.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාගෙන් මට ලිපියක් ලැබී තිබෙනවා, කථානායකතුමනි, අර වෛද්‍ය නිලධාරියා විශ්‍රාම යාම පිණිස ලියවිලි ඉදිරිපත් කර තිබෙන නිසා මාරු කිරීමක් අවශ්‍ය නැත කියා. එහෙත් ඉන් පසුව මට දැන ගන්නට ලැබී තිබෙනවා, ඔහු විසින් ඉදිරිපත් කරන ලද විශ්‍රාම ලියවිලි ආපසු ඉල්ලාගෙන දැන් ඔහු දිගින් දිගටම සේවයේ යෙදී සිටිනවාය කියා. මෙන්න මේ විධියේ වංචාකාරී පිළිවෙළටයි ඒ නිලධාරියා ක්‍රියා කරන්නේ.

සෞඛ්‍ය ඇමතිතුමාට මා මතක් කරන්න කැමතියි, ආරෝග්‍ය ශාලාවේ පාලන කටයුතු හරියාකාර කරන්නට මෙම නිලධාරියාට බැරි බව. ආරෝග්‍ය ශාලාවේ කටයුතු සඳහා ඔහු නිරත විය යුතු කාලයේ සිදුහා ඔහු යොදන්නේ නැති අතර, වැඩි කාලයක් ඔහු යොදන්නේ ඔහුගේ පෞද්ගලික වැඩකටයුතුවලටයි. මෙවැනි නිලධාරියකුට මෙවැනි අඩුපාඩුකම් තිබෙන ආරෝග්‍ය ශාලාවක සිටින්නට ඉඩ දීම ආරෝග්‍යශාලාවේ තත්ත්වය සම්පූර්ණයෙන්ම පහත වැටීමට හේතුවක් වෙනවා. එම නිසා මෙම වෛද්‍ය නිලධාරියා වහාම මාරු කර මෙම ආරෝග්‍ය ශාලාව සැහෙන තත්ත්වයකට ගන්නට ආධාර කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

ගරු කථානායකතුමනි, දෙවැනි ප්‍රශ්නය මා ඉදිරිපත් කරන්නේ කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාටයි. එතුමාට මා ඉදිරිපත් කරන්නේ වැලිගම් කෝරළේ සමුපකාර සමිති සංගමයේ ඇති වූ ඉතාමත්ම භයානක තත්ත්වයක් ගැනයි. මේ සමුපකාර සමිති සංගමය මාතර දිස්ත්‍රික්කයේ තිබුණු හොඳම සමුපකාර සමිති සංගමය හැටියට එවකට එහි සිටි සමුපකාර සංවර්ධන උප කොමසාරිස් හපුදෙනිය මහතා වාර්තා කර තිබෙනවා. එමෙන්ම සමුපකාර ව්‍යාපාරයට ආදර්ශයක් දෙමින් ක්‍රියා කරන සමුපකාර සමිති සංගමයක් හැටියට වාර්තා කර තිබෙනවා. ගරු කථානායකතුමනි, අවාසනාවකට, මෙය මණ්ඩලයකට පැවරුවාට පසුව දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද? ආරක්ෂක අණපනත් යටතේ එහි සිටින නිලධාරීන් අස් කිරීමට දැන් වැඩ කරගෙන යනවා. ඒ අන්ද මට සේවකයින් අස් කරමින් කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් යවා ඇති ලියවිල්ලක් මා ගරු සභාවට කියවනවා:

" අංකය: ජී. ජී. 3/8/5 (33)

**1950 සමුපකාර සමිති ව්‍යවස්ථාවල 41(1) වැනි ව්‍යවස්ථාව යටතේ පනවනු ලැබූ ආඥාව**

1968 පෙබරවාරි 18 වැනි දින අංක 14,789/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ වූ නියෝගයෙන් වෙනස් කරනු ලැබූ, 1950 සමුපකාර සමිති ව්‍යවස්ථාවල 41(1) වැනි ව්‍යවස්ථාවෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වන බාලකුමාර් මහාදේව වන මම, මේ ආඥාවේ උප ලේඛනයේ සඳහන් සීමාසහිත වැලිගම කෝරළේ විවිධ සේවා සමුපකාර සමිති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංගමයේ සේවකයකු වන තැනැත්තාට ස්වකීය යුතුකම් කාර්යක්ෂම ලෙස ඉෂ්ට කළ නොහැකි බව අදහස් කරන බැවින්, මේ ආඥාවෙන් එකී තැනැත්තා එබඳු සේවක තනතුරෙන් පහ කරමි.

බී. මහාදේව,
සචිව ලේකම්,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය.

1968 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ 2.

උප ලේඛනය

සුමනසේන වීරසිංහ රාජපක්ෂ මහතා, කළමනාකරු, සීමාසහිත වැලිගම් කෝරළේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය, වැලිගම."

මෙවැනි තවත් ලියවිල්ලක් එම සංගමයේ බෝධිපාල සිරිවර්ධන මහතාටත් යවා තිබෙනවා.

ගරු කථානායකතුමනි, සමුපකාර සමිති ව්‍යාපාරයේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපය සම්පූර්ණයෙන්ම නැති භංග කර ආරක්ෂක අණපනත් ආයුධ කරගෙන මේ ව්‍යාපාරය ඒකාධිපති ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන්නට මේ ක්‍රියාමාර්ගය අනුගමන කරන්නේ මක් නිසාද කියා ගරු ඇමතිතුමාගෙන් මා අහනවා. ගරු කථානායකතුමනි, මේ නිලධාරීන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කිරීමක් නැහැ. තමන්ට තිබෙන චෝදනා ගැන දැනගැනීමටවත් ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමටවත් මේ නිලධාරීන්ට අවස්ථාවක් දී නැහැ. ඒ අන්දමට ඉඩක් නොදී එකවරටම නීතියේ බලය පාවිච්චි කර මේ නිලධාරීන් ඉවත් කර තිබෙනවා. එමෙන්ම මේ තත්ත්වය නිසා මේ සමුපකාර සමිති සංගමයේ සිටින සේවකයින් හැත්තෑ ගණනක් අද වැඩ වර්ජනයක යෙදී සිටිනවා. තමන්ගේ සේවයේ සුරක්ෂිත භාවය ගැන ඔවුන්ට විශ්වාසයක් නැහැ.

බෝධිපාල සිරිවර්ධන මහතාටත්, එස්. ඩබ්ලිව්. රාජපක්ෂ මහතාටත් හිමි වූ ඉරණම අනිකුත් සේවකයන්ටත් හිමි වන්නට පුළුවන්ය කියන විශ්වාසයක් ඔවුන් තුළ තිබෙන නිසා ඔවුන් අද වැඩ වර්ජනය කර සිටිනවා. ආරක්ෂක අණපනත් ආයුධ කරගෙන ඒවායේ මුවාවෙන් ගෙන යන මේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ව්‍යාපාරය නිසා මේ සමුපකාර සමිති සංගමයේ මහා භයානක තත්ත්වයක් ඇති වී තිබෙනවා. තමුන්නාන්සේලා සමුපකාර ව්‍යාපාරයට සලකන්නේ මෙහෙමද? මේ ක්‍රියාමාර්ගය කම්කරු නීති රීතිවලටත් සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මේ සේවකයින්ට යම්කිසි චෝදනාවක් තිබෙනවා නම් ඔවුන්ට ඒවා ඉදිරිපත් කර කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දීමේ යුතුකමක් තිබෙනවා. එසේ කර පරීක්ෂණයක් පවත්වා අස් කළ යුතු බව ඔප්පු වෙනවා නම් අස් කළාට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. එහෙත් මේ සේවකයින්ට චෝදනා ඉදිරිපත් කර නැහැ. ඔවුන්ට අවස්ථාවක් දී නැහැ. විභාගයක් පවත්වා නැහැ. ඒ කිසිවක් කරන්නේ නැතිවයි මේ ඉතාමත්ම වැරදි ක්‍රියාමාර්ගය අරගෙන තිබෙන්නේ.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
**(Mr. Neal de Alwis)**
කවුරු ඇඟිලි ගහලද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**
කවුරු ඇඟිලි ගහලාද මා දන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, සමුපකාර ව්‍යාපාරය සමුපකාර ව්‍යාපාරයක් හැටියට ගෙන යන්නට ඕනෑ. එය මිලිටරි ව්‍යාපාරයක් හැටියට නැති නම් ඒකාධිපති ව්‍යාපාරයක් හැටියට ගෙන යාමට උත්සාහ දරනවා නම් එය සම්පූර්ණයෙන්ම වැරදි බවයි මා විශ්වාස කරන්නෙ. එම නිසා මෙවැනි පියවරක් ගැනීමට හේතුව කුමක්ද, දැනට පවතින වර්ජන සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්ද, කියා ගරු ඇමතිතුමා පැහැදිලි කර දෙනවා නම් හොඳ බවයි කියන්න තිබෙන්නෙ.

අ. භා. 7.12

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන (අම්බලංගොඩ)**
*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன—அம்பலாங்கொடை)*
**(Dr. M. H. Saddhasena—Ambalangoda)**
ගරු කථානායකතුමනි, පළමුවන ප්‍රශ්නය ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගෙන් ඇසීමට මා කල්පනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

[වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන]

එනම් මෙයයි. ජාතික රජයෙ ආහාර වගා කිරීමේ මහා ව්‍යාපාරයට, මුළු මහත් ලංකාවේ ගොවි ජනතාවගේ සම්පූර්ණ සහයෝගය දක්වන මෙම අවදියේදී බොහෝ කලක් පුරන් වී තිබුණු විශාල වෙල්යායවල් එළිපෙහෙළි කොට වගා කිරීමේ කටයුතු ඔවුන් විසින් යුහුසුළුව කර ගෙන යාම සතුටට කරුණකි. මෙයට ආධාරයක් වශයෙන් රජය වගා ණය, අස්වැද්දුම් ණය, සහනාධාර ක්‍රමයට පෝර දීම, ආදී කටයුතු සැලැස්වීමත් මහත් සැනසීමට කරුණකි. එසේ නමුත් මෙම අස්වැද්දුම් ණය, වගා ණය ආදිය නිසියාකාර නොලැබීම හෝ ලබාගැනීමට නොහැකි වීම මහත් බාධාවක්ව පවතී.

දැනට සකස් කර ඇති පිළිවෙළ අනුව මෙම ණය විවිධ සේවා සමුපකාර සමිති මගින් නොව, ඒ ඒ ප්‍රදේශවල පිහිටුවා ඇති ගොවි කාරක සභා මගින් පිළිගත් ගොවියන්ට ලබා දීමට අවස්ථාව සලසන්නේ නම් කලට වේලාවට වුවමනා පරිදි මෙම ණය පහසුකම් ලබාගැනීමට අවස්ථාව සැලසෙනවා පමණක් නොව, එම ණය කොටස් වශයෙන් හෝ ලෙහෙසියෙන් ආපසු ගෙවීමටද දැනට පවතින ක්‍රමයට වඩා උපකාරී වෙයි. එම නිසා ලංකාවේ ඒ ඒ ප්‍රදේශවල පිහිටුවා ඇති පිළිගත් ගොවි කාරක සභා මගින්ම මෙම ණය පහසුකම් එම ගොවි මහතුන්ට ලබා දීමට කටයුතු කරන්නේ නම් දැනටත් වඩා ප්‍රබෝධයක් ඇති වන බව ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා පිළිගන්නෙහි ද?

ඇත්ත වශයෙන්ම සමහර ප්‍රදේශවල සමුපකාර සමිති ඉතා හොඳින් වැඩ කරන බව සත්‍යයක්. නමුත් මා කියන්න කණගාටුයි, මගේ ප්‍රදේශයේ තිබෙන ගාලු වැල්ලබඩපත්තුවේ විවිධ සේවා සමුපකාර සමිතිය නම් වැඩ කරන්නෙ කොමියුනිස්ට් හවුලක් වශයෙනුයි. එයින් කිසිම සහනයක් ගොවීන්ට සැලසෙන්නෙ නැහැ. කොයිතරම් මුදල් නාස්ති කළත්, කොයිතරම් අයවැය ගණුදෙනු කළත්, කිසි ලාභයක් පෙන්නුම් කරන්නෙ නැහැ. යාබද කොට්ඨාශවලට ගොස් බැලීමේදී පෙනී යනවා, විශාල ගොඩනැගිලි ඉදි කර ඇති අතර, සහනාධාර දීම ආදී කටයුතු කර තිබෙන බව. එහෙත්, මගේ කොට්ඨාශයේ ගොවීන් ඉතා උනන්දුවෙන් කටයුතු කරන නිසා, මෙම යල් පැන ගිය විවිධ සේවා සමුපකාර සමිති මගින් ණය පහසුකම් ලබාදීමේ ක්‍රමය වෙනුවට විශ්වාසවත් ගොවි මහතුන් නියැලී කටයුතු කරන ගොවි කාරක සභා මගින් මෙම සහනදායක කටයුතු වහාම සලස්වන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

දෙවන ප්‍රශ්නයද ඉතා වැදගත්. ආදායම් බදු ගෙවන උදවියට ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් කරන හිරිහැරය ගැනයි එම ප්‍රශ්නය. මා ඒ ගැන කරුණු ඉංග්‍රීසියෙන් දක්වන්නම්.

Is the Hon. Minister of Finance aware that there is no co-ordination among the different branches of the Income Tax Department, and that as a result very many innocent and genuine taxpayers are put into great inconvenience, expense and worry?

The Collection Branch, the Assessors' Branch and the Default Branch appear to be working in separate watertight compartments and do not correlate their functions. They do not appear to find out from each other about the facts of any single assessment, collection or default. Each branch appears to be working independently as a watertight compartment and the poor taxpayer is expected to go from one branch to the other and provide data.

This is scandalous in view of the fact that the taxpayer is the chief mainstay of the Government, and the paymaster of these various officers who appear to be assuming the role of dictators to the detriment of those who maintain them.

Is the Hon. Minister also aware that some assessors do not acknowledge receipt of appeals and letters and do not even grant interviews, not only to the taxpayer but even to the chartered accountants appointed by him on payment? Is the Hon. Minister further aware that though verbally at interviews they agree to the appeals and to waive their claims, no such intimation is made in writ-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ing ? As a result of these malpractices and harassments the poor taxpayers have to undergo untold sufferings, heart-aches and unnecessary expenses.

Will the Hon. Minister please take immediate steps to remedy this state of affairs ?

It is very necessary that this state of affairs be remedied because the taxpayer is being ruthlessly harassed by the officers of the department.

An officer working in one room does not take the trouble to find out from another officer working in another room in the same building what has happened to a file. There may be an appeal in respect of a particular case but the Claims Branch does not take the trouble to find out whether an appeal has been filed or not, before it takes action. No replies are sent to the letters of taxpayers in regard to their appeals and the Default Branch threatens legal action. Is this fair ?

The taxes no doubt must be collected, but surely the taxpayers should be shown some courtesy and consideration by the officers of the department.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Parliamentary Secretary to the Minister of Education will continue his reply of yesterday.

අ. භා. 7.18

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ගරු කථානායකතුමනි, විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් 11 දෙනකු අස් කිරීම පිළිබඳව ඊයේ සවස වලපනේ ගරු මන්ත්‍රීතුමා (වී. බී. එම්. හේරත් මයා.) විසින් ප්‍රශ්නයක් නඟන්නට යෙදුණා. උප කුලපති ස්වාමීන් වහන්සේගෙන් වැඩිපුර විස්තර ලබාගෙන නියම තත්ත්වය කුමක්දැයි අද දින මෙම ගරු සභාවට දන්වන බව ඒ අවස්ථාවේදී මා සඳහන් කළා. ඒ අනුව මා දැන් ඒ විස්තර ඉදිරිපත් කරනවා.

විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් 11 දෙනකු අස් කළ බව සඳහන් ප්‍රවෘත්තිය සත්‍යයකි. එසේ අස් කරන ලද්දේ විශ්ව විද්‍යාලයේ පාලනය සහ විනය ආරක්ෂා කර ගැනීම අවශ්‍ය හෙයිනි. අස් කිරීමට හේතු ඒ ඒ ශිෂ්‍යයන්ට විශ්ව විද්‍යාලයාධිපතින් වහන්සේ විසින් යවන ලද ලිපිවල සඳහන් කර තිබේ. විශ්ව විද්‍යාලයේ විනය හා පාලනය ආරක්ෂා කිරීම පිළිබඳ සම්පූර්ණ භාරය හා වගකීම විශ්ව විද්‍යාලයාධිපතින් වහන්සේ සතුය. එය 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනතේ 42 වන වගන්තියෙන් විශ්ව විද්‍යාලයාධිපතින් වහන්සේට පැවරී ඇත. වලපනේ ගරු මන්ත්‍රීතුමා කළ කථාවෙහි වැරදි තොරතුරු රාශියක් ඇතුළත් බව සඳහන් කළ යුතුය. විශ්ව විද්‍යාලයේ සේවකයන් හා වර්ජනය කරතොත් විශ්ව විද්‍යාලයාධිපතින් වහන්සේ ඊට සහභාගි වී අනුබල දෙනු ඇතැයි යන කියමන සම්පූර්ණ අසත්‍යයකි. මීට කලින් අස් කරන ලද්දේ ශිෂ්‍යයන් 65 දෙනකු නොව ශිෂ්‍යයන් 135 දෙනෙකි. ඒ 135 දෙනා අස් කිරීමට හේතු මෙසේය :

පසුගිය දෙසැම්බර් මාසයේ මුලදී පන්ති වර්ජනය පටන් ගත් අවස්ථාවේදී දෙසැම්බර් 10 වැනිදා පටන් 15 වැනිදා දක්වා සතිය තුළ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් නොකොට පන්තිවලට නොපැමිණෙන ශිෂ්‍යයන් විශ්ව විද්‍යාලයෙන් සිය කැමැත්තෙන් අස් වූවන් ලෙස සලකා ඔවුන්ගේ ලියාපදිංචි කිරීම අවලංගු කරන බව විශ්ව විද්‍යාලයාධිපතින් වහන්සේ විසින් ප්‍රවෘත්ති පත්‍ර මගින් හා ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් නිවේදනය කරන ලදී. මේ නිවේදනය ගැන නොසලකා නොපැමිණි ශිෂ්‍යයන් 135 දෙනෙක් අස් කරනු ලැබූහ. මේ 135 දෙනාගෙන් 62ගේ අභියාචනා ගැන සලකා බලා නැවත ඇතුළත් කර ගන්නා ලදී. අනතුරුව තවත් අභියාචනා 25ක් පමණ දැනට සැලකිල්ලට භාජන වී තිබේ. විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය හා පාලනය කඩාකප්පල් කොට, අවුල් කොට දහස් ගණන් ශිෂ්‍යයන්ගේ ඉගෙනීමට බාධා වන පරිදි ආරම්භ කළ මේ පන්ති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

වර්ජනයේ සංවිධායකයෝ, මූලිකයෝ ඒ 135 දෙනාට ඇතුළත් නොවූහ. එසේ හෙයින් වගකිවයුතු මූලිකයන් නායක යන් සොයා වාර්තා කිරීම සඳහා විශ්ව විද්‍යාලයාධිපතීන් වහන්සේ විසින් ත්‍රි පුද්ගල කොමිසන් සභාවක් පත් කරන ලදී. ඒ කොමිසන් සභාවේ සාමාජිකයෝ සනාතන සභාවේ සාමාජිකයන් නොව මහාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෝය. මේ කොමිසන් සභාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි සඳහන් කරුණු සුපරීක්ෂාකාරීව සලකා බැලූ විශ්ව විද්‍යාල යාධිපතීන් වහන්සේ චෝදනා ලැබූවන් ගෙන් 3 දෙනකු සම්පූර්ණයෙන්ම නිද හස් කර තිබේ. 10 දෙනකුට මාසයේ පටන් හය මාසය දක්වා එක එක ප්‍රමාණ යේ කාල සීමාවලට පන්ති තහනම් කොට තිබේ. 11 දෙනකු සම්පූර්ණයෙන්ම විශ්ව විද්‍යාලයෙන් අස්කර ඇත. පන්ති වර්ජනයට වග කිව යුතු නියම කඩාකප් පල්කාරී නායකයන් මේ අයයි. මේ ශිෂ්‍ය යන් කළ වැරදි බරපතළ ඒවා බව පැහැ දිළිව ඔප්පු වී තිබෙන නිසයි, ඔවුන් අස් කර තිබෙන්නේ. සුළු වැරදිවලට ශිෂ්‍ය යන් අස් කරන්නේ නැත.

අ. භා. 7.23

**විමලා කන්නන්ගර මිය.**

*(திருமதி விமலா கன்னங்கர)*

(Mrs. Wimala Kannangara)

ගරු කථානායකතුමනි, මාතර ආරෝග්‍ය ශාලාවේ ගොඩනැගිල්ල සෑදීම සඳහා 15 ලක්ෂයක් වෙන් කර තිබුණා. 1967.8.31 වන දින වනතුරු රජයේ වැඩ දෙපාර්ත මේන්තුවේ ගොඩනැගිලි සහ පාලම් අංශ යෙන් 4,45,000ක් වැය කර තිබුනා. එය ප්‍රමාද වුණේ දෙවැනි පියවරේ ලොකු කොන්ක්‍රීට් තට්ටුවක් ගහන්නට තිබුණු නිසයි. පාලම් අංශය ඒ කොන්ක්‍රීට් තට්ටුව ගහන තෙක් ප්‍රමාදයක් ඇති වුණා. එය ගසා අවසාන වුණාට පසු කොන්ත්‍රාත් කරුවන්ට භාර දී එය කරන්නටය කියා රජයේ වැඩ දෙපාර්තමේන්තුව කිව්වා. ඒ නිසා ඉතිරි වැඩ සඳහා 67.4.13 වැනි දින ටෙන්ඩර් පත්‍ර කැඳෙව්වා. එහෙත් ටෙන්ඩර් කරු වන් කිසි කෙනකු ඉදිරිපත් වුණේ නැහැ. දැනට රජයේ වැඩ දෙපාර්ත මේන්තුවෙන් තෝරා ගනු ලැබූ කොන් ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවා තිබෙනවා. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසාන වන්නේ 1968.3.19 වැනි දායි. එදාට කිසි කෙනකු ඉදිරිපත් වුණේ නැත්නම් වහාම රජයේ වැඩ දෙපාර්ත මේන්තුව විසින් වැඩය නැවත ආරම්භ කරන බව රජයේ වැඩ ඇමතිතුමා දන්වා තිබෙනවා.

වෛද්‍ය නිලධාරිතුමාගේ ප්‍රශ්නය ගැන කියන්නට තිබෙන්නේ මෙයයි. ගරු මන්ත්‍රීතුමා 1967.10.10 වැනි දින මාතර දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා මාරු කර යවන ලෙස ඉල්ලා සිටියා. ඒ ඉල්ලීමට හේතු වශයෙන් කියා සිටියේ ඒ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියාගේ දුර්වල පාලනය නිසා දිනපතා සෑන්දෑවට රෝගීන්ට මහත් කරදරයක් ඇති කරමින් හරකුන් විශාල වශයෙන් වාට්ටුවලට රිංගන බවයි. කෙසේ වෙතත් ඒ නිලධාරිතුමා—පරණ විතාන මහත්මයා—එවකට රාජ්‍ය භාෂා රෙගුලාසි යටතේ විශ්‍රාම ගැනීමට ඉඩ දෙන ලෙස ඉල්ලා සිටියා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 1968.1.15 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ ඔහුගේ විශ්‍රාම ගැනීම අනුමත කර තිබෙනවා. එහෙත් ඊට අන තුරුව නව වරක් පරණවිතාන මහත්මයා 1.5.68 වන දින වන තෙක් සේවය දීර්ඝ කරන ලෙස කළ ඉල්ලීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර තිබෙනවා. එම නිලධාරියා මාතර සේවය කර ඇත් තේ වර්ෂ දෙකකට ටිකක් වැඩි කාලයක් පමණයි. ඒ නිසා මේ අවස්ථාවේදී මාරු වක් දෙන්නට බැහැ. සාමාන්‍යයෙන් නිල ධාරියකුට එක ස්ථානයක වර්ෂ 4ක් සේවය කළ හැකියි. එසේ නැතිව සේවය කරන ස්ථානයෙන් මාරු කර යැවිය හැක්කේ විනයානුකූල හේතූන් උඩ පම ණයි. ඒ නිසා වැරදි පාලනයක් හෝ විනය නීති කඩ කිරීමක් හෝ—

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

හරිම පගා කාරයා. හිටියොත් මාතර ඉවරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

ගරු මන්ත්‍රීතුමා ඒ කරුණු ලියා ඉදිරිපත් කළොත් පරීක්ෂණයක් කර මාරු කිරීම ගැන ක්‍රියා කරන්නට පුළුවන්.

අ. භා. 7.26

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

ගරු කථානායකතුමනි, මාතර ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ වැලිගම් කෝරළයේ සමුපකාර සමිති සංගමය විසුරුවා හැරීමේ කටයුතු ගැන පරීක්ෂණ වාර්තාව ලබා ගැනීමට මේ අවස්ථාවේදී බැරි වුණා. කල් ඇතිව මේ ප්‍රශ්නය ගැන දැනුම් දුන්නා නම් ඒ වාර්තාව ලබා ගැනීමට ඉඩ තිබුනා. මට මතක පිළිවෙළට ලංකාවේ කිසිම සමුපකාර සමිතියක් හෝ සමිති සංගමයක් හෝ දූෂණ නැතිව මෙතෙක් විසුරුවා හැර නැහැ. වැලිගම් කෝරළයේ සමුපකාර සමිති සංගමය විසුරුවා හැර තිබෙනවා නම් ඒ පිළිබඳව පරීක්ෂණ වාර්තාව ගරු මන්ත්‍රීතුමාට පෙන්වන්නට මා කැමතියි. එවිට එහි තිබෙන දූෂණ ගැන ගරු මන්ත්‍රීතුමා පුදුම වෙයි. විභාගයක් නොකර, දූෂණ නොමැති සංගම් විසුරුවා හරිනවාය කියා හැඟීමක් තිබෙනවා නම්, චෝදනාවක් කරනවා නම් එය වැරදි හැඟීමක් බව වැරදි චෝදනාවක් බව කියන්නට කැමතියි. එපමණක් නොවෙයි, ලංකාවේ තිබෙන දූෂණ කෙරෙන ඕනෑම සමුපකාර සමිති සංගමයක් විසුරුවා හැරීම මේ රජයේ ප්‍රතිපත්තිය බව මේ ගරු සභාවට මතක් කරන්න කැමතියි. වැලිගම හෝ වේවා, මහනුවර හෝ වේවා, මාතර හෝ වේවා, නුවරඑළියේ හෝ වේවා තිබෙන සමුපකාර සමිති සංගමයකින් දූෂණ සිදු වෙනවා නම් ඒ ඕනෑම එකක් විසුරුවා හරිනවා. මහජනතාවගේ මුදල් විශාල වශයෙන් අයුතු ලෙස පරිහරණය කරන සමිති සමාගම් අනන්තවත් තිබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මණ්ඩල පත් කරන්න.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

විභාග කර, විසුරුවා හැර ඊට පසුව මණ්ඩල පත් කරනවා. මහජනතාවගේ මුදල් කාබාසිනියා කිරීමට පුද්ගලයන් කිහිප දෙනකුට ඉඩ දෙන්නට බැරි බව මතක් කරන්න කැමැතියි.

අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය—

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඇසූ ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ. සේවකයන් වගයක් අස් කර තිබෙනවා.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

දූෂණ කරන සංගම් විසුරුවා හැර තිබෙනවා. සේවකයන් අස් කර තිබෙනවා නම් ඒත් දූෂණ නිසා වන්නට පුළුවනි. මන්ත්‍රීතුමා ටිකක් කාලවේලා ඇතිව ප්‍රශ්නය දැනුම් දුන්නා නම්, අර වාර්තාව මේ ස්ථානයට ගෙනැවිත් මොන කරුණු නිසා අස් කළා දැයි විස්තර කියා දෙන්නට තිබුණා. මා හිතනවා, ප්‍රශ්නය මා අතට ලැබුණේ මීට පැය 2 කට විතර කලින්ය කියා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

හරියට දෙකට දුන්නා. කෙසේ වෙතත්, ඊළඟ රැස්වීම් දවසේවත් කරුණාකර වාර්තාව ගෙන්වා ගන්න.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය, ගොවි කාරක සභා මඟින් ගොවි ණය දිය යුතුය යන අදහස ගැන කිව යුත්තේ, අභිනව සැලැස්ම අනුව ගොවි ණය දීම ඇරඹුවේ මේ කන්නයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉඹුලාන මයා.]

සිට නිසා, මේ කන්නයේ ඒ ගොවිණය දීමේ අත්දැකීම් අනුව, වෙනසක් කළ යුතු නම් එන කන්නයේ සිට එය කළ හැකි බවයි.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

The hon. Member for Ambalangoda (Dr. Saddhasena) made some genuine criticisms about the lack of co-ordination among the various branches of the Inland Revenue Department. I shall go into that, but if there are any specific cases and if he is in a position to bring them to my notice, it will certainly help my Ministry to look into the matter.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.28ට අද දින සභා සම්මතිය අනුව 1968 මාර්තු 11 වන සඳුදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி பி. ப. 7.28 மணிக்கு சபை அதனது இன்றைய தீர்மானத்துக்ிணங்க 1968 மார்ச் 11 திங்கட்கிழமை மு. ப. 10. மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*Adjourned accordingly at 7.28 P.M. until 10 A.M. on Monday, 11th March, 1968, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org